සිංහල - 1 ශ්‍රේණිය, මූලික පිරිවෙණ
ගුරු මාර්ගෝපදේශය
2019/S/01/පිරි/TG/5-1/1700

ISBN 978-955-25-0493-8
P01
2010392
TG PIRI: SINHALA - GR 1
Rs. 120.00

# සිංහල

## ගුරු මාර්ගෝපදේශය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

## මූලික පිරිවෙණ

# 1
ශ්‍රේණිය

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# සිංහල

## මූලික පිරිවෙණ

## ගුරු මාර්ගෝපදේශය

# 1 ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් ලිපිනය : info@nie.lk

වෙබ් අඩවිය : www.pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය: pirivena@moe.gov.lk

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සිංහල**

**මූලික පිරිවෙණ**

**ගුරු මාර්ගෝපදේශය**

**1 ශ්‍රේණිය**

ප්‍රථම මුද්‍රණය : 2019

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN 978-955-25-0493-8

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.pirivena.sch.lk

විද්‍යුත් ලිපිනය: pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය

සිංහල භාෂා දෙපාර්තමේන්තුව

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් ලිපිනය: info@nie.lk

මුද්‍රණය: එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්
නො. 49, ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10.

# ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය

පිරිවෙන් තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සවිබල ගන්වමු.

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාවේ මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ තාක්ෂණික සහයෝගයෙන් මූලික පිරිවෙන් 1-5 ශ්‍රේණි සඳහා ප්‍රථම වතාවට ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සතුටට පත් වෙමි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සඵලදායි බව උදෙසා පෙළ පොත් සහ විෂය නිර්දේශ මෙන් ම ගුරු මාර්ගෝපදේශවලින් සැලසෙනුයේ ඉතා වැදගත් පිටුබලයකි. මෑතකාලීනව මෙරට අධ්‍යාපන පද්ධතියෙහි ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් සංවර්ධනාත්මක තීන්දු තීරණ රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනයට ද එහි දී විශේෂ අවධානය යොමු කර ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙන ඇති මෑතකාලීන ක්‍රියාමාර්ග අතරට එක්වන තවත් සුවිශේෂ පියවරක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමේ වැඩපිළිවෙළ හැඳින්විය හැකි අතර, මූලික පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශයට ඇතුළත් ව ඇති සියලු විෂයයන් ආවරණය කරමින් සකස් කර ඇති මෙම මාර්ගෝපදේශ පිරිවෙන් සිසුන්ගේ ඉගෙනුම් කාර්ය සාධනය ඉහළ නංවාලීම වෙනුවෙන් සැබෑ මෙහෙවරක් වනු ඇති බව මගේ විශ්වාසය යි.

මෙම සද්කාර්යය වෙනුවෙන් දායක වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂතුමා, නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ප්‍රමුඛ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයට ද කෘතවේදී ස්තුතිය පිරිනමමි.

**අකිල විරාජ් කාරියවසම්**
අධ්‍යාපන අමාත්‍ය.

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදාය සුරකිමින් ත්‍රිවිධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ථේරවාදී භික්ෂු සමාජයේ මනා පැවැත්මට උරදිය හැකි ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් හා ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි ආධ්‍යාත්මික සංවර්ධනයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීම පිරිවෙන් අධ්‍යාපනයෙන් අපේක්ෂිත ය. අනාගත ලෝක ප්‍රජාවේ යහපැවැත්ම සඳහා වූ ආදර්ශවත් පුරවැසියන් පිරිසක් බිහිකිරීමේ වගකීමෙන් මිදීමට අපට නොහැකි ය.

කාලීන ව වෙනස් වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික ක්‍රම ශිල්පයන් හා විවිධ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් අනුගමනය කරමින් පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව බලාත්මක කළ යුතු ය. මානව හා භෞතික සම්පත් මනාව උපයෝජන කර ගැනීමටත් විෂය මාලාව හා පන්ති කාමර කළමනාකරණය ඇතුළු කළමනාකරණ ක්‍රියාවලිය වගකීමෙන් හා වගවීමෙන් යුක්ත ව හසුරුවාලීම ගුරු භූමිකාවට ආදර්ශයකි.

කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විශ්වීය පුරවැසියෙකු නිර්මාණය කිරීමේ අභියෝගයට ශක්තිමත් ව මුහුණ දීමට මෙම ගුරු මාර්ගෝපදේශය, ඔබට මහඟු පිටිවහලක් වනු ඇත.

ශිෂ්‍ය ප්‍රජාවේ විවිධත්වය හඳුනා ගනිමින් වඩාත් උචිත ක්‍රමශිල්ප යොදා ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ජාතික අධ්‍යාපනික අරමුණු, පරමාර්ථ හා සුවිශේෂ පිරිවෙන් අභිමතාර්ථ සාධනයට සියලු ම පිරිවෙන් ගුරු ප්‍රජාව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**එම්. එන්. රණසිංහ**
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය.

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳව යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳව ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සංග්‍රහය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලාවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය.

# පෙරවදන

පිරිවෙණ ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණී තලයෙහි ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසු කර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අවිච්ඡින්න ව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දැ හිතකාමී ජන සමාජයක් පිරිවෙණ මගින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේ සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙණ මගින් සිදු වූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂා කර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදක නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙණ සඳහා පෙළ පොත් 54ක් වාර්ෂිකව මුද්‍රණය කර ලබා දීම මගින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදක වන විෂයමාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදු වන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක් ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල.

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකේය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමුව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ ඍජු දායකත්වයක් නො තිබිණ.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි යන්න නිතර අපව පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන්, එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශිර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස් වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017.03.16 දිනැති 412.5.12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යයන්ට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට ඍජුව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුද්ද, පර්යේෂණ, අද්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්හි ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් පිරිවෙන් පන්ති කාමරය ශිෂ්‍ය මිත්‍රභාවයෙන් ප්‍රබෝධාත්මක ව ඉහළ සාධනයකට පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට කටයුතු කරන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.

# පිරිවෙන් අධ්‍යක්ෂගේ පණිවිඩය

මහින්දාගමනයෙන් පසු ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී මහා අරිට්ඨ තෙරුන් විසින් මහා මහින්ද තෙරුන් මුලසුන තබා ථූපාරාම විහාරයේ ධර්ම මණ්ඩපයේ දී මත්තාභය තෙරුන් ප්‍රමුඛ පන්සියයක් දෙනා වහන්සේට විනය ඉගැන්වීමේ රාජ්‍ය මහෝත්සවයෙන් ලක්දිව පාරිවේණික අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එවක් පටන් විවිධ අවධීන්හි උන්නතියට හා අවනතියට ලක්වෙමින් ලක්වැසි ගිහි පැවිදි සුවහස් සංඛ්‍යාත ප්‍රජාවට පිරිවෙන් අධ්‍යාපනයෙන් වූ සේවාව මහාර්ඝ ය. පිරිවෙණ මගින් සාරධර්ම අධ්‍යාපනය කේන්ද්‍ර කරගත් ඥානයත් සම්භාව්‍ය හා නූතන භාෂාවනුත් ශිල්ප කලා ඥානයත් ජ්‍යොතිර්විද්‍යා, වාස්තුවිද්‍යා ඥානයත් ආදි ඥාන සම්භාරයත් කාලීන අධ්‍යාපනය අනුව පුද්ගල පෞරුෂයට අවශ්‍ය සියලු සාධකයනුත් සම්පාදනය කෙරේ.

21 වන සියවසේ අධ්‍යාපන ක්ෂේත්‍රය නිපුණතා පාදක ක්‍රමයට නැඹුරු විය. පිරිවෙන් අධ්‍යාපනයට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ආගන්තුක නොවුණ ද පිළිගත් ක්‍රම ශිල්ප ඔස්සේ පිරිවෙණට අවශ්‍ය විෂය නිර්දේශ හා පෙළ පොත් සම්පාදනය කෙරිණ. එමගින් ශිෂ්‍ය නිපුණතා මට්ටම අනුක්‍රමයෙන් වර්ධනය වන ශිෂ්‍ය මිතුරු පාඨමාලාවක් පිරිවෙන්වලට ඉදිරිපත් කෙරිණි. ගුරුභවතුන්ට අවශ්‍ය පාඩම් සැලසුම් කිරීම, මිනුම් ඇගයුම් ක්‍රම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කරදීම පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට සිදුකරන්නට ලැබීම පිළිබඳව අනතිමානී ආනන්දයක් ලබමි. පන්ති කාමරය තුළ වඩාත් ඵලදායී ගුරුවරයකු වීමට ගුරු මාර්ගෝපදේශයේ එන උපදෙස් ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් යොදා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. පාරිවේණික ගිහි පැවිදි සිසුන්ට අවශ්‍ය මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබට මේ ගුරු මාර්ගෝපදේශය මහෝපකාරී වනු ඇතැයි සිතමි.

මේ මහඟු කාර්යය යථාර්ථයක් බවට පත් කිරීමේ දී සහාය වූ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයටත් පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලයටත් උපදේශකත්වය සම්බන්ධීකරණය විෂය නියාමනය හා විවිධ අයුරින් සම්පත්දායකත්වය සැපයූ සියලු පාර්ශ්වයන්ටත් මාගේ කෘතඥතාව පිරිනමමි.

**විජිත වෙලගෙදර**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය.

## ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

| | | |
|---|---|---|
| උපදේශකත්වය හා අනුමැතිය | : | ජාතික අධ්‍යාපන ආයතනය සහ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| මෙහෙයවීම | : | ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය<br>විජිත වෙලගෙදර, අධ්‍යක්ෂ, පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| අධීක්ෂණය | : | ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය<br>එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම, අධ්‍යක්ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය |
| සම්බන්ධීකරණය | : | පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි, ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන, පිරිවෙන් අධ්‍යාපන ඒකකය, ජාතික අධ්‍යාපන ආයතනය<br>පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| විෂය නියාමනය | : | ආචාර්ය, රාජකීය පණ්ඩිත, පූජ්‍ය වාවින්නේ පඤ්ඤානන්ද හිමි, සහකාර කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය<br>එල්. ඒ. එස්. ප්‍රේමරත්න, පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, විෂය උපදේශක (සිංහල), අධ්‍යාපන අමාත්‍යාංශය |
| ලේඛක මණ්ඩලය | : | ආචාර්ය, රාජකීය පණ්ඩිත පූජ්‍ය වාවින්නේ පඤ්ඤානන්ද හිමි, සහකාර කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය<br>ආචාර්ය, පූජ්‍ය කුඹල්ගොඩ ධම්මාලෝක හිමි, සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (පිරිවෙන්), පිරිවෙන් අධ්‍යාපනන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය<br>ඩබ්. කරුණාරත්න, කථිකාචාර්ය, ගුරු මධ්‍යස්ථානය, ගිරාගම, පිළිමතලාව<br>එල්. ඒ. එස්. ප්‍රේමරත්න, විෂය උපදේශක, පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය<br>ඩබ්ලිව්. ඒ. විජේරත්න වනසුන්දර, විශ්‍රාමික ගුරු උපදේශක, අක්කර 10 පාර, පොල්වත්ත, අම්බුළුගල, මාවනැල්ල |
| භාෂා සංස්කරණය | : | එච්. එල්. එස්. අභයසිංහ, විශ්‍රාමික කථිකාචාර්ය, සීතාවක පිරිවෙන් ගුරු අභ්‍යාස විද්‍යාලය |
| සෝදුපත් කියවීම | : | පූජ්‍ය මාතලේ සුමනවංස හිමි, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල) පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය. |
| පරිගණක වදන් | : | කසුන් කෝදාගොඩ |
| පිටකවර නිර්මාණය | : | ජේ.එම්. තරිඳු හංසග<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණය)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය. |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

මූලික පිරිවෙන් විෂය මාලාවේ සිංහල විෂයට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක ව ඉටුකර ගැනීමට මග පෙන්වීම සඳහා මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත. ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සකස් කර තිබූ සිංහල විෂය නිර්දේශය හා පෙළ පොත මීට පදනමක් ලෙස යොදා ගැනිණි. විෂය නිර්දේශයේ ඇතුළත් වූ නිපුණතා හා නිපුණතා මට්ටම් දැඩි වෙනසකට ලක් නොකොට ගුරු මාර්ගෝපදේශය සඳහා ක්‍රියාකාරකම් සකස් කෙරුණි. නිපුණතා මට්ටම් සාක්ෂාත් වන පරිදි ඉගෙනුම් පල අලුතින් සකස් කිරීමට සිදුවිය. මෙහි දැක්වෙන ක්‍රියාකාරකම්වලින් මූලික පිරිවෙන් පන්තිවලට ඉගැන්වීම සඳහා පාඩම් සැලසුම් සකස් කර ගැනීමට උපදෙස් ලබා දී තිබේ. ඒ අනුව සිංහල විෂය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායීව සිදුකර ගැනීම සඳහා එම උපදෙස් අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මීට පෙර පිරිවෙන් විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරු මාර්ගෝපදේශ නොතිබූ අතර පිරිවෙන් ගුරුවරු තම අභිමතය පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කළහ. එසේ වූ විට එක් එක් පිරිවෙන්වල විෂය ඉගැන්වීම එකිනෙකින් වෙනස් වීමත් සමාන ඉගෙනුම් අවස්ථා ශිෂ්‍යයින්ට නොලැබී යාමත් අනිවාර්යයෙන් ම සිදුවේ. එය විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියට මෙන් ම විධිමත් ඇගයීම් ක්‍රියාවලියට ද බාධාකාරී තත්ත්වයකි. එනිසා පිරිවෙන් විෂය මාලාවට ගුරු මාර්ගෝපදේශ සකස් කර දීමෙන් මෙකී තත්ත්වය අවම කිරීමට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පිරිවෙන්වල මෙතෙක් පැවති සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද වෙනස් කිරීමට මෙමගින් උපදෙස් දෙනු නොලැබේ. පැරණි දේ සුරකිමින් නව ඉගෙනුම් ඉගැන්වීම් අවස්ථා සම්පාදනය කිරීම බලාපොරොත්තු වේ. ඒ සඳහා නව තාක්ෂණය යොදා ගැනීම හා කණ්ඩායම් ඉගෙනුම් ක්‍රම භාවිත කිරීම ආදි උපදෙස් මෙමගින් ලබා දී ඇත.

විධිමත් ඉගෙනුම් අවස්ථා සම්පාදනය කර ගැනීම සඳහා එක් එක් නිපුණතා සඳහා ක්‍රියාකාරකම් සන්තතියක් මෙහි ඇතුළත් වේ. එක් නිපුණතාවක් ඉටු කර ගැනිම සඳහා නිපුණතා මට්ටම් දෙකක් හෝ කිහිපයක් විෂය නිර්දේශයෙහි දක්වා ඇත. එක් නිපුණතා මට්ටමක් සඳහා අවම වශයෙන් එක් ක්‍රියාකාරකමක් හෝ මෙහි ඇතුළත් කර ඇත. එම ක්‍රියාකාරකම සකස් කර ඇත්තේ එහි සඳහන් ඉගෙනුම් පල ඉටුකර ගැනීමට හැකි වන පරිදි ය. ඔබ පාඩම් සැලසුම් සකස් කිරීමේ දී එම ඉගෙනුම් පලවලින් සුවිශේෂ ඉගෙනුම් පල කාලච්ඡේදයට හා ශිෂ්‍ය මට්ටමට ගැළපෙන පරිදි සකස් කර ගත යුතු ය. ඔබ විසින් සකස් කර ගත් ඉගෙනුම් පල ඉටු වන පරිදි පියවර කිහිපයකින් යුත් පාඩම් සැලසුමක් මේ අනුව සකස් කර ගත යුතු ය. ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ඔබ සතු නිර්මාණශීලිත්වයට එමගින් ඉඩ සලසා ඇත.

ඉගෙනුම් පල මැන බැලීම සඳහා තක්සේරුකරණ නිර්ණායක ද මෙහි දක්වා ඇත. ඔබ සකස් කරන ඉගෙනුම් පල මැනීම සඳහා ද ගැළපෙන නිර්ණායක සකස් කරගත යුතු වේ. සෑම ඉගෙනුම් අවස්ථාවක් ම ඉගෙනුම් පල, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් හා ඉගෙනුම් පල ඇගයීමේ නිර්ණායක යන සංරචක තුනකින් සමන්විත වේ. ඔබේ පාඩම් සැලසුම් ද එම සංරචක තුනෙන් යුක්ත වීම අනිවාර්ය වන අතර එම සංරචක තුනේ අන්‍යෝන්‍ය සම්බන්ධය තිබීම ද අත්‍යවශ්‍ය වේ. විෂය කරුණු කියා දීම පමණක් ප්‍රමාණවත් නැත. ඉගෙනුම මැන බැලීම සඳහා තක්සේරුකරණ ක්‍රියාවලියක් තිබීම ද ඒ සඳහා නිර්ණායක තිබීම ද අත්‍යවශ්‍ය වේ.

ඉගෙනුම් පල, ක්‍රියාකාරකම්, තක්සේරුකරණ නිර්ණායක යන සංරචක තුනට අනුව ඔබේ නිර්මාණශීලි ඉගැන්වීම් රටාව සංවිධානය කර ගැනීමට මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට අත්වැලක් වනු ඇත. එය මැනවින් භාවිත කර ඉගැන්වීම් කාර්යය සාර්ථක කර ගැනීමට හැකි වේවා යන්න අපගේ ප්‍රාර්ථනයයි.

**පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඒකක ප්‍රධාන
පිරිවෙන් අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය.

## පටුන


- ගුරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය III
- අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය IV
- අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය V
- පෙරවදන VI
- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය VII
- පිරිවෙන් අධ්‍යක්ෂගේ පණිවිඩය VIII
- ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය IX
- ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් X
- සිංහල 1 ශ්‍රේණිය වාර නියම XII-XIII
- ජාතික අරමුණු XIV
- මූලික නිපුණතා XV-XVI
- විෂය අධ්‍යයනයේ අරමුණු XVII
- විෂය නිර්දේශය XVIII-XXII

1 සිංහල හෝඩිය 1
2 සිංහල හෝඩිය - අක්ෂර වින්‍යාසය 2
3 සිංහල හෝඩිය - අකාරාදි පිළිවෙළ 3
4 නාම පද 4-5
5 ක්‍රියා පද 6-7
6 වාක්‍ය නිර්මාණය 8
7 විවිධාර්ථවත් පද 9-10
8 වාක්‍ය රචනය 11-16
9 විරාම ලක්ෂණ 17-18
10 ප්‍රායෝගික ලේඛන 19-21
11 නිවැරදි උච්චාරණයෙන් යුතුබව කියවීම 22-24
12 අර්ථාවබෝධය 25-30
13 විවිධ කියවීම් ක්‍රම 31
14 ජීවිතාවබෝධය සඳහා ගද්‍ය පද්‍ය යොදා ගැනීම 32-33
15 ලෝවැඩ සඟරාව 34-35
16 හීන් සැරය 36-37
17 නම් පොත හා මඟුල් ලකුණ 38
18 කාව්‍ය නිර්මාණ 39-40
19 කතන්දර නිර්මාණ 41-42
20 කතන්දරවලට සවන් දීම 43-44
21 ප්‍රකාශනවලට සවන් දීම 45
22 ආචාරශීලි ව සවන් දීම 46
23 විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීම 47
24 මාතෘකානුකූල කතා පැවැත් වීම 48-49
25 විවිධ කථන අවස්ථා 50-51
26 කියවීම හා සංස්කෘතිය හඳුනා ගැනීම 52-53
27 කියවීම හා සමාජ සාරධර්ම 54-55
28 ගද්‍ය පද්‍ය නිර්මාණ පරිශීලනය 56-57

# සිංහල 1 ශ්‍රේණිය
# වාර නියමය

| | පෙළ පොතේ පාඩම් අංකය | ගුරු මාර්ගෝපදේශ ක්‍රියාකාරකම් අංකය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය - පෙළ පොත සහ නිර්දිෂ්ට ග්‍රන්ථ සඳහා මාර්ගෝපදේශය | | කාලච්ඡේද |
|---|---|---|---|---|---|---|
| | | | | පෙළ පොතේ පාඩම සහ නිර්දිෂ්ට ග්‍රන්ථවල අදාළ කොටස් | පෙළ පොතේ පාඩම් / නිර්දිෂ්ට ග්‍රන්ථ සඳහා ක්‍රියාකාරකම් | |
| 01 | 01 | 01 | 1.1 | සිංහල හෝඩිය | කුසලතා වර්ධනයට අදාළ ක්‍රියාකාරකම් | 2 |
| | | 02 | 1.2 | සිංහල හෝඩිය | කුසලතා වර්ධනයට අදාළ ක්‍රියාකාරකම් | 2 |
| | | 03 | 1.3 | සිංහල හෝඩිය | කුසලතා වර්ධනයට අදාළ ක්‍රියාකාරකම් | 2 |
| | 02 | 04 | 2.1 | නාම පද | කුසලතා වර්ධනයට අදාළ ක්‍රියාකාරකම් | 6 |
| | 03 | 05 | 2.2 | ක්‍රියා පද | කුසලතා වර්ධනයට අදාළ ක්‍රියාකාරකම් | 6 |
| | නම්පොත හා මඟුල් ලකුණ | 17 | 8.2 | 1 - 88 තෙක් ස්ථාන නාම | උච්චාරණය හා වණපොත් කිරීම | 6 |
| | ලෝවැඩ සඟරාව | 15 | 7.1 | 1 -20 තෙක් කවි | අර්ථ පැහැදිලි කිරීම සහ වණපොත් කිරීම | 12 |
| | හීන්සැරය | 16 | 8.1 | 1 - 6 තෙක් කථා | කියවීම හා අර්ථාවබෝධය | 7 |
| | **වාරයට නියමිත සෙසු කාලච්ඡේද විෂය සමගාමී සහ වාර පරීක්ෂණ සඳහා** | | | | | |
| 02 | 04 | 06 | 2.3 | වාක්‍ය නිර්මාණය | කුසලතා වර්ධනයට අදාළ ක්‍රියාකාරකම් | 6 |
| | 05 | 07 | 3.1 | විවිධාර්ථවත් පද | කුසලතා වර්ධනයට අදාළ ක්‍රියාකාරකම් | 6 |
| | 06 | 08 | 4.1 | වාක්‍ය රචනය | කුසලතා වර්ධනයට අදාළ ක්‍රියාකාරකම් | 5 |
| | නම්පොත හා මඟුල් ලකුණ | 17 | 8.2 | 89 - 176 තෙක් ස්ථාන නාම | උච්චාරණය හා වණපොත් කිරීම | 8 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2 | ලෝවැඩ සඟරාව | 15 | 7.1 | 21 - 35 තෙක් කවි | අර්ථ පැහැදිලි කිරීම සහ වණපොත් කිරීම | 8 |
| | හීන්සැරය | 16 | 8.1 | 7 -12 තෙක් කථා | කියවීම හා අර්ථාවබෝධය | 10 |
| | **වාරයට නියමිත සෙසු කාලච්ඡේද විෂය සමගාමී සහ වාර පරීක්ෂණ සඳහා** | | | | | |
| 03 | 07 | 09 | 4.1 | විරාම ලක්ෂණ | කුසලතා වර්ධනයට අදාළ ක්‍රියාකාරකම් | 4 |
| | 08 | 10 | 5.1 | ප්‍රායෝගික ලේඛන | කුසලතා වර්ධනයට අදාළ ක්‍රියාකාරකම් | 6 |
| | 09 | 12 | 6.2 | අර්ථාවබෝධය | කුසලතා වර්ධනයට අදාළ ක්‍රියාකාරකම් | 4 |
| | | 13 | 6.4 | අර්ථාවබෝධය | කුසලතා වර්ධනයට අදාළ ක්‍රියාකාරකම් | 3 |
| | නම්පොත හා මඟුල් ලකුණ | 17 | 8.2 | 177 - 264 තෙක් ස්ථාන නාම | උච්චාරණය හා වණපොත් කිරීම | 10 |
| | ලෝවැඩ සඟරාව | 15 | 7.1 | 36 - 50 තෙක් කවි | අර්ථ පැහැදිලි කිරීම සහ වණපොත් කිරීම | 7 |
| | හීන්සැරය | 16 | 8.1 | 13- 17 තෙක් කථා | කියවීම හා අර්ථාවබෝධය | 10 |
| | **වාරයට නියමිත සෙසු කාලච්ඡේද විෂය සමගාමී ක්‍රියාකාරකම් සහ වාර පරීක්ෂණ සඳහා** | | | | | |

## ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ජාතික පොදු අරමුණු

(I) සෑම (ළමයෙකුටම) දෙනාටම පාසල් අධ්‍යාපනයට ඇති සර්ව සහ සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම.

(II) සංස්කෘතික විවිධත්වය හඳුනා ගනිමින් ජාතික සහජීවනය පෝෂණය කිරීම, ජාතික අඛණ්ඩතාව සහ ජාතික සමගිය වර්ධනය කිරීම තුළින් මඩිබිමට ආදරය, ගෞරවය හා කැපවීමෙන් යුතු ශ්‍රී ලාංකික පුරවැසියෙකු නිර්මාණය කිරීම.

(III) දේශීය හා ගෝලීය අභියෝගයන්ට ප්‍රතිචාර දක්වමින් ජාතියේ සංස්කෘතික හා පාරිසරික උරුමයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම.

(IV) නිර්මාණශීලිත්වය, නවෝත්පාදනය සහ විචක්ෂණශීලී චින්තනය සහිත ඵලදායී පුද්ගලයින් නිර්මාණය කිරීම.

(V) තෘප්තිමත් ජීවන රටාවකට අවශ්‍ය ශාරීරික, මානසික සහ ආධ්‍යාත්මික යහපැවැත්ම පුද්ගලයන් තුළ ප්‍රචලිත කිරීම.

(VI) ගෝලීය ප්‍රවණතාවන්ට සරිලන පරිදි සමාජ, ආර්ථික හා සංස්කෘතික උන්නතිය සඳහා දැනුම, කුසලතා, ආකල්ප සහ මානව ගුණාංග සංවර්ධනය කිරීම.

(VII) මානව හිමිකම්, රටේ නීතිය හා යුතුකම් සහ වගකීම්වලට ගරු කරන, සමාජ සාධාරණත්වය හා ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවකට අවශ්‍ය සාධක නිර්මාණය කිරීම හා ඒ සඳහා අනුබල දීම.

(VIII) සංකීර්ණ හා අනපේක්ෂිත තත්වයන්ට මුහුණ දීම සඳහා වෙනස්වීම් කළමනාකරණය සහ ඉගෙනුමට ඉගෙනීමේ පුද්ගල හැකියාවන් සංවර්ධනය කිරීම.

**(ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව - 2019)**

# මූලික නිපුණතා

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත.

i. සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

| | | |
|---|---|---|
| සාක්ෂරතාව | : | සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම. |
| සංඛ්‍යා පිළිබඳ දැනුම | : | භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය. |
| රූපක භාවිතය | : | රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම. |
| තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව | : | පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම. |

ii. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලි බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරීම හා විග්‍රහාත්මක චින්තනය.
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා.
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්.
- චිත්තවේගී බුද්ධිය.

iii. පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

| | | |
|---|---|---|
| ජෛව පරිසරය | : | සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය - ශාඛ, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා. |
| භෞතික පරිසරය | : | අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව. |

iv. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ.
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම.
යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

v. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයනට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

vi. ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මළල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාව මගින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

vii. ''ඉගෙනීමට ඉගෙනුම්'' පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

## විෂය අධ්‍යයනයේ අරමුණු

01. ශ්‍රවණය, කථනය, කියවීම සහ ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා වර්ධනය කිරීම.

02. සිංහල භාෂාවේ ව්‍යාකරණය සහ භාෂා සම්ප්‍රදාය පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම.

03. භාෂාවේ වාච්‍යාර්ථ, ලක්ෂ්‍යාර්ථ, ව්‍යංග්‍යාර්ථ වටහා ගැනීම.

04. ප්‍රකාශනය, ව්‍යවහාරය හා අර්ථග්‍රහණ ශක්තිය වර්ධනය කරලීම.

05. අවබෝධය, විශ්ලේෂණය, සංශ්ලේෂණය සහ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම.

06. සාහිත්‍ය පරිශීලනයෙන් නිර්මාණාත්මක ලේඛන ශෛලිය හා ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම අවබෝධය ලබා ගැනීම හා වාංමාලාව පෝෂණය කර ගැනීම.

07. විවිධ යුගවලට අයත් සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සාහිත්‍ය විචාර මූලධර්ම අවබෝධ කොට ගෙන වින්දනාත්මක හා විචාරාත්මක කුසලතා වර්ධනය කර ගැනීම.

08. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් රසඥතාව වර්ධනය කර ගැනීම තුළින් ජීවිත පරිඥානය පුළුල් කර ගැනීම.

09. විශ්ව විශ්‍රැත සාහිත්‍යයික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි අවබෝධාත්මක පරිශීලනයට යොමු කිරීම.

10. සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කර ගනිමින් සමාජ සංස්කෘතික වටිනාකම් හඳුනා ගැනීම සඳහා පුරාතන සිංහල සාහිත්‍ය කෘති පරිශීලනයට හුරු කිරීම.

11 සිංහල භාෂාවෙන් නිරූපිත භාෂාමය අනන්‍යතාව සහ තදනුබද්ධ සංස්කෘතික අනන්‍යතාව හැදෑරීම.

12. සන්නිවේදන කාර්යය පහසුකරලීම සඳහා සාම්ප්‍රදායික භාෂා උපාංග නිවැරදි ව භාවිතයට හුරු කිරීම.

## 11 මූලික පිරිවෙන් විෂය නිර්දේශය
## 1 ශ්‍රේණිය සිංහල

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01. අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳව සැලකිලිමත් වෙමින් භාවිත කරයි. | 1.1 අක්ෂර මාලාව නිවැරදි ලෙස උච්චාරණය කරයි.<br>1.2 අක්ෂර මාලාව හඳුනා ගෙන නිවැරදි ව ලියයි.<br>1.3 අක්ෂර මාලාවේ රටාව හඳුනා ගෙන නිවැරදි ව අක්ෂර ස්ථානගත කර ලියයි. | • අක්ෂර මාලාව :<br>කියවීම, ලිවීම, උච්චාරණය<br>(සාමාන්‍ය හැඳින්වීමක්)<br>අකාරාදි පිළිවෙළ | • සිංහල අක්ෂර මාලාව නිවැරදි ව ශබ්ද නගා කියවයි.<br>• සිංහල අක්ෂර හඳුනා ගෙන නිවැරදි ව ලියයි.<br>• සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන අනුපිළිවෙළින් ලියයි.<br>• අකාරාදි පිළිවෙළට වචන පෙළ ගස්වයි.<br>• ශබ්දකෝෂයක පද පෙළගැස්ම පිළිබඳව අදහස් දක්වයි. | 06 |
| 02. ලේඛන කාර්යයන් ඉටුකර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනී. | 2.1 නාම පද පිළිබඳව අවබෝධයෙන් යුතුව ලේඛන කාර්යයේ යෙදෙයි.<br>2.2 ආඛ්‍යාත පද පිළිබඳව අවබෝධයෙන් යුතු ව ලේඛනයේ නිරත වෙයි.<br>2.3 ව්‍යාකරණානුකූල ව සරල වාක්‍ය නිර්මාණය කරයි. | • නාම පද<br>ප්‍රාණවාචී අප්‍රාණවාචී භේදය,<br>වචන භේදය, ලිංග භේදය, පුරුෂ භේදය,<br>උක්තානුක්ත භේදය, සර්ව නාම පද<br>(මූලික අවබෝධයක්)<br>• ආඛ්‍යාත පද<br>කාල භේදය (අතීත, වර්තමාන, අනාගත)<br>වචන භේදය (ඒක වචන, බහු වචන)<br>පුරුෂ භේදය (ප්‍රථම, මධ්‍යම, උත්තම)<br>ලිංග භේදය (ස්ත්‍රී, පුරුෂ, නපුංසක)<br>සකර්මක අකර්මක භේදය<br>(මූලික අවබෝධයක්) | • නාම පද යනු කුමක් දැයි නිවැරදි ව ප්‍රකාශ කරයි.<br>• නාම පද, ලිංග භේදය අනුව වෙන්කර දක්වයි.<br>• නාම පදවල පුරුෂ භේදය හඳුනා ගෙන නිවැරදි ව ප්‍රකාශ කරයි.<br>• ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම පද වෙන් කර දක්වයි.<br>• උක්ත අනුක්ත වශයෙන් නාම පද වෙන් කර දක්වයි.<br>• නාම පද අතුරින් සර්වනාම පද වෙන් කරයි.<br>• ක්‍රියා පද කාල තුනට අනුව නිවැරදි ව වෙන් කරයි. | 18 |

| | | | | |
|---|---|---|---|---|
| | | ● වාක්‍ය නිර්මාණය: සරල වාක්‍ය නිර්මාණය | ● ඒක වචන බහුවචන ක්‍රියා පද නිවැරදි ව හඳුනා ගෙන ලියයි.<br>● පුරුෂ තුනට අයත් ක්‍රියාපද නිවැරදි ව වෙන් කර දක්වයි.<br>● සකර්මක හා අකර්මක ක්‍රියාපද වෙන් කර දක්වයි.<br>● උක්තය කර්මය හා ආඛ්‍යාතය සහිත සරල වාක්‍ය නිර්මාණය කරයි. | |
| 03. භාෂා ක්‍රියාකාරකම් මගින් වාං මාලාව පෝෂණය කර ගෙන භාෂා කාර්යයන්හි දී උචිත පරිදි භාවිතයට ගනී. | 3.1 විවිධාර්ථවත් පද භාෂා කාර්යයන්හි දී අර්ථවත් ලෙස යොදා ගනී. | ● විවිධාර්ථවත් පද<br>සමානාර්ථවත් පද, විරුද්ධාර්ථවත් පද, බහ්වර්ථවත් පද<br>(මූලික අවබෝධය) | ● සමානාර්ථවත් හා විරුද්ධාර්ථවත් පද ගෙන භාෂාකරණයේ යෙදේ.<br>● බහ්වර්ථවත් පද හඳුනා ගෙන විස්තර කරයි.<br>● බහ්වර්ථවත් පද යොදා අර්ථවත් වාක්‍ය නිර්මාණය කරයි. | 06 |
| 04. අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 4.1 මාතෘකාවකට අනුව සරල වාක්‍ය ගොඩ නගයි.<br>4.2 ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි. | ● රචනය<br>මාතෘකාවක් යටතේ සරල වාක්‍ය ගොඩ නැගීම.<br>● විරාම ලක්ෂණ<br>වාක්‍ය අවසානයේ යෙදෙන විරාම ලක්ෂණ.<br>⋆ නැවතීමේ තිත<br>⋆ ප්‍රශ්නාර්ථ ලකුණ<br>⋆ විස්මයාර්ථ ලකුණ | ● මාතෘකාවකට අනුව සරල වාක්‍ය නිර්මාණය කරයි.<br>● විරාම ලක්ෂණ අනුව සරල වාක්‍ය නිර්මාණය කරයි.<br>● වාක්‍යයක අවසානයේ යෙදෙන්නේ නැවතීමේ තිත බව කියයි.<br>● ප්‍රශ්නයක් ඇඟවීමේ දී ප්‍රශ්නාර්ථ ලකුණ යොදයි.<br>● විස්මයක් ඇඟවීම සඳහා විස්මයාර්ථ ලකුණ භාවිත කරයි.<br>● අවශ්‍යතා සඳහා පෞද්ගලික ලිපියක් නිවැරදි ව ලියයි. | 09 |

| | | | | |
|---|---|---|---|---|
| 05. ජීවන අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි. | 5.1 නිරවුල්ව හා පැහැදිලි ව ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි. | ● ප්‍රායෝගික ලේඛන පෞද්ගලික ලිපි ලිවීම, වාර්තා ලිවීම. | ● සිදු වූ දෙය එලෙසින් ම වූ බව ප්‍රකාශ කිරීමට වාර්තා ලියයි.<br>● පෞද්ගලික ලිපියක් නියමිත ආකෘතියට අනුව සකසයි.<br>● වාර්තාවකට අත්‍යවශ්‍ය මූලිකාංග නම් කරයි. | 06 |
| 06. ජීවන අද්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනී. | 6.1 නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.<br>6.2 අර්ථාවබෝධය සඳහා නිශ්ශබ්ද ව කියවයි.<br>6.3 විවිධ ශෛලීන්ට අනුව කියවීමේ හුරුව ලබයි.<br>6.4 ගද්‍ය හා පද්‍ය කියවා වටහාගත් බව ප්‍රකාශ කරයි. | ● විෂය සමගාමී ක්‍රියාකාරකම් සහ නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන්<br>(හීන්සැරය නවකතාවේ මුල් පරිච්ඡේද, ලෝවැඩ සඟරාවේ මුල් පද්‍ය 50, නම් පොත)<br>⋆ නිවැරදි වචන උච්චාරණය<br>⋆ විරාම ලකුණු ගැන අවධානය<br>⋆ නිසි හඬ පාලනය<br>අර්ථාවබෝධය<br>සරල ගද්‍ය, පද්‍ය පාඨයක අර්ථය වටහා ගැනීම. | ● හීන්සැරය නවකතාවේ තෝරාගත් කොටස් නිවැරදි උච්චාරණයෙන් යුතුව හා විරාම ලක්ෂණ සලකා කියවයි.<br>● ලෝවැඩ සඟරාවේ පද්‍ය නිශ්ශබ්ද ව කියවා අර්ථ අවබෝධය නිවැරදි ව ලියයි.<br>● සාහිත්‍ය සමිතියේ දී ජාතක කතා කොටසක් නිවැරදි ව ශබ්ද නගා කියවයි.<br>● ලෝවැඩ සඟරාවේ පද්‍ය තාලානුකූල ව ගයයි.<br>● නම් පොතේ ස්ථාන නාම කටපාඩමෙන් කියයි. | 24 |
| 07. ධර්ම ශාස්ත්‍රීය ඥාන පෝෂණය ඔස්සේ ආගමික සමාජීයය අවශ්‍යතා අර්ථවත් කර ගැනීම සඳහා වණපොත් කරණයේ යෙදෙයි. | 7.1 නිර්දිෂ්ට ග්‍රන්ථවලින් තෝරාගත් පද්‍ය වණපොත් කරයි. | ● නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන්<br>(ලෝවැඩ සඟරාවේ මුල් පද්‍ය 50) | ● ලෝවැඩ සඟරාවේ දැක්වෙන උපදේශනයන් ප්‍රායෝගික ජීවිතයේ දී යොදා ගනී.<br>● ලෝවැඩ සඟරාවේ පද්‍ය කියවා ධර්මාවබෝධය පුළුල් කර ගැනීමට භාවිත කරයි. | 24 |

| | | | | |
|---|---|---|---|---|
| | | | ● හීන්සැරය නවකතාවේ තෝරාගත් කොටස් සාමාජයීය අවශ්‍යතා සඳහා යොදා ගනි. | |
| 08. රසඥතාව වර්ධනය කර ගැනීම හා ජීවිතාදර්ශ ලබාගැනීම සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි. | 8.1 ගද්‍ය නිර්මාණ රසවිඳිමින් කියවයි.<br>8.2 ගද්‍ය නිර්මාණ රසවිඳිමින් කියවයි. | ● නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් (හීන් සැරය, නම් පොත සහ මගුල් ලකුණ) | ● ගද්‍ය කොටස් කියවා එහි රසමුසු තැන් ප්‍රකාශ කරයි. | 18 |
| 09. අද්දැකීම් පාදක කරගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි. | 9.1 සරල පද්‍ය නිර්මාණය කරයි.<br>9.2 සරල කතාන්දරයක් නිර්මාණය කරයි. | ● විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන් | ● සරල කතන්දර නිර්මාණය කර බිත්ති පුවත්පතේ ප්‍රදර්ශනය කරයි.<br>● සරල පද්‍ය පන්ති නිර්මාණය කර සාහිත්‍ය සමිතියට ඉදිරිපත් කරයි.<br>● පුවත්පත් සඳහා සරල පද්‍ය පන්ති සහ කතන්දර නිර්මාණය කරයි. | 15 |
| 10. සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතාව ඵලදායී ලෙස යොදා ගනී. | 10.1 සරල සංවාදයකට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.<br>10.2 විවිධ ප්‍රකාශනවලට සවන් දී අන්තර්ගතය ග්‍රහණය කර ගනියි.<br>10.3 ආචාරශීලී ව හා සංයමයෙන් යුතු ව සවන් දී ප්‍රතිචාර දක්වයි.<br>10.4 විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීමේ පුරුදු ප්‍රායෝගික භාෂා කාර්යයන් ඉටුකර ගැනීම සඳහා යොදා ගනියි. | ● විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන් | ● දැනුම/ආකල්ප හා කුසලතා වර්ධනයට විද්‍යුත් මාධ්‍ය නිර්මාණ ඇසුරු කරයි.<br>● නිහඬ ව අසා සිටීමෙන් පසු වඩා හොඳින් පිළිතුරු ලබා දිය හැකි බව ප්‍රකාශ කරයි.<br>● ප්‍රවෘත්ති ප්‍රකාශවලට සවන් දී වැදගත් පුවත් උපුටා දක්වයි. | 24 |

| | | | | |
|---|---|---|---|---|
| 11. තම අදහස් අර්ථවත් ව හා තර්කානුකූලව ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශක්‍යතාව ප්‍රදර්ශනය කරයි. | 11.1 සබකෝලයෙන් තොර ව අදහස් ප්‍රකාශ කරයි.<br>11.2 අවස්ථාවට උචිත ලෙස ශ්‍රාවකයා ආකර්ෂණය කර ගනිමින් කතා කරයි. | • විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන් | • මාතෘකානුකූලව නිශ්චිත කාලයක් තුළ කතාවක් ඉදිරිපත් කරයි.<br>• තමා ලත් අද්දැකීමක් ඇසුරෙන් තනාගත් කතාවක් සබකෝලයෙන් තොරව ඉදිරිපත් කරයි.<br>• සුවිශේෂ චරිත කතා සාහිත්‍ය සමිතියේ දී ඉදිරිපත් කරයි. | 15 |
| 12. භාෂා හා සාහිත්‍ය පරිශීලනයෙන් සංස්කෘතිය, සාරධර්ම හඳුනා ගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය ගොඩ නගා ගැනීම සඳහා ක්‍රියා කරයි. | 12.1 සංස්කෘතික උරුමය හා හර පද්ධතීන් පිළිබඳ ව අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.<br>12.2 කියවීම මගින් සමාජ සාරධර්ම චරිතායනය කර ගනියි.<br>12.3 දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ පරිශීලනය කරයි. | • විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇසුරෙන් | • දේශාභිමානී කවි ගීත අසා ජාතික උරුමය පිළිබඳව අභිමානයෙන් කතා කරයි.<br>• දේශයට මෙහෙවරක් කළ අභිමානවත් චරිත කථා කියවා, තම චරිතය ගොඩ නගා ගත යුතු බව ප්‍රකාශ කරයි.<br>• දේශාභිමානය දනවන නිර්මාණ රැස් කරයි. | 15 |

නිර්දිෂ්ට ග්‍රන්ථ :

- සිංහල 1 මූලික පිරිවෙණ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- නම් පොත සහ මඟුල් ලකුණ
- ලෝවැඩ සඟරාවේ මුල් කවි 50
- හීන්සැරය - කුමාරතුංග මුනිදාස

විෂය සමගාමී ක්‍රියාකාරකම් :

සාහිත්‍ය සමිතිය, බිත්ති පුවත්පත් නිර්මාණය, සඟරා නිර්මාණ, සිංහල භාෂා දින සැමරුම්, ප්‍රදර්ශන, පුස්තකාල පරිහරණය

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**01**

# සිංහල හෝඩිය

**නිපුණතාව** : 01 අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳව සැලකිලිමත් වෙමින් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.1 අක්ෂර මාලාව නිවැරදි ලෙස උච්චාරණය කරයි.

**කාලච්ඡේද** : 02යි

**ඉගෙනුම් පල :**

- නූතන අක්ෂර මාලාව අක්ෂර 60කින් යුක්ත බව ප්‍රකාශ කරයි.
- අක්ෂර මාලාව නිවැරදි ව උච්චාරණය කරයි.
- අක්ෂර මාලාවේ ඉතිහාසය පිළිබඳ කෙටියෙන් විස්තර කරයි.
- භාෂාවේ ලිඛිත හා කථන ස්වරූප දෙක පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- අක්ෂර 60කින් යුත් නූතන අක්ෂර මාලාවේ පෝස්ටරයක් පිළියෙල කර ගන්න.
- භාෂාවේ ලිඛිත හා කථන ස්වරූප දෙකෙහි වෙනස පැහැදිලි කිරීමට සූදානම් වන්න.

**ප්‍රවේශය :**

- නන්දා මාලිනී මහත්මිය විසින් ගායනා කරනු ලබන ''අ යන්න කියන්න ලොවට ම ඇහෙන්න'' ගීතය සවන් දීමට සැලැස්වීමෙන් ප්‍රවේශ වෙන්න.

**පාඩම සංවර්ධනය :**

- අක්ෂර මාලාවේ පෝස්ටරය ප්‍රදර්ශනය කරන්න.
- අක්ෂර මාලාවේ අකුරු උච්චාරණය කර ගුරු ආදර්ශනයක් පෙන්වන්න.
- සිසුන් සමග ද උච්චාරණය කරන්න.
- සිසුන් දෙදෙනා බැගින් එකතු ව එකිනෙකාට උච්චාරණය කිරීමටත් පුහුණු වීමටත් අවස්ථාව ලබා දෙන්න.
- අක්ෂරමාලාව කටපාඩම් කරගෙන ඒමට පවරන්න.
- අක්ෂර මාලාවේ ඉතිහාසයට අදාළ කරුණු පැහැදිලි කර දෙන්න.
- භාෂාවේ ලිඛිත ස්වරූපය හා කථන ස්වරූපය දැක්වෙන පෝස්ටරය ප්‍රදර්ශනය කරන්න.
- ඒ ඇසුරින් භාෂාවේ විසමතා පැහැදිලි කර දෙන්න.
- අක්ෂර මාලාව මතකයෙන් නිවැරදි ව උච්චාරණය කිරීමත් භාෂාවේ ලිඛිත හා කථන ස්වරූපය පැහැදිලි කරන ආකාරයත් අනුව ඇගයීම හා ප්‍රතිපෝෂණය සිදු කරන්න.

**මූලික වදන් සංකල්ප :**

- කථන ව්‍යවහාරය - කතා කරන බස
- ලේඛන ව්‍යවහාරය - ලියන බස

**ගුණාත්මක යෙදවුම් :**

- අක්ෂර 60කින් යුත් අක්ෂර මාලාවේ පෝස්ටරය
- භාෂාවේ ලිඛිත හා කථන ස්වරූපය දැක්වෙන පෝස්ටරය

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- නූතන අක්ෂර මාලාව නිවැරදි ව උච්චාරණය කිරීම
- අක්ෂර මාලාවේ ඉතිහාසයට අදාළ කරුණු විස්තර කිරීම
- භාෂාවේ ලිඛිත හා කථන ස්වරූපයන්හි ලක්ෂණ පැහැදිලි කිරීම
- නූතන සිංහල අක්ෂර මාලාවේ අක්ෂර සංඛ්‍යාව ප්‍රකාශ කිරීම

## 02

# සිංහල හෝඩිය අක්ෂර වින්‍යාසය

**නිපුණතාව** : 01 අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳව සැලකිලිමත් වෙමින් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.2 අක්ෂර මාලාව හඳුනා ගෙන නිවැරදි ව ලියයි.

**කාලච්ඡේද** : 02යි

**ඉගෙනුම් පල :**

- අක්ෂර හඳුනා ගෙන සම්මත ප්‍රභේදවලට අනුව වර්ග කර දක්වයි.
- අක්ෂරවල හැඩය හඳුනා ගෙන නිවැරදි ව ලියයි.
- ස්වර ව්‍යඤ්ජන සංයෝග කරමින් පිලි යොදා ලියයි.
- ස්වරාරූඪ ව්‍යඤ්ජනාක්ෂරවල ස්වර ව්‍යඤ්ජන වෙන් කර ලියයි.
- අක්ෂර උච්චාරණය නිවැරදි ව කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- අක්ෂර මාලාවේ වර්ගීකරණයන් දැක්වෙන පෝස්ටරයක් සූදානම් කර ගන්න.
- ස්වර ව්‍යඤ්ජන සංයෝගයත් විසංයෝගයත් පැහැදිලි කිරීමට අවශ්‍ය කාඩ්පත් සකස් කර ගන්න.

**ප්‍රවේශය :**

- අක්ෂර මාලාව පිළිබඳ පෙර දැනුම සිහිපත් කිරීම හෝ වෙනත් සුදුසු ප්‍රවේශයක් යොදා ගන්න.

**පාඩම සංවර්ධනය :**

- අක්ෂර මාලාවේ වර්ගීකරණය, පෙළ පොතේ සඳහන් ආකාරයට සකස් කළ පෝස්ටරය ප්‍රදර්ශනය කරන්න.
- ඒ ඇසුරින් අක්ෂර මාලාවේ වර්ගීකරණ පැහැදිලි කර දෙන්න.
- අකුරුවල හැඩය, ප්‍රමාණය හා දිශාව පිළිබඳ පැහැදිලි කරන්න.
- ඒ අනුව නිවැරදි ව අකුරු ලිවීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- අකුරු ලිවීම හුරුවීම සඳහා අවශ්‍ය නම් කොපි ලිවීමට ද අවස්ථාව ලබා දෙන්න.
- මේ සඳහා පස්රූල් පොත් භාවිත කරන්න.
- ව්‍යඤ්ජන අකුරුවලට පිලි යෙදෙන ආකාරය පැහැදිලි කරන්න.
- පිලි යෙදුණු අකුරුවල ස්වර ව්‍යඤ්ජන වෙන් කරන ආකාරය පැහැදිලි කරන්න.
- ශිෂ්‍යයන් අක්ෂර ලියන ආකාරය අනුවත් ස්වර ව්‍යඤ්න වෙන් කරන ආකාරය අනුවත් ඇගයීම හා ප්‍රතිපෝෂණය සිදු කරන්න.

**මූලික වදන් සංකල්ප :**

- මහාප්‍රාණාක්ෂර = වැඩි ශක්තියක් යොදා උච්චාරණය කළ යුතු අකුරු
- අල්පප්‍රාණාක්ෂර = සාමාන්‍ය ස්වභාවයෙන් උච්චාරණය කරන අකුරු
- ප්‍රාණාක්ෂර = තනි ව ශබ්ද කළ හැකි අකුරු/ගාත්‍රාක්ෂරවලට පණ දෙන අකුරු
- ගාත්‍රාක්ෂර/ව්‍යඤ්ජනාක්ෂර = තනි ව ශබ්ද කළ නොහැකි අක්ෂර

**ගුණාත්මක යෙදවුම් :**

- නූතන අක්ෂර මාලාවේ වර්ගීකරණ සහිත පෝස්ටරය
- ස්වර ව්‍යඤ්ජන සංයෝගය හා විසංයෝගය දැක්වෙන කාඩ්පත්

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- මූලික වර්ගීකරණයන්ට අනුව අක්ෂර හඳුනා ගැනීම
- අක්ෂරවල හැඩය හඳුනා ගෙන නිවැරදි ව ලිවීම
- ස්වර ව්‍යඤ්ජන සංයෝග කරමින් පිලි යොදා ලිවීම
- ස්වරාරූඪ ව්‍යඤ්ජනාක්ෂරවල ස්වර ව්‍යඤ්ජන වෙන් කර ලිවීම

## 03

# සිංහල හෝඩිය (අකාරාදි පිළිවෙළ)

**නිපුණතාව** : 01 අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් භාවිත කරයි.

**නිපුණතා මට්ටම** : 1.3 අක්ෂර මාලාවේ රටාව හඳුනා ගෙන නිවැරදි ව ස්ථානගත කර ලියයි.

**කාලච්ඡේද** : 02යි

**ඉගෙනුම් පල :**

- නූතන සිංහල අක්ෂර මාලාව අනුපිළිවෙළින් ලියා දක්වයි.
- අකාරාදි පිළිවෙළට පද පෙළ ගස්වයි.
- අකාරාදි පිළිවෙළ අනුගමනය කරමින් ශබ්ද කෝෂ පරිහරණය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- අක්ෂර මාලාව පිළිවෙළින් ලියන ලද පෝස්ටරයක් සූදානම් කර ගන්න.
- අකාරාදි පිළිවෙළට නම් සකස් කිරීම සඳහා නම් ලැයිස්තුවක් පිළියෙල කර ගන්න.

**ප්‍රවේශය :**

- නිරීක්ෂණය සඳහා සිංහල ශබ්ද කෝෂයක් ශිෂ්‍යයන්ට ලබා දී එහි වචන පෙළ ගස්වා ඇති ආකාරය අධ්‍යයනය කිරීමෙන් පාඩමට ප්‍රවේශ වෙන්න.

**පාඩම සංවර්ධනය :**

- පෝස්ටරය ඇසුරින් අක්ෂර මාලාවේ අනුපිළිවෙළක් ඇති බව අවධාරණය කරන්න.
- අකාරාදි පිළිවෙළට නම් පෙළ ගස්වන ආකාරය පැහැදිලි කර දෙන්න.
- සරල අභ්‍යාස මගින් අකාරාදි පිළිවෙළට නම් පෙළ ගස්වන ආකාරය ප්‍රගුණ කර වන්න.
- අකාරාදි පිළිවෙළට අනුව ශබ්ද කෝෂ පරිහරණයට යොමු කරවන්න.
- පද මාලා අකාරාදි පිළිවෙළට සකස් කරන අකාරය අනුව ඇගයීම හා ප්‍රතිපෝෂණය සිදු කරන්න.

**මූලික වදන් සංකල්ප :**

- අකාරාදි පිළිවෙළ = අක්ෂර මාලාවේ අකුරු යෙදී ඇති අනුපිළිවෙළ
- ශබ්ද සංකේත = ශබ්ද ලියා දැක්වීම සඳහා යොදන අකුරු හෝ පිලි
- ශබ්ද කෝෂය = අකාරාදි පිළිවෙළට වචන පෙළ ගස්වා ඒවායේ විවිධ අර්ථ දක්වා ඇති ග්‍රන්ථය

**ගුණාත්මක යෙදවුම් :**

- නූතන සිංහල අක්ෂර මාලාව ඇතුළත් පෝස්ටරය
- සම්මත සිංහල ශබ්ද කෝෂයක්

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- නූතන සිංහල අක්ෂර මාලාව අනුපිළිවෙළින් ප්‍රකාශ කිරීම
- අකාරාදි පිළිවෙළට පද පෙළ ගස්වා ලිවීම
- අකාරාදි පිළිවෙළ අනුගමනය කරමින් ශබ්ද කෝෂ පරිහරණය කිරීම

**04**

## නාම පද

**නිපුණතාව** : 02 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනී.

**නිපුණතා මට්ටම** : 2.1 නාම පද පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 06යි

**ඉගෙනුම් පල :**

- නාම යනු කුමක්දැයි හඳුනා ගෙන නිවැරදි ව ප්‍රකාශ කරයි.
- නාම පද ප්‍රාණවාචී හා අප්‍රාණවාචී වශයෙන් වෙන් කර ලියයි.
- නාම පද සංඛ්‍යා භේදය අනුව වර්ග කර ලියා දක්වයි.
- නාම පද ලිංගභේදය අනුව වර්ග කර ලියයි.
- නාම පදවල පුරුෂ භේදය නිවැරදි ව හඳුනා ගෙන වර්ග කර ලියයි.
- එක් එක් නාම පදය උක්ත අනුක්ත භේදය අනුව වර්ග කර ලියයි.
- සර්ව නාම යනු කුමක් දැ'යි හඳුනා ගෙන කේවල නාමවලට සර්ව නාම ගළපා ලියයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- එක් එක් නාම පද ප්‍රභේදය සඳහා අභ්‍යාස සහිත ලේඛන සකස් කර ගන්න.
- විවිධ නාම පද ඇතුළත් ලේඛනයක්, කේවල නාමවලට යෙදෙන සර්ව නාම ලේඛනයක් සූදානම් කරගන්න.

**ප්‍රවේශය :**

- සත්ත්ව, පුද්ගල, වස්තු, ස්ථාන, හා සංකල්ප ඇතුළත් නාම පද ලේඛනයක් ඇසුරෙන් කරන සාකච්ඡාවකින් හෝ වෙනත් සමාන විකල්ප ක්‍රමයක් අනුගමනය කරමින් පාඩමට ප්‍රවේශ වන්න.

**පාඩම සංවර්ධනය :**

- නාම පද යන්න හඳුන්වා දී විවිධ නාම පද සඳහා නිදසුන් සැපයීමට අවස්ථාව සලසන්න.
- නාම පද ලේඛනය ඇසුරෙන් ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම පද වර්ගීකරණය පැහැදිලි කරන්න.
- නාම පදවල සංඛ්‍යා භේදය පැහැදිලි කරන්න.
- නාම පදවල ලිංග භේදය පහදා දෙන්න.
- නාම පදවල පුරුෂ භේදය නාම පද ලේඛනය ඇසුරෙන් පැහැදිලි කරන්න.
- එක ම නාම පදයක් උක්ත අනුක්ත භේදය අනුව දෙවර්ගයකට බෙදෙන බව සරල වාක්‍යවල යොදා පැහැදිලි කරන්න.
- නාම පද ලෙස හැඳින්විය හැකි විවිධ පද වර්ග සඳහා නිදසුන් සැපයීමට සලස්වන්න.
- එක් එක් නාම පද ප්‍රභේදයක් අවසානයේ ඇගයීමක් ඉදිරිපත් කරන්න.
- නාම පද කීපයක උක්ත අනුක්ත පද තෝරා ලිවීමට සලස්වන්න.

**මූලික වදන් සංකල්ප :**

| | |
|---|---|
| • ප්‍රාණවාචී අප්‍රාණවාචී නාම පද | = පණ ඇති හා පණ නැති නාම පද |
| • සංඛ්‍යා භේදය | = ඒක වචන හා බහු වචන වශයෙන් බෙදා දැක්වීම |
| • පුරුෂ භේදය | = ප්‍රථම, මධ්‍යම, උත්තම (පුරුෂ) වශයෙන් බෙදා දැක්වීම |
| • උක්තානුක්ත භේදය | = වාක්‍යයක ක්‍රියාවෙන් කිසියම් පදයක් උක්ත වීම, නොවීම |
| • සර්ව නාම | = සෑම කේවල නාමයක් ම හැඳින්විය හැකි පොදු නාම |

**ගුණාත්මක යෙදවුම් :**

- එක් එක් ප්‍රභේදය සඳහා කලින් සූදානම් කර ගත් ඇගයීම් ලේඛන
- නාම පද ලේඛනය

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- නාම පද ලෙස හඳුන්වන විවිධ පද වර්ග සඳහා අවබෝධයෙන් යුතු ව නිදසුන් සැපයීම
- ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම පද නිවැරදි ව වෙන් කර ලිවීම
- සංඛ්‍යා භේදය හොඳින් තේරුම් ගෙන වර්ගීකරණය කර ලිවීම
- නාම පදවල ලිංග භේදය අනුව නාම පද නිවැරදි ව ලිංග තුනට වෙන් කර ලිවීම
- නාම පද නිවැරදි ව පුරුෂ තුනට බෙදා ලිවීම
- එක් එක් නාම පදවල උක්ත, අනුක්ත පද නිවැරදි ව වර්ග කර ලියා දැක්වීම
- කේවල නාමවලට ගැළපෙන සර්ව නාම පද නිවැරදි ව ගළපා ලිවීම

## 05

## ක්‍රියා පද

**නිපුණතාව** : 02 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනී.

**නිපුණතා මට්ටම** : 2.2 ආඛ්‍යාත පද පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව ලේඛනයේ නිරත වෙයි.

**කාලච්ඡේද** : 06 යි

**ඉගෙනුම් පල :**

- ක්‍රියා පද යනු කුමක් දැ'යි නිර්වචනය කර විවිධ ක්‍රියා වර්ග සඳහා නිදසුන් ප්‍රකාශ කරයි.
- අවසාන ක්‍රියා හා අනවසාන ක්‍රියා නිවැරදි ව වෙන් කර ලියයි.
- අවසාන ක්‍රියා පද ආඛ්‍යාත පද ලෙස ද හඳුන්වන බව ප්‍රකාශ කරයි.
- ක්‍රියා පද කාල වශයෙන් නිවැරදි ව වර්ග කර ලියයි.
- ක්‍රියා පද පුරුෂ වශයෙන් නිවැරදි ව වර්ග කර ලියයි.
- ක්‍රියා පද වචන වශයෙන් නිවැරදි ව වර්ග කර ලියයි.
- ක්‍රියා පද සකර්මක, අකර්මක වශයෙන් තෝරා ලියයි.
- නාම පදවලින් ද ක්‍රියා පද තැනිය හැකි බව හඳුනා ගෙන එබඳු ක්‍රියා නිර්මාණය කර ලියයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- සෑම ක්‍රියා පද භේදයක් අවසානයේ දී ශිෂ්‍යයන්ට ලබා දීම සඳහා තේරීම් අභ්‍යාස ලේඛන සකස් කර ගන්න.
- විවිධ ක්‍රියාවන් සහිත සිතුවම් පෙළක් දැක්වෙන පත්‍රිකාවක් සූදානම් කර ගන්න.

**ප්‍රවේශය :**

- විවිධ ක්‍රියාවන් සහිත සිතුවම් පෙළ දැක්වෙන පත්‍රිකාව පෙන්වා ඒ සම්බන්ධ සාකච්ඡාවකින් හෝ ගද්‍ය හෝ පද්‍ය පාඨයක් දක්වා එහි ඇති ක්‍රියා පද ඇසුරෙන් කරන සාකච්ඡාවකින් පාඩමට ප්‍රවේශ වන්න.

**පාඩම සංවර්ධනය :**

- විවිධ ක්‍රියා පද වර්ග ඉදිරිපත් කර ඒවාට සමාන වෙනත් නිදසුන් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසන්න.
- අවසාන ක්‍රියා හා අනවසාන ක්‍රියා හඳුන්වා දෙන්න. එවැනි ක්‍රියා පද වෙන් කර ලිවීමට අභ්‍යාසයක් දෙන්න. ක්‍රියා පදයක මූලික ප්‍රභේද හඳුන්වා දෙන්න.
- ඒ එක එකක් අවසානයේ වර්ග කර ලිවීමේ අභ්‍යාසයක් දෙන්න.
- නාම පදවලින් ක්‍රියා පද තැනිය හැකි බව පෙන්වා දී එබඳු ක්‍රියා නිර්මාණය කර ලිවීමට සලස්වන්න.
- ක්‍රියා පද ලෙස හැඳින්විය හැකි විවිධ ක්‍රියා වර්ගවලට සමාන ක්‍රියා පද ප්‍රකාශ කරන්නට අවස්ථාව සලසන්න.
- අවසාන ක්‍රියා හා අනවසාන ක්‍රියා වර්ග කර ලිවීමේ අභ්‍යාසයක් දෙන්න.
- සෑම ප්‍රභේදයක් අවසානයේ ම වර්ග කිරීමේ අභ්‍යාසයක් දෙන්න.
- නාම පදවලින් ක්‍රියා පද තැනීමට යොමු කරන්න.

**මූලික වදන් සංකල්ප :**

- ධාතු ප්‍රකෘතිය = ක්‍රියා ප්‍රකෘතිය නමින් ද හැඳින්වෙන ක්‍රියාවේ මූලික ස්වභාවය
- නාමාඛ්‍යාත = නාමයකට "ය" සහ "ඉ" ප්‍රත්‍ය යොදා සකස් කරගන්නා නාම ක්‍රියා

**ගුණාත්මක යෙදවුම් :**

- ක්‍රියා ප්‍රභේද සඳහා වෙන වෙන ම සකස් කළ අභ්‍යාස පත්‍රිකා
- විවිධ ක්‍රියා දැක්වෙන සිතුවම් සහිත ලේඛනය

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- විවිධ වර්ගයේ ක්‍රියා පද සඳහා නිදසුන් නිවැරදි ව ප්‍රකාශ කිරීම
- අවසාන ක්‍රියා හා අනවසාන ක්‍රියා නිවැරදි ව වර්ග කර ලිවීම
- අවසාන ක්‍රියා පද ආඛ්‍යාත පද ලෙස ද හඳුන්වන බව ප්‍රකාශ කිරීම
- ක්‍රියා පද කාල තුනට නිවැරදි ව වර්ග කර ලිවීම
- ක්‍රියා පද සංඛ්‍යා භේදය අනුව වර්ග කර ලිවීම
- පුරුෂ තුනට ක්‍රියා පද නිවැරදි ව වෙන් කර ලිවීම
- සකර්මක අකර්මක ක්‍රියා නිවැරදි ව වර්ග කර ලිවීම
- නාම පදවලට ප්‍රත්‍ය යොදා නිවැරදි ක්‍රියා තැනීම

**06**

## වාක්‍ය නිර්මාණය

**නිපුණතාව** : 02 ලේඛන කාර්යයන් ඉටු කර ගැනීමේ දී ව්‍යාකරණ විධි නිවැරදි ව යොදා ගනී.

**නිපුණතා මට්ටම** : 2.3 ව්‍යාකරණානුකූල ව සරල වාක්‍ය නිර්මාණය කරයි.

**කාලච්ඡේද** : 06යි

**ඉගෙනුම් පල :**

- උක්තය, කර්මය, ආඛ්‍යාතය වාක්‍යයක ප්‍රධාන අංග ලෙස ප්‍රකාශ කරයි.
- උක්තය හා ආඛ්‍යාතය පමණක් යෙදී වුව ද වාක්‍ය නිර්මාණය කළ හැකි බව ප්‍රකාශ කරයි.
- වචන, ලිංග, පුරුෂ, කාල භේද සලකමින් සරල වාක්‍ය ලියයි.
- වාක්‍යයක අප්‍රාණවාචී උක්තයට අනුව යෙදෙන ආඛ්‍යාතය ඒක වචන ම වන බව තේරුම් ගෙන එබඳු වාක්‍ය ලියයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- වචන, ලිංග, කාල, පුරුෂ භේද අනුව වරනැගෙන සරල වාක්‍යවලින් යුතු වගුවක් සහිත පෝස්ටරයක් සූදානම් කරගන්න.
- සරල වාක්‍යයක් සහිත කාඩ්පත ප්‍රවේශය සඳහා සූදානම් කර ගන්න.

**ප්‍රවේශය :**

- සරල වාක්‍යයක් සහිත කාඩ්පත දක්වා ඒ ඇසුරින් සාකච්ඡා කොට පාඩමට ප්‍රවේශ වන්න.

**පාඩම සංවර්ධනය :**

- සරල වාක්‍ය කළුලෑල්ලේ ලියා එහි ප්‍රධාන අංග ලිවීමට අවස්ථාව සලසන්න.
- උක්තය හා ආඛ්‍යාතය පමණක් යෙදී වුව ද සම්පූර්ණ වාක්‍යයක් තැනෙන බව පහදා දෙන්න.
- පෝස්ටරය ආශ්‍රයෙන් වචන, පුරුෂ, කාල, ලිංග භේද අනුව වරනැගෙමින් වාක්‍ය තැනෙන ආකාරය ප්‍රගුණ කරවන්න.
- අප්‍රාණවාචී උක්තයට අනුව යෙදෙන ආඛ්‍යාතය ඒකවචන ම වන බව පහදා දෙන්න. ඒ සම්බන්ධ ප්‍රතිචාර ලබා ගන්න.

**මූලික වදන් සංකල්ප :**

- අකර්මක ක්‍රියා = වාක්‍යයකට කර්මයක් රහිත ව පූර්ණ අර්ථයක් දෙන ක්‍රියා
- සකර්මක ක්‍රියා = වාක්‍යයකට කර්මයක් සහිත ව පූර්ණ අර්ථයක් දෙන ක්‍රියා

**ගුණාත්මක යෙදවුම් :**

- වගු ගත කළ මූලික ප්‍රභේද සහිත වාක්‍ය ඇතුළත් පෝස්ටරය

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- වාක්‍යයක මූලික අංග පිළිබඳ අවබෝධයෙන් යුතු ව වාක්‍ය නිර්මාණය කරමින් ප්‍රකාශ කිරීම
- උක්තය හා ආඛ්‍යාතය සහිත සරල වාක්‍ය නිවැරදි ව තැනීම
- සම්මත වාක්‍ය රීති හඳුනා ගෙන නිවැරදි වාක්‍ය ලිවීම
- අප්‍රාණවාචී උක්තය සහිත ආඛ්‍යාතය ඒක වචන වූ වාක්‍ය නිර්මාණය කිරීම

07

## විවධාර්ථවත් පද

**නිපුණතාව** : 03 භාෂා ක්‍රියාකාරකම් මගින් වාං මාලාව පෝෂණය කර ගෙන භාෂා කාර්යයන්හි දී උචිත පරිදි භාවිතයට ගනී.

**නිපුණතා මට්ටම** : 3.1 විවිධාර්ථවත් පද භාෂා කාර්යයන්හි දී අර්ථවත් ලෙස යොදා ගනී.

**කාලච්ඡේද** : 06යි

**ඉගෙනුම් පල :**

- සමානාර්ථ පද හඳුනා ගෙන නිදසුන් සපයයි.
- අවස්ථාවට උචිත ලෙස ගැළපෙන සමානාර්ථ පද තෝරා ලියයි.
- විරුද්ධාර්ථ පද විභාග කර නිදසුන් ප්‍රකාශ කරයි.
- බහ්වර්ථ පද විභාග කර එබඳු පදවලට ගැළපෙන අරුත් ලියයි.
- පුළුල් වාක්කෝෂීය දැනුමක් තිබීමෙන් ව්‍යක්ත ව අදහස් ප්‍රකාශ කළ හැකි බව ප්‍රකාශ කරයි.
- පුළුල් වාක්කෝෂයකින් භාෂාව නිර්මාණාත්මක ව යොදා ගත හැකි බව පවසයි.
- සමානාර්ථ පද, විරුද්ධාර්ථ පද හා බහ්වර්ථ පද සඳහා වෙන වෙන ම ගොනු සකස් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- සිසුන්ට පෙන්වීම සඳහා සිත් ගන්නා සුලු විවිධ පද වර්ණ ඇතුළත් ආදර්ශ ගොනුවක්,
- සමානාර්ථ පද, විරුද්ධාර්ථ පද හා බහ්වර්ථ පද සඳහා සකස්කර ගන්නා ලද අභ්‍යාස හා එම පද දැක්වෙන පෝස්ටරය සකස් කර ගන්න.

**ප්‍රවේශය :**

- සමානාර්ථ, විරුද්ධාර්ථ හා බහ්වර්ථ පද දැක්වෙන පෝස්ටරය ප්‍රදර්ශනය කර සාකච්ඡාවකින් පාඩමට ප්‍රවේශ වන්න.

**පාඩම සංවර්ධනය :**

- විවිධ පද වර්ග පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- පුළුල් වාක්කෝෂීය දැනුමක් තිබීමේ අගය පහදා දෙන්න.
- සිංහල භාෂාවේ වාක්කෝෂීය පෘථුලත්වය අගයන්න.
- සමානාර්ථ පද, විරුද්ධාර්ථ පද හා බහ්වර්ථ පද පැහැදිලි කරන්න.
- නාම පද සේ ම ක්‍රියාපද සඳහාත් එම පද යෙදෙන බව නිදසුන් සහිත ව දක්වන්න.
- සමානාර්ථ පද අවස්ථාවට උචිත පරිදි යෙදිය යුතු බව පැහැදිලි කරන්න.
- යෙදෙන අවස්ථාව හා පරිසරය අනුව බහ්වර්ථ පදවල අර්ථය තේරුම් ගත යුතු බව පැහැදිලි කරන්න.
- පුළුල් වාක්කෝෂීය දැනුමක් මගින් ව්‍යක්ත ව අදහස් ප්‍රකාශ කළ හැකි බව පහදා දෙන්න.
- පුළුල් වාක්කෝෂයකින් භාෂාව නිර්මාණාත්මක ව භාවිත කළ හැකි බව පෙන්වා දෙන්න.
- ආදර්ශවත් පද ගොනුවක් පෙන්වා එබඳු නිර්මාණ කිරීමට උනන්දු කරන්න.
- සමානාර්ථ, විරුද්ධාර්ථ හා බහ්වර්ථ පද සඳහා වෙන වෙන ම අභ්‍යාස දෙන්න.
- වෙන වෙන ම පද ගොනු සකස් කිරීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- විවිධ පද වර්ග ඇතුළත් ආදර්ශ ගොනුවක්

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- සමානාර්ථ, විරුද්ධාර්ථ හා බහ්වර්ථ පද හඳුනා ගෙන නිවැරදි ව ලියා දැක්වීම.
- අවස්ථාව හා පරිසරය අනුව එබඳු උචිත පද තෝරා ලිවීම.
- පුළුල් වාක්කෝෂීය දැනුම මගින් ව්‍යක්ත ව අදහස් ප්‍රකාශ කළ හැකි බව ප්‍රකාශ කිරීම.
- පුළුල් වාක්කෝෂයකින් භාෂාව නිර්මාණාත්මක ව භාවිත කළ හැකි බව පැවසීම.
- එක් එක් පද සඳහා පද ගොනු නිර්මාණය කිරීම.

**08**

## වාක්‍ය රචනය

**නිපුණතාව** : 04 අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 4.1 මාතෘකාවකට අනුව සරල වාක්‍ය ගොඩ නගයි.

**කාලච්ඡේද** : 05යි

**ඉගෙනුම් පල :**

- මාතෘකාවට අනුව නිවැරදි ව අදහස් ඉදිරිපත් කරයි.
- උක්තාඛ්‍යාත සම්බන්ධය අනුව නිවැරදි වාක්‍ය ලියයි.
- අක්ෂර වින්‍යාසය නිවැරදි ව භාවිත කරයි.
- කරුණුවල වැදගත්කම අනුව සරල වාක්‍ය පෙළ ගස්වා ලියයි.
- කරුණු පෙළ ගස්වා රචනාවක් ලියයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- ඇමුණුම 1හි සඳහන් කරුණු අනුව රචනාවක් ලියන අයුරු පැහැදිලි කිරීම සඳහා සූදානම් වන්න.

**ප්‍රවේශය :**

- ඇමුණුම් අංක 2හි සඳහන් ආකාරයේ ආදර්ශ රචනාවක් පන්තියට ඉදිරිපත් කරන්න.

**පාඩම සංවර්ධනය :**

- ශිෂ්‍යයන් කණ්ඩායම් හතරකට සුදුසු පරිදි වෙන් කරන්න.
- මාතෘකාවට අදාළ ව ලියන ලද ඇමුණුම් අංක 3හි සඳහන් කියවීම් පත්‍රිකා හතර කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- හොඳින් කියවූ පසු එම පත්‍රිකා ගුරුවරයා රැගෙන එම මාතෘකාවලට අනුව සරල වාක්‍ය ලිවීමට කණ්ඩායම්වලට උපදෙස් දෙන්න.
- කණ්ඩායම් හතරට ම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- තනි තනිව ම රචනාවක් ලිවීමට පොදු මාතෘකාවක් ලබා දෙන්න.
- තෝරා ගත් ශිෂ්‍යයන්ගේ රචනා කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී එහි අක්ෂර වින්‍යාසය, උක්තාඛ්‍යාත සම්බන්ධය, භාෂාවේ රසවත් බව හා කරුණුවල වැදගත්කම අනුව පෙළ ගැස්වීම ගැන සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම් අංක 2හි සඳහන් ආදර්ශ රචනාව
- ඇමුණුම් අංක 3හි සඳහන් කාර්ය පත්‍රිකා

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- මාතෘකාවට අනුව නිවැරදි ව අදහස් ඉදිරිපත් කිරීම
- උක්තාඛ්‍යාත සම්බන්ධය අනුව නිවැරදි වාක්‍ය ලිවීම
- අක්ෂර වින්‍යාසය නිවැරදි ව භාවිත කිරීම
- කරුණුවල වැදගත්කම අනුව සරල වාක්‍ය පෙළ ගස්වා ලිවීම
- කරුණු පෙළ ගස්වා රචනාවක් ලිවීම

ඇමුණුම 1    රචනාවක් ලිවීම සඳහා උපදෙස්

යමක් රටාවකට ලියා ඉදිරිපත් කිරීම රචනය නම් වෙයි. ඒ අනුව රචනය යනු රටාවකට සැකසීම යන අර්ථය යි. එය වඩාත් පැහැදිලි ව ප්‍රකාශ කළ යුත්තේ: නිශ්චිත මාතෘකාවක් යටතේ ඊට අදාළ කරුණු හා හැඟීම් ක්‍රමවත් ව සංවිධානාත්මක ව හා නිර්මාණාත්මක ව ලේඛන මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීම වාක්‍ය රචනය වේ, යනුවෙනි. මේ අනුව වාක්‍ය රචනය කිසියම් සැලසුම් ක්‍රමයකට අනුව ලිවිය යුතු ප්‍රබන්ධයකි. වාක්‍ය රචනය යටතේ මාර්ගෝපදේශිත රචනය යන්න හැඳින ගත යුතු වේ. රචනා මාතෘකාව යටතේ ඉදිරිපත් කර ඇති මග අනුව නැතහොත් උපදෙස් අනුගමනය කරමින් ලිවිය යුතු රචනය, මාර්ගෝපදේශිත රචනයකි.

රචනයේ විස්තරාත්මක කොටස මෙය යි. මෙහි දී මාතෘකාවට අදාළ කරුණු අනුපිළිවෙළින් සහ තර්කානුකූල ව ඡේද වශයෙන් ලිවිය යුතු ය. එහි ප්‍රමාණවත් බව ද වැදගත් වේ. ඡේද වෙන් කිරීමේ දී ක්‍රමවත් පෙළ ගැස්මක් සකස් කර ගැනීම වැදගත් වේ. වෙනත් ඡේදයක සටහන් කරන ලද කරුණු නැවත නැවත සටහන් කිරීම උචිත නො වේ. වාක්‍ය රචනයේ අවසාන ඡේදය, සමාලෝචනය සඳහා යොදා ගත යුතු ය. එහි දී තෝරා ගත් මාතෘකාව යටතේ ඉදිරිපත් කළ කරුණු ක්‍රමවත් ව අවසන් කළ යුතු වේ. සමාලෝචනයේ දී රචනයේ ඉදිරිපත් කළ කරුණුවල සාරාංශයක් අදාළ මාතෘකාව පිළිබඳ රචකයාගේ නිගමනය හෝ විනිශ්චය සහිත ව ඉදිරිපත් කෙරේ. රචනය සාර්ථක ව ලියැවී තිබේ දැ'යි යන්න මූලික කරුණු තුනක් යටතේ සලකා බැළේ.

1. මාතෘකාවට අදාළ බව
2. රචනා ශෛලිය හා භාෂා විලාසය
3. ශිල්පීය දක්ෂතා වශයෙනි.

මුල්කර ගත් මාතෘකාවට ගැළපෙන කරුණුවලින් රචනය පෝෂිත විය යුතු ය. ඒ සඳහා අදාළ කරුණු පමණක් අනුපිළිවෙළින් පෙළ ගස්වා ගත යුතු ය. රචනය සඳහා කරුණු විවිධ ජන මාධ්‍යවලින්, සඟරා හා පොත පත කියවීමෙන් සාකච්ඡා හා සම්මන්ත්‍රණ ආදියට නොමඳ ව අවධානය යොමු කිරීමෙන් සපයා ගත යුතු ය.  මාතෘකානුකූල විෂය කරුණු  සමාලෝචනය සාර්ථක රචනයක ලක්ෂණයකි. මාතෘකාවට අදාළ බව රචනයේ ආරම්භක වාක්‍යයෙන් ම සමස්ත රචනය කෙරෙහි පාඨකයාගේ අවධානය යොමු වේ. මේ නිසා එහි ආරම්භක වාක්‍යය නිර්මාණශීලී ව ලියා දැක්වීම කළ යුත්තකි. ඒ සඳහා මාතෘකාවට සම්බන්ධ කළ හැකි කිසියම් උද්ධෘත පාඨයක් හෝ මාතෘකාව පිළිබඳ නිර්වචනයක් හෝ ඉදිරිපත් කළ හැකි ය. ''දැනුම වඩන කියවීම'' යන මාතෘකාව යටතේ වාක්‍ය රචනයක් ලිවීමේ දී පහත ඉදිරිපත් කරන වැකිවලින් එක් ප්‍රවේශ වාක්‍යයක් ඉදිරිපත් කිරීම උචිත ය.

i. මේ තොරතුරු ලෝකයකි. තොරතුරු දැන ගැනීමට පොත පත මෙන් ම අන්තර්ජාලය ද පරිශීලනය කිරීමට සිදු වෙයි.
ii. දැනුම හා කියවීම අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධයකි.
iii. දැනුම මොහොතින්  මොහොත අලුත් වෙයි. එය යාවත්කාලීන ව පවත්වා ගැනීම සඳහා කියවීම මහෝපකාරී වෙයි.
iv. දැනුම වඩන විවිධ මාර්ග අතුරෙන් වඩා පලවත් මග වන්නේ කියවීම යි.
v. කියවීම අංග සම්පූර්ණ මිනිසකු තනයි.
vi. කියවීමෙන් දැනුම පිරේ.
vii. දැනුම නමැති තක්සලාවේ උපරිම තලයට යා හැක්කේ පොත පත කියවීමෙනි.

මෙබඳු එක් වැකියකින් ආරම්භය ලියා අනතුරු ව දෙවන වැකිය මුල් වැකියට ගැළපෙන අයුරින් ඉදිරිපත් කළ යුතු ය. සෙසු වැකි ද ගැළපෙන අයුරින් ඉදිරිපත් කර පළමු ඡේදයේ මාතෘකාව හැඳින්වීම ක්‍රමවත් ව සිදු කළ යුතු වේ. එය තවදුරටත් අවබෝධ කර ගැනීම සඳහා පහත එක් එක් මාතෘකාව යටතේ ඉදිරිපත් කර ඇති ප්‍රවේශ වාක්‍ය කිහිපය අධ්‍යයනය කරන්න.

විදුලිය අරපිරිමසිමු
ප්‍රවේශය හෙවත් ආරම්භය
මාතෘකානුකූල විෂය කරුණු
සමාලෝචනය හෙවත් අවසානය

දියුණුවේ රන් දොරටු අතර අරපිරිමැස්ම ද එකකි. පිරිමසා ගෙන පාවිච්චි කිරීම අරපිරිමැස්ම යි. ජලය, ආහාර පාන, මිල මුදල්, අරපිරිමැස්මෙන් පාවිච්චි කළ හොත් ඒවා අපට බොහෝ කාලයක් යන තුරු ම පරිහරණය කළ හැකි ය. අප රටේ අරපිරිමැසිය යුතු ජාතික සම්පත් අතර විදුලිය ප්‍රධාන එකකි. සිංහල සාහිත්‍යයේ නැගීම - මාර්ටින් වික්‍රමසිංහ

රචනය සඳහා යොදා ගත් භාෂාවේ ස්වභාවය එහි අගය සඳහා බලපාන්නකි. ඒ සඳහා නිර්මාණාත්මක ව වාක්‍ය ඉදිරිපත් කිරීම මූලික වේ. වැකියක් නිර්මාණාත්මක වීමට ඊට එක් කෙරෙන වචන මාලාව, විශේෂණ, උපමා ආදි අලංකාර, වාක් සම්ප්‍රදාය, අව්‍යක්ත හා නො ගැළපෙන ප්‍රකාශවලින් තොර වීම ආදි කරුණු බලපායි. එබැවින් වාක්‍ය රචනයක් ලිවීමේ දී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතු වේ. එමෙන් ම සම්මත ලේඛන රීති අනුගමනය කිරීම ද වැදගත් වේ.

වාක්‍ය රචනයක ශිල්පීය දක්ෂතා යනු,

රචනය පැහැදිලි අත් අකුරින් යුක්ත වීම, අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදීම වාක්‍යවල නිසි තන්හි නිවැරදිව විරාම ලක්ෂණ යෙදීම, පද වෙන් කොට ලිවීම, අදාළ පරිදි ඡේද වෙන් කර ලිවීම ආදිය යි.

සාර්ථක රචනයක්, කියවන්නාට වෙහෙසකින් තොර ව කියවීමට හැකි, සිය දැනුම බුද්ධිය වර්ධනයට ඉවහල් වන ලේඛනයක් විය යුතු ය.

රචනා ශෛලිය හා භාෂා විලාසය
ශිල්පීය දක්ෂතා
ලිඛිත අභ්‍යාස

ඇමුණුම 2    ආදර්ශ රචනාව

# අනුරාධපුරය

ක්‍රි. පූ. 4 වැනි සියවසෙහි පටන් ක්‍රි. ව. 11 වැනි සියවස පමණ දක්වා ලංකාවේ ප්‍රධාන රාජධානිය වූ අනුරාධපුරය දිවයිනේ ඉතා ම වැදගත් ඓතිහාසික නගරය යි. පළමුවන වරට ලංකාවෙහි බුදුසසුන පිහිටුවන ලද්දේ අනුරාධපුරයෙහි බැවින් එය දිවයිනේ ප්‍රධාන පූජනීය නගරය ද වේ.

නැගෙනහිර දේශාන්තර 80x. 24. හා උත්තර අක්ෂභාග 8x. 21. ආශ්‍රිත ව ලංකාවේ උතුරු දිග තැනිතලාවෙහි මල්වතු ඔය බඩ පිහිටි මේ නගරය මුහුදු මට්ටමේ සිට සාමාන්‍යයෙන් අඩි 295ක් පමණ උස ය. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 57කි. සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය පැ.81x කි. අනුරාධපුරය වියළි කලාපයේ ප්‍රධාන කාලගුණ පර්යේෂණ මධ්‍යස්ථානයක් ද වේ.

1874හි පටන් අනුරාධපුරය උතුරු මැද පළාතේ අගනුවර යි. කොළඹ සිට අනුරාධපුරයට දුර සැතපුම් 127 1/2කි. මහනුවර සිට (දඹුල්ල හරහා) සැතපුම් 85 1/2කි. දහනවවැනි ශත වර්ෂයේ අග භාගයේ දී පුරාවස්තු පරීක්ෂණ සහ වැව් අමුණු ප්‍රතිසංස්කරණ ඇරඹීමෙන් පසු අනුරාධපුරය නව මුහුණුවරකින් දියුණු වන්නට විය. ඒ කාලයේ දී අනුරාධපුරයෙහි දුම්රිය නැවතුම්පළක් ද ඉදි කරන ලදි.

පෞරාණික අනුරාධපුර නගරයේ පුරාවස්තු ආරක්ෂා කර ගැනීමත් පූජනීය නගරයක් වශයෙන් එහි ශුද්ධත්වය රැක ගැනීමත් උදෙසා නිවාස, විදුහල්, වෙළඳපළවල්, අන්‍යාගාමික ගොඩනැගිලි ආදිය ශුද්ධ නගරයෙන් ඉවත් කොට නවීන නාගරික උවමනාවක් පිරිමසා ලන නව නගරයක් මල්වතු ඔයේ නැගෙනහිර ඉවුරෙහි ගොඩ නගා තිබේ.

ලංකාවේ ශ්‍රේෂ්ඨතම පූජනීය බෞද්ධ නගරය වූ අනුරාධපුරයෙහි පැරණි සිංහල නරපතීන් විසින් ඉදි කරන ලද බෞද්ධ සිද්ධස්ථාන අතුරෙන් අභයගිරිය, ඉසුරුමුණිය, කිරිබත් වෙහෙර, ජේතවනය, ථූපාරාමය, දක්ෂිණ විහාරය, දළදා මාලිගය (පැරණි), නඛා වෙහෙර, පාචීනතිස්ස පබ්බත විහාරය, මිරිසවැටිය, මහාබෝධි විහාරය, රුවන්වැලිසෑය, ලංකාරාමය, ලෝවාමහාපාය, විජයාරාමය, වෙස්සගිරිය, සංඝමිත්තා චෛතිය, සිලාචෛතිය යනාදිය ප්‍රතිසංස්කරණය කරනු ලැබ හෝ නෂ්ටාවශේෂ්ට ව තවමත් පවතී. ලෝකයේ ඇති ඉතා ම ශාන්ත වූ ශෛලමය සමාධි පිළිමය හැටියට ජගත් කීර්තියක් උසුලන ශ්‍රේෂ්ඨ කලා කෘතිය ද ලොව පුරාණතම ඓතිහාසික වෘක්ෂය හැටියට පිළිගනු ලබන ශ්‍රී මහා බෝධින්වහන්සේ ද ඇත්තේ අනුරාධපුරයෙහි ය. ඉහත සඳහන් පූජනීය ස්ථාන දැක වැඳ පුදා ගැනීම පිණිස පොසොන් සමයේ දී අනුරාධපුරයට දිවයිනේ සෑම පළාත්වලින් ම ඇදී එන ලක්ෂ සංඛ්‍යාත වන්දනාකරුවන් නිසා අවුරුදු පතා එම කාලයේ දී අනුරාධපුර ශුද්ධ නගරය උත්සවශ්‍රීයක් උසුලයි.

ඇමුණුම 3   කණ්ඩායම් ක්‍රියාකාරකම සඳහා කියවීම් පත්‍රිකා

**කණ්ඩායම 1**

ගම්පොළ සාහිත්‍ය යුගය

අනෙක් සාහිත්‍ය යුගවල දී මෙන් ම  මෙම යුගයේ ද බොහෝ සාහිත්‍ය කෘති රචනා වී ඇත. මේ යුගයේ දී සිංහල සන්දේශ කාව්‍ය රචනා වීම විශේෂත්වයකි. වෙනත් භාෂාවලින් රචිත සංදේශ කාව්‍ය මීට පෙර හමු වී තිබුණ ද සිංහල සන්දේශ කෘති මුල්වරට හමුවන්නේ මෙම යුගයේ දී ය. ගම්පොළ පස්වන බුවනෙකබාහු රජුගේ කාලයේ දී රචනා වූ මයූර සන්දේශය වැදගත් කෘතියකි. ගම්පොළ සිට දෙවිනුවර උපුල්වන් දෙවියන් වෙත මොනරෙකු අත යැවෙන පණිවිඩයක් මෙහි අඩංගු වේ. මෙහි කතුවරයා පිළිබඳ සඳහනක් නොමැත. මෙම යුගයේ දී රචිත තවත් සන්දේශයකි, තිසර සන්දේශය. මෙම සංදේශ දෙකෙහි බොහෝ සමානකම් අපට දැකගත හැකි වේ. නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය මෙම යුගයේ රචිත අගනා කෘතියකි. මෙය ගද්‍ය ග්‍රන්ථයකි. ද්විතීය ධර්මකීර්ති නාහිමිපාණන් වහන්සේ මෙම ග්‍රන්ථය රචනා කොට ඇත. එළු අත්තනගලුවංසය, සද්ධර්මාලංකාරය ආදී තවත් වටිනා කෘති රාශියක් මෙම යුගයේ දැකිය හැකි ය.

**කණ්ඩායම 2**

මහනුවර සාහිත්‍ය යුගය හා වර්තමානය

මහනුවර යුගය වන විට ලංකාවේ භික්ෂු අධ්‍යාපනය ක්‍රමයෙන් පිරිහීමට පත්වන්නට විය. පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි ජාතිකයන් විසින් මිෂනාරී පාසල් අධ්‍යාපනය ආරම්භ කරන ලදි. මෙහි දී අපේ සිංහල බෞද්ධයන්ට අකැමැත්තෙන් හෝ ක්‍රිස්තියානි හා කතෝලික ආගම වැළඳ ගැනීමට සිදුවිය. එහි දී ලැබූ අධ්‍යාපනය ද බෞද්ධ අධ්‍යාපනයක් නොවී ය. එතෙක් සිංහල සාහිත්‍යය හා බෞද්ධ සාහිත්‍යය එකක් ලෙස පැවැතියත් එය වෙනස් වන්නට විය. බෞද්ධ තේමා පදනම් කර ගෙන රචනා වූ ග්‍රන්ථ වෙනුවට නොයෙක් තේමා ඔස්සේ ග්‍රන්ථ රචනා වන්නට විය.  එසේ ම අනුක්‍රමයෙන් දේශීය උරුමයක් වූ ද ධර්මධර යතිවරයන් බිහි කිරීමේ පුරෝගාමිත්වය ගත්තා වූ පන්සල, පිරිවෙණ මුල් කරගත් බෞද්ධ අධ්‍යාපනය ක්‍රමයෙන් පිරිහීමට පත් විය. එය යළි ගොඩනැගුණේ අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමියන්ගේ ප්‍රමුඛත්වයෙන් ඇරඹි කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙණ හා අතිපූජ්‍ය රත්මලානේ ධර්මාලෝක මාහිමියන් ප්‍රමුඛ ව ඇරඹි කැලණියේ පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙණ ද ඇසුරිනි. ලෝකය කොතරම් තාක්ෂණය අතින් දියුණු වුවත් මිනිසුන්ගේ සිතුම් පැතුම් හා ආකල්ප දියුණු වන බවක් දැකිය නොහැකි ය. සාහිත්‍ය රසාස්වාදය තුළින් අපේ සිත්වල ඇති නොදියුණු ආකල්ප දියුණු ආකල්ප බවට වර්ධනය කරගත හැකි ය. පැරැණි ග්‍රන්ථ කියවීමෙන් අපේ මෙලොව ජීවිතයට පමණක් නොව පරලොව ජීවිතයට ද වැඩදායි දේ එක්කරගත හැකි ය. පාසල් දරුවන් වන අප අපේ පැරැණි සාහිත්‍ය ග්‍රන්ථ පිළිබඳ ව ද දැන සිටීම මෙන් ම ඒවා පරිශීලනය ද ඉතා අගනේ ය.

**කණ්ඩායම 3**

කෝට්ටේ සාහිත්‍ය යුගය

සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණම ය යුගය ලෙස කෝට්ටේ යුගය හඳුන්වාදිය හැකි ය. මෙම යුගයේ සිටි උගතුන් තරගයට මෙන් ග්‍රන්ථකරණයෙහි නියැලී ඇත. එනිසා සාහිත්‍ය කෘති රැසක් ම බිහි වී තිබේ.

| | |
|---|---|
| සව්සත කෙළ | පැමිණි |
| ගුරුවන් දෙරණ | සපැමිණි |
| පිරිසිදු සිල් | ගිහිණි |
| සියල්ලෝ වියතුන්ට | සිළුමිණි |

යනුවෙන් ලොකයේ උගතුන්ට තමා සිළුමිණක් යැයි ෂඩ්භාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් ප්‍රකාශ කළේ තමන් පිළිබඳ ව වූ කීර්තිය ද, අභිමානය ද නිසා ම බව පැහැදිලි ය. උන්වහන්සේ විසින් රචිත ග්‍රන්ථ දෙස බැලීමෙන් ම එය තහවුරු වේ. සැළලිහිණි සන්දේශය, පරෙවි සන්දේශය, කාව්‍යශේඛරය, පඤ්චිකා ප්‍රදීපය, බුද්ධිප්පසාදිනිය යනාදී වටිනා ග්‍රන්ථ රචනා කර ඇත්තේ උන් වහන්සේ ය. වීදාගම මෛත්‍රෙය නාහිමිපාණන් වහන්සේ ද මෙම යුගයේ සිටි වියත් යතිවරයන් වහන්සේ නමකි. උන් වහන්සේගේ ලෝවැඩ සඟරාව අදත් ජනප්‍රිය ග්‍රන්ථයකි. මුල් ම කව්බණ පොත ලෙස මෙය හඳුන්වා දිය හැකි ය. පාලි භාෂාව නොදත් අයට සරල බස්වහරක් යොදාගනිමින් කවියෙන් රචිත මෙම ග්‍රන්ථයෙන් බොහෝ ධර්ම කාරණා ඉගැන්වේ. උන් වහන්සේ විසින් ම රචිත බුදුගුණ අලංකාරය ද සැදැහැගුණ වඩන අගනා පද්‍ය ග්‍රන්ථයකි.

| | |
|---|---|
| කය නම් | අසාර ය |
| බව නම් | භයංකාර ය |
| කියනුව දිවා | රැය |
| කෙරෙම් බුදුගුණ | අලංකාරය |

යනුවෙන් මෙය දිවා රාත්‍රී කීම සඳහා වටිනා පොතක් බව උන් වහන්සේ ම දක්වා ඇත. මේ හැරුණු විට මෙම යුගයේ තවත් බොහෝ ගද්‍ය හා පද්‍ය රචනා දක්නට ලැබේ. කෝකිල සන්දේශය, ගිරා සන්දේශය, හංස සන්දේශය, දහම්ගැටමාලාව, චූලබෝධිවංසය, පැරකුම්බා සිරිත හා ගුත්තිල කාව්‍යය යනු ඉන් කිහිපයකි.

# 09

## විරාම ලක්ෂණ

**නිපුණතාව** : 04 අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 4.2 ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි.

**කාලච්ඡේද** : 04යි

**ඉගෙනුම් පල :**

- විරාම ලක්ෂණ යනු කුමක් දැ'යි නිවැරදි ව ප්‍රකාශ කරයි.
- විරාම ලක්ෂණවල ප්‍රයෝජන විස්තර කරයි.
- විරාම ලක්ෂණ ලේඛනයේ දී නිවැරදි ව යොදා ගනියි.
- නිරවුල් ව හා නිවැරදි ව අදහස් ප්‍රකාශ කිරීම සඳහා විරාම ලක්ෂණ භාවිත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- විරාම ලක්ෂණවලට අදාළ පාඩමේ සීමා දැනගන්න.
- පන්තියට නියමිත විරාම ලක්ෂණවල පෝස්ටරයක් සූදානම් කරගන්න.

**ප්‍රවේශය :**

- "ඔහුට යන්න දෙන්න, එපා මරන්න. ඔහුට යන්න දෙන්න එපා, මරන්න." යන උදාහරණය ඇසුරෙන් විරාම ලක්ෂණවල වැදගත්කම පැහැදිලි කරන්න.

**පාඩම සංවර්ධනය :**

- පන්තියට නියමිත විරාම ලක්ෂණවල පෝස්ටරයක් ප්‍රදර්ශනය කරන්න.
- විරාම ලක්ෂණ සහිත ඡේදයක් ශිෂ්‍යයන්ට ලබා දෙන්න.(ඇමුණුම 1)
- එම ඡේදයේ විරාම ලක්ෂණ ලකුණු කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- පන්තියට නියමිත විරාම ලක්ෂණ පිළිබඳ හඳුන්වා දීමක් කරන්න.
- විරාම ලක්ෂණ නොයෙදූ ඡේද කිහිපයක් ලබා දී විරාම ලක්ෂණ යෙදීමට අවස්ථාව ලබා දෙන්න. (ඇමුණුම 2)

**මූලික වදන් සංකල්ප :**

- තිත, ප්‍රශ්නාර්ථ, විශ්මයාර්ථ, විරාම ලක්ෂණ

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1 විරාම ලක්ෂණ සහිත ඡේදයක්
- ඇමුණුම 2 විරාම ලක්ෂණ නොයෙදූ ඡේද කිහිපයක්

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- විරාම ලක්ෂණ යනු කුමක් දැ'යි නිවැරදි ව නිර්වචනය කිරීම
- විරාම ලක්ෂණවල ප්‍රයෝජන විස්තර කිරීම
- විරාම ලක්ෂණ ලේඛනයේ දී නිවැරදි ව යොදා ගැනීම
- නිරවුල් ව හා නිවැරදි ව අදහස් ප්‍රකාශ කිරීම සඳහා විරාම ලක්ෂණ භාවිත කිරීම

ඇමුණුම 1 විරාම ලක්‍ෂණ සහිත ඡේදය

අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි යන සාහිත්‍ය යුග පිළිබඳ ව පසුගිය වසරේ දී ඉගෙන ගැනීමට ලැබිණි. එම යුගවල සේ ම ඉන් පසු කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ, මහනුවර යන යුගවල දී ද දේශීය සාහිත්‍යය දියුණු වූ ආකාරය අපට දැකගත හැකි වේ. එදා සාහිත්‍යකරණයෙහි බොහෝ සෙයින් යෙදී සිටියෝ භික්ෂූන් වහන්සේලා ය; එසේ නොමැතිනම් භික්ෂූන් වහන්සේලා ඇසුරු කළ උගත් ගිහි පිරිසයි. පාසල් අධ්‍යාපනයක් නො ව පන්සල් අධ්‍යාපනයක් එදා පැවතීම ඊට හේතුව විය. ධර්මය ඇසුරු කරමින් අධ්‍යාපනය ලැබූ මේ සාහිත්‍යධරයන් අතින් බිහිවූ පොත පත සියල්ල බුද්ධ ධර්මයට සමගාමී විය. ඔවුන්ගේ වස්තුවිෂය වූයේ බෞද්ධාගම හෝ ඊට සම්බන්ධ මාතෘකාවන් ය. අපේ සිංහල සාහිත්‍යය හා බෞද්ධ සාහිත්‍යය දෙකක් නොව එකක් බවට පත් වන්නේ මේ නිසයි. ඉහත කී යුගවල බිහි වූ ගද්‍ය පද්‍ය කෘති ප්‍රමාණය විශාල ය.

ඇමුණුම 2 විරාම ලක්‍ෂණ නොයෙදූ ඡේද

පාලි ජාතකට්ඨකථාව සිංහලයට නැඟීමෙන් රචිත කෘතියකි මෙය මහජනතාව අතර කෙතරම් ගෞරවාදරයට පාත්‍ර වූවා ද යන්න පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ලෙස හැඳින්වීමෙන් ම පැහැදිලි වේ අප බුදුරජාණන් වහන්සේ පාරමීදම් පුරන සමයේ හෙවත් බොධිසත්ත්ව අවධියේ දී උපන් ආත්මභාව පිළිබඳ මෙහි විස්තර වේ ධර්ම දේශනා ශෛලිය උපයෝගී කරගනිමින් රචිත මෙහි සඳහන් කතාවස්තු ප්‍රමාණය 547කි ආසන්න වශයෙන් ගෙන කතුවරයා මෙම ග්‍රන්ථය පන්සිය පනස් ජාතක පොත යනුවෙන් නම් කර ඇති බව පෙනේ එදා මෙන් ම අදත් විහාරස්ථානවල මෙම ග්‍රන්ථය එක් අයකු කියවද්දී අනෙක් අය සාධුකාර දෙමින් අසා සිටීම සිරිතක් ව පවතියි

(10)

# ප්‍රායෝගික ලේඛන

**නිපුණතාව** : 05 ජීවන අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 5.1 නිරවුල් හා පැහැදිලි අදහස් ඇති ව ලේඛනයේ යෙදෙයි.

**කාලච්ඡේද** : 06යි

**ඉගෙනුම් පල :**

- මූලික අංග සහිත ව පෞද්ගලික ලිපියක් නිවැරදි ව ලියයි.
- මූලික අංග ඇතුළත් ව රාජකාරි ලිපියක් ලියයි.
- මූලික කරුණු ඇතුළත් ව වාර්තාවක් සකස් කරයි.
- මූලික අංග සහිත ව ආරාධනා පත්‍රයක් නිර්මාණය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- පෞද්ගලික ලිපි, රාජකාරි ලිපි, වාර්තා හා ආරාධනා පත්‍ර ඉගැන්වීම සඳහා එක කාලච්ඡේදය බැගින් යොදා ගන්න. ඉතිරි කාලච්ඡේද දෙක පුහුණුව හා ඇගයීම සඳහා යොදා ගන්න
- පෞද්ගලික ලිපියක, රාජකාරි ලිපියක, වාර්තාවක හා ආරාධනා පත්‍රයක ආකෘතිය බැගින් සකස් කර ගන්න. (ඇමුණුම 1,2,3,4)

**ප්‍රවේශය :**

- අංග සම්පූර්ණ පෞද්ගලික ලිපියක්, රාජකාරි ලිපියක්, වාර්තාවක් ආරාධනා පත්‍රයක් ප්‍රදර්ශනය කර වැදගත්කම පිළිබඳව සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනය :**

- පෞද්ගලික ලිපියක, රාජකාරි ලිපියක, වාර්තාවක හා ආරාධනා පත්‍රයක ආකෘති ප්‍රදර්ශන කරන්න.
- පෞද්ගලික ලිපි, රාජකාරි ලිපි, වාර්තා හා ආරාධනා පත්‍ර අංග සම්පූර්ණ ව ලිවීමට උපදෙස් දෙන්න.
- තෝරා ගත් ශිෂ්‍යයන්ගේ නිර්මාණ කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී එහි මූලික අංග හා අවශ්‍යතා පිළිබඳ සාකච්ඡා කරන්න.

**මූලික වදන් සංකල්ප :**

- පෞද්ගලික ලිපි, රාජකාරි ලිපි, වාර්තා හා ආරාධනා පත්‍ර

**ගුණාත්මක යෙදවුම් :**

- පෞද්ගලික ලිපියක්, රාජකාරි ලිපියක්, වාර්තාවක්, ආරාධනා පත්‍රයක්

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- මූලික අංග සහිත ව පෞද්ගලික ලිපි ලිවීම
- මූලික අංග ඇතුළත් ව රාජකාරි ලිපි ලිවීම
- මූලික කරුණු ඇතුළත් ව වාර්තාවක් සැකසීම
- මූලික අංග සහිත ව ආරාධනා පත්‍රයක් නිර්මාණය කිරීම

ඇමුණුම 1 පෞද්ගලික ලිපිය

2018.12.28
නිවසේ දී

බුදු සරණයි.!

මා ආදරණීය අම්මා වෙත,

මේ මාසේ 06 වෙනිදා අපට නිවාඩු ලැබෙන නිසා සිතට දැනෙන සතුට අපමණයි. මා එන තුරු අම්මා මග බලා සිටින බව මම දනිමි. පිරිවෙන් අවසාන විභාගය ඉහළින් ම සමත් වූ නිසා පවුලේ සියලු දෙනා සතුටෙන් ඇති නේද? නංගි සති අන්තේ ආවා ද? තාත්තාගේ අසනීප තත්ත්වය දැන් හොඳයි ද? මම තව සතියකින් විතර ගෙදර එනවා. ගෙදර සියලු දෙනා මතක් කළ බව කියන්න. සියලු දෙනාට දළදා සමිඳු පිහිටයි.

මෙයට,

පොඩි හාමුදුරුවෝ

ඇමුණුම 2 රාජකාරි ලිපිය

පුබුදු තිලකරත්න,
ලේකම්,
ප්‍රජා සංවර්ධන සමිතිය,
බගවන්කුලම,
දඹුල්ල.
2017.10.08

අඩවි වන නිලධාරිතුමා,
දඹුල්ල.

මහත්මයාණෙනි.

<u>ප්‍රදේශවාසී ජනතාව වන අලි උවදුරින් බේරා ගැනීම.</u>

කලක පටන් දඹුල්ල ප්‍රදේශවාසීන්ට වන අලින්ගෙන් වන බාධා අපමණ ය. මිනිසුන්ගේ එදිනෙදා කටයුතුවලට හා දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට මෙය බලවත් තර්ජනයකි. ඔවුන් දිවා රෑ කල් ගෙවන්නේ කවර මොහොතක අලි උවදුරට ගොදුරු වේදැයි යන බියෙනි. මෙම ව්‍යසනයෙන් මිදීමට ගම්වාසීන් විසින් සම්මත කරගත් යෝජනා කිහිපයක් පහත දැක්වේ. ආහාර සොයමින් ගම් වදින අලින්ට ආහාර, තෘණ වර්ග, ජලය පිරි කලාප ස්ථාපිත කිරීම. මිනීමරු අලි හඳුනා ගෙන උන් වෙනුවෙන් විශේෂ ක්‍රියා මාර්ගයක් ගැනීම, මෙම යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන මෙන් කාරුණික ව ඉල්ලා සිටිමි.
ස්තුතියි,
මෙයට,
විස්වාසී,
......................
අස්සන
(පුබුදු තිලකරත්න.)

ඇමුණුම 3  වාර්තාව

**හඳුනා ගැනීම් හා වැටලීම් පොලිස් ස්ථානාධිපතිවරයකු අල්ලස් දැලේ**

දෙසැම්බර් 21, 2018

බම්බලපිටිය පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ ස්ථානාධිපති විසින් වැඩ තහනමට ලක්ව සිටින පොලිස් නිලධාරියකුගෙන් නැවත සේවයේ පිහිටුවීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීමට ඒ වෙනුවෙන් රුපියල් 150,000ක මුදලක් ඉල්ලා එය රුපියල් ලක්ෂයකට අඩුකර ඉන් රුපියල් 50,000ක මුදලක් අල්ලස් වශයෙන් ඉල්ලා එම මුදල 2018-12-19 දින ලබා ගත් අවස්ථාවේ දී, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

ඇමුණුම 4  ආරාධනා පත්‍රය



11

## නිවැරදි උච්චාරණයෙන් යුතු කියවීම

**නිපුණතාව** : 06 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 6.1 නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.

**කාලච්ඡේද** : 06යි

**ඉගෙනුම් පල :**

- විරාම ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් නිවැරදි ව ගද්‍ය පාඨ කියවයි.
- හඬ පාලනයෙන් යුතු ව පැහැදිලි ව ගද්‍ය කියවයි.
- හඬ පාලනයෙන් යුතු ව තාලානුකූල ව පද්‍ය ගායනා කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- ලෝවැඩ සඟරාව (කවි හතරක්), හීන්සැරය ප්‍රබන්ධ කතාවෙන් කොටසක් සූදානම් කර ගන්න.

**ප්‍රවේශය :**

- ලෝවැඩ සඟරාවේ කවි කිහිපයක් සුදුසු ක්‍රමවේදයක් මගින් ශ්‍රවණය කිරීමට සලස්වන්න.

**පාඩම සංවර්ධනය :**

- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් දෙකකට වෙන් කරන්න.
- කණ්ඩායම් දෙකට පෙළ පොතේ ඇතුළත් ඡේදය හා කවි පන්තිය බෙදා දෙන්න.
- ගුරුභවතා සහකියවීම තුළින් කියවීම හුරු කරන්න.
- ඇමුණුම 01හි ඇතුළත් ගද්‍ය පද්‍ය කොටස් ලබා දෙන්න.
- එම ගද්‍ය පද්‍ය පාඨ අධ්‍යයනයට විනාඩි පහක් ලබා දෙන්න.
- ඒ ඒ කණ්ඩායම්වලට කියවීම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- කියවීමේ මට්ටම තක්සේරු කර කියවීම වැඩි දියුණු කර ගැනීම සඳහා උපදෙස් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 01හි ඇතුළත් ගද්‍ය පද්‍ය කොටස්

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- විරාම ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් නිවැරදි ව ගද්‍ය පාඨ කියවීම
- හඬ පාලනයෙන් යුතු ව පැහැදිලි ව ගද්‍ය කියවීම
- හඬ පාලනයෙන් යුතු ව තාලානුකූල ව පද්‍ය ගායනා කිරීම

ඇමුණුම : 01

ගද්‍ය

සිංහල සාහිත්‍යයේ වර්ගීකරණයක් වෙතට අපගේ අවධානය යොමු කළ විට එහි පුළුල් බව පසක් වෙයි. මේ පිළිබඳ අපේ බොහෝ වියතුන් කර ඇති පර්යේෂණ බොහෝය. පුඤ්චි බණ්ඩාර සන්නස්ගලගේ සිංහල සාහිත්‍යවංශය, මාර්ටින් වික්‍රමසිංහගේ සාහිත්‍යෝදය කතා, චාල්ස් ගොඩකුඹුරගේ සිංහල සාහිත්‍යය, කොත්මලේ අමරවංශ හිමියන්ගේ සිංහල සාහිත්‍ය ලතා, ආනන්ද කුලසූරියගේ සිංහල සාහිත්‍යය 1, 2, 3, 4 කෘති, කොටහේනේ පඤ්ඤාකිත්ති හිමියන්ගේ සාහිත්‍ය කතා වැනි කෘති ඒ සඳහා දැක්විය හැකි වැදගත්ම නිදසුන් කීපයකි. මොවුන්ට අනුව සිංහල සාහිත්‍යයේ අංගෝපාංග රාශියකි. එනම් විනය ග්‍රන්ථ, ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ, බුදුගුණ වර්ණනා, ජාතක සාහිත්‍යය, වංසකතා, සන්දේශ කාව්‍ය, උපදේශාත්මක කාව්‍ය, ප්‍රශස්ති හා හටන් කවි, ප්‍රේම කාව්‍යය, ජනකාව්‍ය, ව්‍යාකරණ, නිඝණ්ඩු, ගී කාව්‍ය, මහා කාව්‍ය, ඡන්දෝලංකාර, ශතක කාව්‍ය, ශෘංගාර පද්‍ය, මාල පද්‍ය, නවකතා, කෙටිකතා, නාට්‍ය, සිනමා ආදි ලෙස සරල වර්ගීකරණයක් කිරීමෙන් මේ පිළිබඳ අවබෝධයක් ලද හැකිය.

මෙම සාහිත්‍ය ගමන්මග සොයා යන විට හමු වන සන්ධිස්ථාන රාශියකි. විශේෂයෙන් මෙවන් මහා සාහිත්‍යයක් බිහිවන්නට සුදුසු ලෙස හෙළ බස ගොඩනැගෙන්නේ, ක්‍රි. පූ. තුන්වන සියවසේ බෞද්ධ ධර්මදූතාගමනයෙනි. සිංහලයාගේ ඉතිහාසය ඊටත් බොහෝ ඈත අතීතයට ගමන් කළ ද වහරන බසෙහි දියුණු ලේඛනයක් පැවැති බවට සාක්ෂ්‍ය මඳ ය. එබැවින් සිංහල අක්ෂර කලාව බ්‍රාහ්මී අක්ෂර මාලාවේ විකාශනයකි.

සිංහල අක්ෂර වර්තමාන ස්වරූපය ගනු ලැබූයේ ක්‍රි. ව. අටවන සියවස පමණ කාලයේ දී ය. බ්‍රාහ්මී අක්ෂරයෙන් ඇරඹි අපගේ ලේඛන කලාව සෙල්ලිපි මාධ්‍ය වෙමින් අවුරුදු දහසක තරම් කාලයක් විකාශනය වී තිබෙයි. පැරණිතම ලේඛනය උත්තිය රජුගේ කාලයට අයත් ''ගමන් උති මහ රජ'' යනුවෙන් මිහින්තලේ කණ්ඨක චේතියෙන් හමුවන ලේඛනයයි. ක්‍රි. පූ. පළමුවන සියවසෙහි සිදු වූ හෙළටුවා ග්‍රන්ථාරූඪකරණයට ද භාවිත වූයේ මෙම බ්‍රාහ්මී අක්ෂර බව කල්පනා කළ හැකිය.

සිංහලයන් බුදුසමය වැළඳ ගැනීම සිංහල සාහිත්‍යෝන්නතියට හේතු විය. මාර්ටින් වික්‍රමසිංහයන් මේ පිළිබඳ දක්වන අදහස ඉතා වැදගත්ය. සසර දුකින් ගැළවිය හැක්කේ ප්‍රඥා ලාභයෙන් බවත්, භික්ෂූන් බුදුදහම පොදු ජනයාට උගන්වන්ට වෑයම් කිරීමත්, සංඝාරාමය භාෂාව හා ධර්ම ශාස්ත්‍ර උගන්වන ශාස්ත්‍ර ශාලාව බවට පත්වීමත්, බුදුසමය මුහුණ දුන් ඇතැම් අභියෝග හමුවේ ඒවාට මුහුණ දීමේ පියවරක් ලෙසිනුත් මුල් කාලයෙහි බුදුසමය හා සාහිත්‍යය එකට වැඩීම ආරම්භ විය. මෙහි සමාරම්භය ලෙස මාගධී බසින් පැමිණි බුද්ධ ධර්මය හෙළ බසින් සැකසුණු හෙළටුවාවන් දැක්විය හැකිය. "මගධ බසින් වැටෙමින් ආ බුදු කැලි අටුවා හෙළදිව් ඇජුරො හෙළ බසින් තුබූහ" යනුවෙන් දම්පියා අටුවා ගැටපද කෘතියෙහි දැක්වෙන අදහසින් විශද කෙරෙන්නේ හෙළටුවා සාහිත්‍යයක් මෙරට ඇදුරන් විසින් බිහි කළ බවයි. එහෙත් මෙම හෙළටුවා සියල්ල පසුකාලීනව අවිද්‍යාමාන වීමෙන් අපගේ මුල් ම සහ අදීන සාහිත්‍යය අපට අහිමි විය.

හෙළටුවාවන් අභාවයට යෑමට හේතුව ලෙස ක්‍රි. ව. පස්වන සියවසෙහි සිදු වූ බුද්ධඝෝෂ හිමියන්ගේ පාලි අටුවාකරණය දැක්විය හැකිය. එය ලෝකය වෙත හඳුන්වා දුන්නේ වී නමුදු ඉන් පසු ලංකාවේ පාලි සාහිත්‍යයක උදාව සිදු වීම නතර කළ නොහැකි වීය. මේ අතරෙහි හයවන සියවසෙහි පළමු වන අග්බෝ රජුගේ කාලයෙහි සක්දාමල, අසක්දාමල, දැමිය, බැබිරිය, දළබිසෝය යනාදී කවීන් රාශියක් සිටි බව මහාවංශයෙහි දැක්වෙතත් ඔවුන් කළ කාව්‍ය රචනා කවරේ ද යන්න හමු නොවේ. හත්වන අටවන සියවස්හි සීගිරියෙහි ලියැවී ඇති කුරුටු ගී සමුච්චය පෙන්වා දෙන්නේ කවිය පිළිබඳ පැවැති උනන්දුවයි. ඒ අනුව දහස් ගණන් කවි පොත් ලියැවෙන්නට ඇති මුත් ඒ සියල්ල පාලි සාහිත්‍යයේ මහිමය ඉදිරියේ වැළලී ගොසිනි. අනුරාධපුර රාජධානිය අවසන අපට හමු වන සිඛවළඳ විනිස, දම්පියා අටුවා ගැටපදය හා සියබස්ලකර දැනට ශේෂ වූ විද්‍යමාන ග්‍රන්ථ වෙයි.

**පද්‍ය**

රන් යහනේ සැතපෙන කල බිසවුන්      ට
පුන් සඳ මඬල අහසින් ඒ යහන පි      ට
රන් කඳ ලෙසින් වැඩියා සුදොවුන් ළඟ      ට
තුන් ජාමෙට පෙනුණා සඳ මඬල ම      ට

දණක් පමණ මල් අතුරපු දිව යහ      නේ
පමණක් බිසව් සැතපෙන කල දුටු සී      නේ
මැණිකක් දකින කොට ගැබ ඇතුළට වැදු      ණේ
මොන මොන දෙයක් දෝ නො දැනෙයි සුවාමි      නේ

මහමායා සැතපෙන කල මල් යහ      නේ
අහසින් රිදී පරුවතයක් එම යහ      නේ
දහසක් බිසෝවරු වට කර මුර සිටි      නේ
මහ රජු හට සැළ කෙරුවා මෙම සී      නේ

නේරංජනන් ගංගාවේ සුදු වැල්      ලේ
නේරංජනේ ඉස්නානේ නෑවිල්      ලේ
පැන්නා වටකරට සුවඳට මන ලොල්      ලේ
පෙන්නා දිදී දරු සීනය පෙළින් පෙ      ළේ

දෙනෝ දහක් අඟනෝ මට මල් නෙළු      වා
අනෝතත්ත විල මැද යහනක ඉඳු      වා
කන්‍යා ලියෝ දෙදෙනෙක් පැන් නෑවෙව්      වා
අනෝතත්ත විල මම සීනෙන් දුටු      වා

සු දු සක ලෙසට ඇත් පැටියෙක් විත් යහ      නේ
සු දු සොඬ ටිකෙන් මගෙ බඩ පිරිමදිති අ      නේ
සු දු යම් දෙයක් සිදු වෙයි මම දුටු සී      නේ
සු ද සුන් නිරිඳුනේ මොක දැයි ඔය සී      නේ

පි රි සිදු බමුණු ගෙන්නා මහ රජ එදි      නේ
කි රි බත් කවා දෙවනුව ඇසුවා සී      නේ
නි රි ඳුනි අපල නැත කාටත් ඔය සී      නේ
පි රි සිදු බෝසතෙක් උපදී ලොවට අ      නේ

සුද්දෝදන නරනිඳුනේ අසනව      ට
නපුරු සීන නො පෙනෙයි පින් කළ අය      ට
පෙනුණු සීනෙ දරු සීනේ ම යි ඔබ      ට
පින් ඇති බෝසතෙක් උපදිය තුන් ලොව      ට

**12**

## අර්ථාවබෝධය

**නිපුණතාව** : 06 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 6.2 අර්ථාවබෝධය සඳහා නිශ්ශබ්ද ව කියවයි.

**කාලච්ඡේද** : 04යි

**ඉගෙනුම් පල :**

- ගද්‍ය පාඨ අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.
- අර්ථාවබෝධය සඳහා වාග් මාලාව වර්ධනය කර ගනියි.
- කියවා ග්‍රහණය කරගත් කරුණු ඉදිරිපත් කරයි.
- ඵලදායී ජීවන පුරුද්දක් ලෙස කියවීමේ හුරුව ලබයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- අනගාරික ධර්මපාලතුමා හා සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගේ චරිත කතා සූදානම් කර ගන්න.

**ප්‍රවේශය :**

- පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර මාහිමිපාණන් වහන්සේගේ චරිත කතාවෙන් කොටසක් නිශ්ශබ්ද ව කියවන්නට අවස්ථාව ලබා දී අර්ථාවබෝධය අපහසු වචන සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න. (ඇමුණුම 1)
- අර්ථය පැහැදිලි කර දෙන්න.

**පාඩම සංවර්ධනය :**

- ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට සුදුසු පරිදි වෙන් කරන්න.
- එක කණ්ඩායමකට සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගේ චරිත කතාව ද අනෙක් කණ්ඩායමට අනගාරික ධර්මපාල තුමාගේ චරිත කතාව සහිත කියවීම් පත්‍රිකා බෙදා දෙන්න. (ඇමුණුම 2)
- අර්ථාවබෝධය සඳහා නිශ්ශබ්ද ව කියවන්නට උපදෙස් දෙන්න.
- අර්ථාවබෝධය අපහසු වචන සටහන් කිරීමට හා අර්ථය ලිවීමට උපදෙස් දෙන්න.
- එම අර්ථ සහිත වචන ඩිමයි කොළවල සටහන් කොට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායම් දෙකට ම අවස්ථාව ලබා දෙන්න.
- අර්ථ අඩු ලුහුඩු තැන් පෙන්වා දී සම්පූර්ණ අර්ථය කියා දෙන්න.
- එවැනි චරිත කතා කියවීමට පුස්තකාලයට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර මාහිමිපාණන් වහන්සේගේ චරිත කතාව
- සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගේ චරිත කතාව
- අනගාරික ධර්මපාලතුමාගේ චරිත කතාව සහිත කියවීම් පත්‍රිකා

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- ගද්‍ය පාඨ අර්ථාවබෝධයෙන් යුතු ව කියවීම
- අර්ථාවබෝධය සඳහා වාග් මාලාව වර්ධනය කර ගැනීම
- කියවා ග්‍රහණය කරගත් කරුණු ඉදිරිපත් කිරීම
- ඵලදායී ජීවන පුරුද්දක් ලෙස කියවීමේ හුරුව ලැබීම

ඇමුණුම 1

**පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර මාහිමිපාණන් වහන්සේ**

ලක්වැසි භික්ෂූන්ට නායකත්වයට අදාළ මහාථෙර, මහාසාමි, සංඝරාජ යන තනතුරු රාජානුග්‍රහයෙන් පත්කිරීම ඇරඹුණේ පොළොන්නරු රාජධානි සමයේ දීය. පළමුවන මහපැරකුම්බා රජු (වර්ෂ 1153 - 1186) පොළොන්නරුවේ ලතා මණ්ඩපයේ දී සියලු භික්ෂූන් මැද දිඹුලාගල මහා කාශ්‍යප තෙරණුවන්ට මහාස්ථවිර පදවිය පිරිනමා ඇත. දිඹුලාගල මාහිමියෝ අඛණ්ඩ ව පැවැති ලක්දිව සඟ පරපුරේ 136 වැනි මහතෙරණුවෝ වෙති. අනුසාමි යනුවෙන් භික්ෂූන්ගේ දෙවන නායක තනතුරක් ද, අධ්‍යාපන කටයුතු සිදුකෙරුන මූලායතන සඳහා නායක තනතුරු ද තිබිණි. මහාසාමි හෙවත් මාහිමි, මහාථෙර, මූලායතනාධිපති තනතුරු ආදිය පත්කළ යුතු ආකාරය පිළිබඳ නිර්දේශ දඹදෙණි කතිකාවතේ ඇතුළත් ය. එම කතිකාවතේ එන විස්තරවලින් පැහැදිලි වන්නේ මාහිමි තනතුරට අමතර ව ග්‍රාමවාසී මහාථෙර, අරණ්‍යවාසී මහාථෙර යනුවෙන් තනතුරු දෙකක් ද එකල පැවැති බවයි. නිවැරැදි පිළිවෙත් ඇතිව මැදිහත් සිතින් කටයුතු කරන්නට හා සෙසු සංඝයා හික්මවීමට සමත් භික්ෂූන් තෝරාගෙන මහරජු ලවා වන්දවා ග්‍රාමවාසී භික්ෂූන්ගේ මහා ස්ථවිර පදවියට පත්කරගත යුතු වෙයි. මහා ස්වාමි තනතුර පුරප්පාඩු වූවොත් මහතෙර දෙනමගෙන් එක් නමක් එම තනතුරට තෝරාගත යුතු වෙයි.

මහනුවර රාජ්‍ය පාලන කාලයේ දී අස්ගිරි - මල්වතු මහා විහාරවල නායක තනතුර නම් කර තිබුණේ ගණනායක නමිනි. 1753 වසරේ උපසම්පදාව යළි පිහිටුවීමෙන් පසු කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් වැලිවිට ශ්‍රී සරණංකර මාහිමියන් සංඝරාජ තනතුර පත්කරන්නට යෙදුණි. වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියෝ ලක්දිව මහා විහාර භික්ෂු වංශයේ නායක තනතුර දැරූ 177 වැනි මහාතෙරණුවෝ වෙති. අස්ගිරි - මල්වතු මහා විහාර දෙකට මහානායක පදවි පත්කිරීම ද රජු විසින් සිදුකරන ලදි. එම පදවිය උපසඟරජ තනතුර වශයෙන් සැලකුණි. රජතුමා එසේ කළේ විහාර දෙකම සම තත්ත්වයක් උසුලන බැවිනි. අස්ගිරි - මල්වතු වශයෙන් භාවිතයට පැමිණියේ පිළිවෙළින් වනවාසී හා ග්‍රාමවාසී සම්ප්‍රදායන් බව පෙනේ. රජතුමා විසින් දිවයින පුරා විහාරස්ථාන 2400 බැගින් මහා විහාරවලට බෙදා දෙනු ලැබීය. දළදා වහන්සේගේ ආරක්ෂාවත්, භික්ෂූන්ගේ හා පන්සල්වල පාලනයත් ඒ හේතුවෙන් ක්‍රමවත් විය. වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියන්ගෙන් පසු සංඝරාජ පදවිය පත්කෙරුණේ නැත. එම තනතුරේ අනුප්‍රාප්තික බලය උභය මහා විහාරවල මහනාහිමිවරුන්ට ලැබිණි.

1815 දී ඉංග්‍රීසීන් සිංහල රාජ්‍යය අත්පත් කරගන්නා අවස්ථාව වනවිටත්, අස්ගිරි මල්වතු මහානායක තනතුරු ක්‍රියාත්මක ව පැවතුණි. ගිවිසුම අත්සන් කිරීමෙන් පසු මාර්තු 10 වැනි දින ඩොයිලි මහනාහිමිවරුන් මගුල් මඩුවට වැඩම කරවාගෙන බුද්ධ ශාසනය ආරක්ෂා කරන බව පොරොන්දු වී මහනායක පදවි නැවත පත්කළ බව ඔහුගේ දිනපොතේ සඳහන් වෙයි. පෙර රජ සිරිත අනුග මනය කරන බව පැවසූ ඉංග්‍රීසි ආණ්ඩුව එතැන් සිට විහාරාධිපති තනතුරු පත්කිරීම පවා සිදුකොට ඇත. ආණ්ඩුවට එරෙහි වූ නාහිමිවරුන්ගේ තනතුරු ඉවත් කළ අවස්ථා ද දක්නට ඇත. ක්‍රිස්තියානි මිෂනාරිවරුන්ගේ බලපෑම් හේතුවෙන් ඉංග්‍රීසි පාලකයෝ බුද්ධාගම සම්බන්ධ රජයේ වගකීමෙන් මිදෙන්නට සැලසුම් කළහ. 1845 කොල්වින් කැමල් ආණ්ඩුකාරයා උභය මහා විහාරයේ භික්ෂූන් කැඳවා බුද්ධාගම ආරක්ෂා කිරීමට සැලසුමක් හදන ලෙස දැනුම් දුනි. ඒ අනුව තැනූ ව්‍යවස්ථාවට අස්ගිරි මහා විහාරය සම්බන්ධ වූයේ නැත. නායක තනතුරු පත්කිරීමට ගිහියන් සම්බන්ධ කරගැනීම ගැන මතභේදයක් ඇතිවූ බව සිතිය හැක. පසුව මහා විහාර දෙකෙහි එකඟත්වයෙන් ව්‍යවස්ථාවක් සකස් කොට ඇත. එය ජිනශාසනෝපකාර සමාගම යනුවෙන් හැඳින්වුණි. 1853 අප්‍රේල් 07 වැනි දා නිකුත් කළ අංක 152 දරන රාජාඥව මගින් ශ්‍රී දළදා වහන්සේ පිළිබඳ භාරකාරත්වය හා නායක ධානාන්තර පත්කරගැනීම අස්ගිරි හා මල්වතු මහා විහාරවල භික්ෂූන් වෙත පවරා දී ඇත. ඉංග්‍රීසි ආණ්ඩුව සිදුකළේ මහනායක පදවිය පිළිබඳ පත්කිරීම අනුමත කිරීම පමණි.

වර්ෂ 1853 රාජාඥවට අනුව 1853 මැයි 11 වැනි දින අස්ගිරි විහාරයේ පොහොය සීමාවට රැස්වූ මහා සංඝයා වහන්සේ 75 නමක් පස්නමකගේ විනිශ්චය යටතේ මහනායක හා අනුනායක පදවි සඳහා දෙනමක් පත්කරගෙන තිබේ. මහනායක පදවියට පත් යටවත්තේ ස්වර්ණජෝති මාහිමි වර්ෂ 1857 සෙසු සංඝයා වහන්සේගේ අනුමැතියෙන් තොරව හිතු මනාපයට කටයුතු කිරීම ගැන විරෝධය පළකළ අනුනායක හිමි මහනුවර කච්චේරියට ඒ පිළිබඳ ව පැමිණිල්ලක් ඉදිරිපත් කොට ඇත. මහනුවර දිසාපති ආර්. පෝවර් එයට විසඳුම් ලෙස ශාසනයේ පැවැත්ම සඳහා කතිකාවතක් සකස් කරගන්නැයි 1857 ජුලි 15 වැනි දින උපදෙස් ලබා දී තිබේ. ඒ අනුව අස්ගිරි මහා විහාරයේ භික්ෂූහු මහා විහාර සම්ප්‍රදාය පවත්වාගෙන යැමට අවශ්‍ය ධර්මානුකූල මූලධර්ම ඇතුළත් පරම ධර්ම කතිකාවත සම්මත කරගත්හ. කුදුසික විනය පොතෙහි සඳහන් පරිදි විනය හා ශාසනික කටයුතු සඳහා විසිනමකගෙන් යුත් සංඝ සභාවක් ද සම්මත කර එයට රාජූපස්ථානීය පරමධර්ම සභාව යනුවෙන් නම් කර ඇත. මහානායක හා අනුනායක තනතුරු පත්කරගන්නා අයුරු එම කතිකාවතේ දැක්වෙයි.

ඇමුණුම 2

## සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා

1931 ප්‍රථම අධ්‍යාපන ඇමැති, නිදහස් අධ්‍යාපනයේ පියා, ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා ප්‍රෞඪ ඉතිහාසයක් උරුම වූ ජාතියක ස්ව අයිතිවාසිකම් යුග ගණනාවකට එනම් නූපන් පරපුරට පවා දායාද කිරීමේ අමිල මෙහෙවරක සමාරම්භක නිර්මාතෘවරයාණෝ දේශයේ පිනෙන් පහළ වූ නිදහස් අධ්‍යාපනයේ පියා යන විරුදාවලියෙන් පිදුම් ලත් ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගර මැතිතුමා අම්බලන්ගොඩ ප්‍රදේශයේ රන්දොඹෙහි දී 1884 ඔක්තෝබර් 13 වැනි දින උපත ලදහ.

අම්බලන්ගොඩ වෙස්ලියන් උසස් විදුහලට ඇතුළත් කරන ලද කන්නන්ගර ශිෂ්‍යයා ඉගෙනීමෙහි අති විශිෂ්ටයකු බව කුඩා කල සිට ම ප්‍රදර්ශනය කළේය. කන්නන්ගර ශිෂ්‍යයාගේ ජීවිතයේ ස්වර්ණමය අවස්ථාව 1897 වෙස්ලි විද්‍යාලයේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී උදා විය. මෙම ත්‍යාග ප්‍රදෝනෝත්සවයට ආරාධිත විශේෂ අමුත්තා වශයෙන් පැමිණි රිච්මන්ඩ් විද්‍යාලයේ විදුහල්පති ජේ. එච්. ඩැරල් මැතිතුමන්ගේ අවධානය ත්‍යාග රැසක් හිමිකරගත් දොළොස් වියැති කළුපැහැති ළමයකු කෙරෙහි යොමු විය. ඒ ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගර සිසු දරුවාය. ත්‍යාග ප්‍රදානය අවසානයේ දී විදුහල්පති ඩැරල් මැතිතුමන් කන්නන්ගර ශිෂ්‍යයා රිච්මන්ඩ් විදුහලේ ශිෂ්‍යත්ව පරීක්ෂණයට ඉදිරිපත් කිරීමට උපදෙස් දුනි. මෙම ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් ඉතා විශිෂ්ට ලෙස සමත් වූ ඔහුට රිච්මන්ඩ් විදුහලේ සියලු පහසුකම් සහිත ව ගාස්තු ගෙවීමකින් තොරව අධ්‍යාපනය ලබා ගැනීමේ අවස්ථාව උදා විය.

කන්නන්ගර ශිෂ්‍යයා තුළ වූ උදාරතර පෝෂණයට එවකට රිච්මන්ඩ් විද්‍යාලයේ ජේ. එච්. ඩැරල් මැතිතුමන් සැම අතින් ම කාරුණික සහාය ලබාදීමෙන් ඔහු අධ්‍යාපනයේ විශිෂ්ටයකු වීමට අප්‍රතිහත ධෛර්යෙන් හා අධිෂ්ඨානයෙන් කටයුතු කළේ ය. ඒ අනුව කේම්බ්‍රිජ් දේශීය කනිෂ්ඨ පරීක්ෂණයෙන් ගණිතයට විශිෂ්ට සාමර්ථ්‍යයක් ඇතුළුව දෙවැනි පන්තියේ ගෞරව සාමර්ථයක් හෙතෙම ලබා ගත්තේ ය. සාමාර්ථය ලත් 106 දෙනා අතර කුසලතාව මත නව වැන්නා ලෙස ඔහු ස්ථාන ගත වූ බව සඳහන් වේ.

වර්ෂ 1902 පවත්වන ලද කේම්බ්‍රිජ් ජෝෂ්ඨ පරීක්ෂණයෙන් අංක ගණිතය හා ගණිතය විෂයයන්ට විශිෂ්ට සාමාර්ථයන් සහිත ව ලංකාවේ පමණක් නොව මුළු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය තුළ සමත් වූවන්ගේ ලේඛනයේ පළමුවන ස්ථානයට ඔහු පත්විය. මේ අනුව කේම්බ්‍රිජ් දේශීය පරීක්ෂණයෙන් විශිෂ්ටතමයා ලෙස සමත් වීමේ භාග්‍යය ලත් කන්නන්ගර ශිෂ්‍යයාට මහජන උපදේශක අධ්‍යක්ෂගේ ත්‍යාගය ද හිමි විය. 1904 දී විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව පරීක්ෂණයට පෙනී සිටි ක්‍රිස්ටෝපර් කන්නන්ගර හත්වැනියා ලෙස සමත් වූ අතර ඉංග්‍රීසි රචනයට ඉහළ ම ලකුණු ලබා ගත්තේය. එහෙත් ඔහුට ශිෂ්‍යත්වය දිනා ගැනීමට නොහැකි විය.

යහපත් මනසකට නිරෝගී කාය ශක්තියක අවශ්‍යතාව ප්‍රදර්ශනය කරමින් එදා කන්නන්ගර ශිෂ්‍යයා රිච්මන්ඩ් විද්‍යාලයීය ක්‍රිකට් කණ්ඩායමේ සාමාජිකයකු ලෙස සක්‍රීය ව සහභාගී විය. ඉතා විශිෂ්ට පන්දු රකින්නකු වූ ඔහු ආරම්භක පිතිකරුවාද විය. 1904 වර්ෂයේ පවත්වන ලද රිච්මන්ඩ් - මහින්ද ප්‍රථම විද්‍යාලයාන්තර ක්‍රිකට් ක්‍රීඩා තරගයේ රිච්මන්ඩ් කණ්ඩායමේ නායකත්වය දැරීමේ භාග්‍යය ද ඔහුට උදා විය.

විද්‍යාලයීය සාහිත්‍ය සංගමයේ සක්‍රීය සාමාජිකයකු වූ කන්නන්ගර සමාජ විද්‍යා සංගමයේ සහ නේවාසික ශිෂ්‍ය සාහිත්‍ය සමාජයේ ද, සාමාජිකයකු ලෙස කටයුතු කළේ ය. ඉතා දක්ෂ විවාද ශක්තියකින් හෙබි ඔහු තර්කානුකූලව හා චිරාත්මක ව කරුණු ඉදිරිපත් කිරීමේ අති දක්ෂයෙක් විය. එපමණක් නොව විදුහල්පති ඩැරල් යුගයේ දී රිච්මන්ඩ් විද්‍යාලය නිෂ්පාදනය කළ "වැනීසියේ වෙළෙන්දා" ඉංග්‍රීසි නාටකයේ ප්‍රධාන චරිතය රඟපෑමෙන් කන්නන්ගර සිය රංගන කුසලතාව ද එතුළින් එළි දැක්වී ය.

1904 වර්ෂය තරුණ කන්නන්ගරයන්ගේ ජීවිතයේ සන්ධිස්ථානයක් විය. ඔහුගේ දයාබර ගුරුතුමන් වූ ඩැරල් මැතිතුමන් ඔහු කැඳවා, දැනීම, චරිතය හා ප්‍රඥා වර්ධනයට රිච්මන්ඩ් විදුහල් මාතාව ඔහුට කළ සේවයට කෘතෝපකාරයක් වශයෙන් එහි ආචාර්ය මණ්ඩලයට බැඳෙන ලෙස ඇරයුම් කළේය. සිය ගුරුවරයාට දැක්වූ අසීමිත ගුරු භක්තිය නිසා එම ඇරයුම ප්‍රතික්ෂේප කිරීමට ඔහුට නොහැකි විය. රිච්මන්ඩ් විද්‍යාලයේ ගණිතය පිළිබඳ උපදේශක ආචාර්යවරයකු ලෙස පත් වූ කන්නන්ගර අතිදක්ෂ ගණිත ගුරුවරයකු වශයෙන් පිළිගැනිණ. ප්‍රවීණ විදුහල්පතිවරයකු වූ ඩැරල් යුගයේ දී රිච්මන්ඩ් විද්‍යාලය විශිෂ්ට විදුහලක් බවට දිවයින පුරා ප්‍රසිද්ධියට පත්විය. ඒ සඳහා උපකාරී වූ ආදර්ශවත් ආචාර්යවරයකු වශයෙන් කන්නන්ගර නාමය රිච්මන්ඩ් විද්‍යාලයේ ඉතිහාසයට එක්විය. විදුහල්පති ඩැරල්ගේ හදිසි වියෝවින් පසු රිච්මන්ඩ් විදුහලින් සමුගත් කන්නන්ගර වේල්ස්කුමර, මෙතෝදිස්ත, වෙස්ලි විදුහල්වල ගණිත ගුරුවරයකු වශයෙන් සේවය කළ අතර නීති විද්‍යාලයට බැඳී නීතිය හැදෑරීය. නීතිඥ විභාග යෙන් සමත් වූ ඔහු නීතිඥ වෘත්තිය ආරම්භ කළේය.

1917 දී ගාලු ප්‍රදේශයේ පළමු දේශපාලන සංවිධානය වූ ගාලු දේශපාලන සංගමය පිහිටු වූ එතුමන් එහි ආරම්භක ලේකම්වරයා ද විය. 38 වැනි වියට එළඹි තරුණ කන්නන්ගර මහතා මහනුවර විසූ වාසල මුදලි ජේ. ඩී. වීරසූරිය මහතාගේ දියණිය වූ ඊඩිත් වීරසූරිය මෙනවිය හා 1922 දී විවාහ දිවියට එළඹියේ ය. තමාගේ චින්තාවලියට එකඟ සහකාරියක ලැබීම ඔහුගේ නොනිමි දිවිමඟට තවත් ආලෝකයක් විය. 1923 දී ව්‍යවස්ථාදායක මණ්ඩලයට දකුණු පළාතේ නියෝජිතයා වශයෙන් තේරී පත් වූ කන්නන්ගර මැතිතුමා සිය දේශපාලන ගමන් මගේ ඓතිහාසික පියවර ඇරඹී ය. 1931 දක්වා ව්‍යවස්ථාදායක මණ්ඩලය විසුරුවා හරින තෙක් එහි සිටි කන්නන්ගර මැතිතුමන් 1931 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත්විය. ව්‍යවස්ථාදායක මණ්ඩලයේ සිටි කාලය තුළ, අමද්‍යප ව්‍යාපාරය දියත් කිරීමේ සටන මෙහෙයවා ජනාදරයට පත් වූ එතුමෝ මරණීය දණ්ඩනය අවලංගු කිරීම, බෞද්ධයන් සඳහා සාධාරණ නිවාඩු දින ගණනක් ඇති කිරීමේ අයිතීන් දිනාගැනීම සඳහා අභීත ව සටන් කළහ. එසේම ආදායම් බදු හා ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහා සක්‍රීය ව දායක වූ එතුමන් ප්‍රදර්ශනය කළ ආදර්ශවත් දේශපාලන චර්යාව පොදු ජන හෘදස්පන්දනයෙහි පිළිබිඹුවකි.

## අනගාරික ධර්මපාලතුමා

දොන් ඩේවිඩ් හේවාවිතාරණ ලෙස ඉපිද පසුව ධර්මපාල නමින් අනගාරික දිවියක් ගතකර සිරි දේවමිත්ත ධර්මපාල නමින් පැවිදි වූ (උපත: 1864 සැප්තැම්බර් 17 - විපත: 1933 අප්‍රේල් 29) බෞද්ධ ධර්ම ප්‍රචාරකයෙක් හා ශ්‍රී ලංකා නිදහස් සටනේ පුරෝගාමියෙකි. ක්‍රිස්තියානි මිෂනාරි බලපෑම්වලට එරෙහි බෞද්ධ ප්‍රතිරෝධයක් නිර්මාණය කිරීමට කැපී පෙනෙන කාර්ය භාරයක් ඉටු කළේ ය.

ඉන්දියාවේ බුදු දහම ශතවර්ෂ ගණනාවක පටන් බිඳ වැටී තිබූ සමයක එය පුනර්ජීවනය කිරීමට ඔහු පුරෝගාමී විය. බුද්ධ ධර්මය ආසියා, උතුරු ඇමරිකා හා යුරෝපා මහද්වීප තුනේ ම දේශනා කිරීමට මුල්වූ පළමු බෞද්ධයා ද ඔහු වේ. ඔහුට අවුරුදු 30 පමණ වනවිට ඔහු බුදුදහම ලොව පුරා ගෙනයාමේ ප්‍රධාන චරිතයක් බවට පත්ව සිටියේ ය. එසේම ඔහු ලංකාව තුළ රෝහල් ද ඉන්දියාව තුළ පාසල් හා විහාර ද ඉදි කිරිමට අවධානය යොමු කර සිටියේ ය. ජීවිතයේ අවසාන භාගයේ දී, සිරි දේවමිත්ත ධම්මපාල යන පැවිදි නාමයෙන් බෞද්ධ භික්ෂු ශාසනයට ඇතුළු විය.

පියා, එච්. දොන් කරෝලිස් හේවාවිතාරණ ය. ඔහු මාතර, හිත්තැටිය ගමේ සිට කොළඹට සංක්‍රමණය වූ මුදලි කෙනෙකි. මව, අන්දිරිස් පෙරේරා ධර්මගුණවර්ධනගේ දියණිය වූ, මල්ලිකා හේවාවිතාරණ (විවාහයට පෙර මල්ලිකා ධර්මගුණවර්ධන) ය. ඔහුගේ සහෝදරයන් වූ, එඩ්මන් හේවාවිතාරණ, සයිමන් හේවාවිතාරණ හා සී. ඒ. හේවාවිතාරණ ද බ්‍රිතාන්‍ය ලංකාවේ කැපී පෙනුණු චරිතයෝ වූහ.

1872 - 74 දක්වා බැප්ටිස්ට් සිංහල පාසලේත්, 1874 - 76 දක්වා ශාන්ත බෙනඩික් විද්‍යාලයේත්, 1876 - 78 දක්වා කෝට්ටේ ක්‍රිස්තියානි විද්‍යාලයේත්, 1878 - 83 දක්වා ශාන්ත තෝමස් විද්‍යාලයේත් අධ්‍යාපනය ලැබී ය. මෙම පාසල්වලින් ලද අධ්‍යාපනය ක්‍රිස්තියානි මිෂනාරි විය.

පාසල් අධ්‍යාපනය නිම වීමෙන් පසුව, අධ්‍යාපන කාර්යාංශයේ ලිපිකරුවෙකු ලෙස රජයේ සේවයට බැඳුණේ ය.

වයස අවුරුදු 16 දී, ඩේවිඩ් හේවාවිතාරණට කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට් හා බ්ලැවට්ස්කි මැතිණිය හඳුනා ගැනීමට ඉඩ සැලසුණි. වයස අවුරුදු 19 දී විශේෂ සාමාජිකත්වයකින් පරම විඥානාර්ථ සමාගමට බඳවා ගන්නා ලදි. 1886 දී හෙන්රි ස්ටීල් ඕල්කට් හා සී. ඩබ්. ලෙඩ්බීටර් බෞද්ධ අධ්‍යාපන අරමුදලට ආධාර එකතු කරනු පිණිස ලංකාවට පැමිණියහ. ඔවුනගේ භාෂා පරිවර්තක ලෙස කටයුතු කිරීමට ඩේවිඩ් හේවාවිතාරණ රජයේ රැකියාවෙන් ඉවත් විය. ඕල්කට්තුමා සමග රට පුරා කළ සංචාරය ඔහුගේ ඇස් අරවන්නක් විය. සිංහල ජාතියට හා බුදුදහමට සිදුව ඇති පරිහානිය එහි දී ඔහු සියැසින් දුටුවේ ය.

සිදුව ඇති පරිහානියට ප්‍රතිකර්ම යෙදීම උදෙසා, තමන් ස්වකීය දිවිය ම බුදු දහමේ උන්නතිය උදෙසා කැප කිරීමට අධිෂ්ඨාන කර ගත් බවත්, තමාට ගිහි ගෙයින් ඵලක් නැති බවත්, අනගාරික ව විසීමට අවසර දෙන ලෙසත් ඉල්ලමින් 1886 ජනවාරි 12 වන දින තම පියාට ලිපියක් යවන ලදි. හික්කඩුවේ සුමංගල හිමිගේ කරුණු පහදා දීමකින් අනතුරුව, පියා, ඩේවිඩ් හේවාවිතාරණට අනගාරික වීමට අවසර ලබා දුන්නේ ය. දොන් ඩේවිඩ් යන විදේශික නාමය අත හැර දමා, ධර්මපාල හේවාවිතාරණ යන සිංහල නම භාවිත කරන්නට පටන් ගත්තේ ය. ඔහු ගත කළ බ්‍රහ්මචාරී දිවිය නිසා අනගාරික යන පෙර ඇඳිය ඔහුගේ නමට එක් විය.

වර්ෂ 1886 සිට 1890 දක්වා කාලය තුළ බෞද්ධ පරම විඥානාර්ථ සංගමයේ බෞද්ධ අංශයේ මහ ලේකම්, බෞද්ධ මුද්‍රණාලයේ හා සඳරැස පත්‍රයේ කළමනාකරු, බෞද්ධ පාසල් කළමනාකරු, බෞද්ධ ආරක්ෂක කමිටුවේ සහායක ලේකම් යනාදි තනතුරු ධර්මපාලතුමා විසින් දරන ලදි.

ක්‍රිස්තියානි මිෂනාරි බලපෑමෙන් ජපන් බුදුදහම ආරක්ෂා කර ගැනීමේ අරමුණින් සෙන්ෂිරෝ නෞගච් ඕල්කට්තුමාට ජපානයට කළ ආරාධනාවක් අනුව ඔහු 1889 ජනවාරි 10 වන දින ධර්මපාලතුමා සමග ජපානය බලා පිටත්ව ගියේ ය. ලංකාවෙන් ජපානයට ගිය ප්‍රථම ධර්ම දූතයා වශයෙන් සැලකෙන්නේ ධර්මපාලතුමා ය. එහි දී පැවැත් වූ ජපන් බෞද්ධ මහා සම්මේලනයේ දී බෞද්ධ කොඩිය ප්‍රථම වරට පෙරදිග රටක ප්‍රදර්ශනය කරන ලදි.

1890 වසරේ දෙසැම් බර් 05 වන දින ධර්මපාලතුමා, ජපන් ජාතික ගුණරතන කොජේන් භික්ෂුව සමග බෝධිගයාව වන්දනය කිරීමට ඉන්දියාව බලා කොළඹින් පිටත් විය. බුද්ධගයා මහා විහාරයේ තැන්පත් කොට තිබූ බුද්ධ ප්‍රතිමාවට හින්දු වත් පිළිවෙත් අනුව පුද පූජාවන් පැවතෙමින් තිබිණි. බුද්ධගයා මහා විහාරයේ භාරකාරයාව සිටි හේමනාරායන ගිරි නම් මහන්තා සිතා සිටියේ බුදුන්වහන්සේ ශිව භක්තිකයෙකු බවයි. ධර්මපාලතුමා මෙය සැලකුවේ බුදුන්ට කරන අගෞරවයක් වශයෙනි. ගුණරතන කොජේන් භික්ෂුව බෝධිගයාවේ තාවකාලික ව නවතා, කෙටි බුරුම සංචාරයකින් අනතුරු ව

ධර්මපාලතුමා නැවත ලංකාවට පැමිණියේ ය. 1891 මැයි 31 වන දින, බුද්ධගයාව බෞද්ධයන් සතු කර ගැනීමේ පරමාර්ථය පෙර දැරි කොට ගෙන, බුද්ධගයා මහා බෝධි සංගමය ආරම්භ කරන ලදි. මේ හේතුවෙන්, සියලු ආගම් හා ජාතීන් සමානත්වයෙහිලා සැලකූ ඕල්කට්තුමා, හා ධර්මපාලතුමා අතර විරසකයක් ඇතිවිණි.

බෝධිගයා මහා නඩුව යන නමින් ප්‍රකට වූ දීර්ඝ නඩු විභාගය 1906 දී අවසන් වූයේ ධර්මපාලතුමා පරාජයට පත් කරමිනි. ඉන් අධෛර්යයට පත් නොවූ ඔහු බුද්ධගයාව බෞද්ධයන් සතු කර ගැනීමේ සටන අඛණ්ඩ ව ම ඉදිරියට ගෙන ගියේ ය. ඔහුගේ අභාවයෙන් පසු ව, බෞද්ධ හින්දු දෙපාර්ශ්වයෙන් ම හතර දෙනා බැගින් නියෝජනය වන කමිටුවකින් බුද්ධගයාව පාලනය විය යුතු බවට නියම වෙමින් 1949 දී බුද්ධගයා පනත සම්මත විය.

1921 දී ධර්මරාජික විහාරයත්, 1931 දී මූලගන්ධකුටි විහාරයත් ඉන්දියාවේ ඉදි කරවන ලදි. ධර්මපාල මැතිතුමාගේ උත්සාහය නිසා බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණ භූමි භාගය (කුසිනාරා නුවර) නැවතත් බෞද්ධයන්ගේ ආකර්ෂණයට ලක් විය. ඉංගිරිසි මහා බෝධි සඟරාව කියවීමෙන් පසුව, චිකාගෝ දෘෂ්ටි සම්මේලනයේ සම්පාදක බරෝස්, ධර්මපාලතුමාට 1893 දී චිකාගෝ නුවර පැවති දෘෂ්ටි සම්මේලනයට ආරාධනා කළේ ය.

බුදුදහම ප්‍රචාරය කිරීමට, සිංහල හා හින්දු භික්ෂූන් කිහිප නමක් එංගලන්තයට යවන ලදි. ලන්ඩන් මහාබෝධි සංගමය, බ්‍රිතාන්‍ය බෞද්ධයා නම් ඉංගිරිසි සඟරාව ඇරඹී ය.

බ්‍රිතාන්‍ය ලංකාව නිදහස් රටක් කිරීමට කර්මාන්ත උන්නතියක් ඇති කළ යුතු බව ධර්මපාලතුමා විශ්වාස කළේ ය. වාර්ෂික ව, කර්මාන්ත ඉගෙන ගැනීමට ජපානයට ශිෂ්‍යත්ව ලබා දෙන ලදි. පේෂ කර්මාන්තය හැදෑරූ යූ. බී. දොලපිහිල්ල, පිඟන් කර්මාන්තය හා චිත්‍ර ශිල්පය හැදෑරූ ඩී. සී. හාන්ති අප්පුහාමි, සුවඳ විලවුන් කර්මාන්තය හැදෑරූ ජෝන් එෆ්.කුරේ, කඩදාසි කර්මාන්තය හැදෑරූ එන්. ජේ. සෝමරත්න, ගිනිකූරු කර්මාන්තය හැදෑරූ බාලසූරිය, ගොවිකම හැදෑරූ මුනසිංහ, එසේ කර්මාන්ත උගෙන පැමිණි කැපී පෙනෙන ශිෂ්‍යයෝ වෙති.

13

# විවිධ කියවීම් ක්‍රම

**නිපුණතාව** : 06 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 6.3 විවිධ ශෛලීන්ට අනුව කියවීමේ හුරුව ලබයි.

**කාලච්ඡේද** : 06යි

**ඉගෙනුම් පල :**

- නියමිත අංග ලක්ෂණ සහිත ව සහකියවීම ප්‍රදර්ශනය කරයි. (Shared Reading)
- අත්‍යවශ්‍ය තොරතුරු හා දත්ත සටහන් කරමින් ගැඹුරින් කියවයි. (Deep reading)
- සාමාන්‍ය අදහස ගනිමින් වේගයෙන් කියවයි. (Skinning)
- අත්‍යවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා කියවයි. (Scanning)

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- සාමාන්‍ය අදහස ගනිමින් වේගයෙන් කියවීම, (Skinning) අත්‍යවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා කියවීම, (Scanning) සහකියවීම (Shared Reading) හා කෙටි සටහන් තබමින් කියවීම (Deep reading) පිළිබඳ අධ්‍යයනය කරන්න.

**ප්‍රවේශය :**

- පෙළ පොතේ ඇතුළත් **රටේ ආලෝකය ඔබයි...** යන පද්‍ය පාඨය කළුලෑල්ලේ ලියන්න.
- එම පද්‍ය ඇතුළත් පද්‍ය පන්තිය හා රචකයා නම් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**පාඩම සංවර්ධනය :**

- පෙළ පොතේ 57 පිටුවේ ඇතුළත් මොහොට්ටිවත්තේ ශ්‍රී ගුණානන්ද සමරු කලාපයෙන් උපුටා ගත් ලිපියේ ඡේදය ගුරුභවතා ශිෂ්‍යයන් සමග සහකියවීමෙහි යෙදෙන්න.
- අනතුරුව ශිෂ්‍යයන්ට එම ඡේදය නැවත කියවා සාමාන්‍ය අදහස ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එහි ඇතුළත් වැදගත් කරුණු කෙටියෙන් සටහන් කිරීමට උපදෙස් දෙන්න.
- වාර විභාග සහ අනෙක් තරග විභාගවලට සූදානම් වීමේ දී මෙම ක්‍රමය අනුගමනය කිරීමට උපදෙස් දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- නියමිත අංග ලක්ෂණ සහිත ව සහකියවීම ප්‍රදර්ශනය කිරීම
- අත්‍යවශ්‍ය තොරතුරු හා දත්ත සටහන් කරමින් ගැඹුරින් කියවීම
- සාමාන්‍ය අදහස ගනිමින් වේගයෙන් කියවීම
- අත්‍යවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා කියවීම

**14**

# ජීවිතාවබෝධය සඳහා ගද්‍ය, පද්‍ය යොදා ගැනීම

**නිපුණතාව** : 06 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 6.4 ගද්‍ය හා පද්‍ය කියවා වටහා ගත් බව ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද** : 03යි

**ඉගෙනුම් පල :**

- ගද්‍ය හා පද්‍ය අවබෝධයෙන් යුතු ව සවන් දෙයි.
- ගද්‍ය හා පද්‍ය නිර්මාණවල ඇතුළත් කාව්‍යෝපක්‍රම නිවැරදි ව ප්‍රකාශ කරයි.
- ගද්‍ය හා පද්‍ය කියවා අදහස නිවැරදි ව ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- සරල ගද්‍ය හා පද්‍ය කොටස බැගින් සූදානම් කර ගන්න. (ඇමුණුම 01)

**ප්‍රවේශය :**

- බෝ මළුවේ මල් සුවඳට කැටි වී අම්මා පෙවූ කිරි සුවඳ ගලා එන්නේ... යන සංගීත් නිපුන් සනත් නන්දසිරි මහතා ගයන ගීතය අසන්නට සලස්වා, අර්ථය විමසන්න.
- අර්ථය පැහැදිලි කර දෙන්න.

**පාඩම සංවර්ධනය :**

- පාඩමේ ඇතුළත් ගද්‍ය හා පද්‍ය කොටස් කියවා අර්ථය පැහැදිලි කර දෙන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට සුදුසු පරිදි වෙන් කරන්න.
- ඇමුණුම 1හි ඇතුළත් ගද්‍ය හා පද්‍ය කොටස් කණ්ඩායම් දෙකට ලබා දෙන්න.
- ඒ ඒ කණ්ඩායම්වලට කියවීමට හා රස විඳීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒ ඒ කණ්ඩායම අවබෝධ කර ගත් කරුණු ඩිමයි කොළයක ලියා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අඩුපාඩු පෙන්වා දෙමින් ඒවා සටහන් කර ගැනීමට අවස්ථාව දෙන්න.
- ඉදිරිපත් කළ කරුණු සියලු ශිෂ්‍යයන්ට සටහන් කර ගැනීමට අවස්ථාව දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1හි ඇතුළත් ගද්‍ය හා පද්‍ය කොටස්

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- ගද්‍ය හා පද්‍යවලට අවබෝධයෙන් යුතුව සවන් දීම
- ගද්‍ය හා පද්‍ය නිර්මාණවල ඇතුළත් කාව්‍යෝපක්‍රම නිවැරදි ව ප්‍රකාශ කිරීම
- ගද්‍ය හා පද්‍ය කියවා අදහස නිවැරදි ව ප්‍රකාශ කිරීම

ඇමුණුම : 01

**ගද්‍ය**

දරකපන්නා හා සර්පයා

ශීත කාලයේ එක් දවසක දර කපන්නෙක් විඩාපත්ව නිවෙස බලා පිය නගමින් සිටි විටෙක හිම මත යම් කළු පැහැති දෙයක් තිබෙනු දිටීය. එම තැනට වඩාත් කිට්ටුවත් ම ඔහු දුටුවේ මිය ඇදෙමින් සිටි සර්පයෙකුයි. එනමුදු එය සියතට ගත් හේ උණුසුම් කරනු වස් එය ළපැත්තේ රුවා හණිකට නිවෙස වෙත දිව ගියේය. නිවෙස වෙත පැමිණි වහාම හේ සර්පයා ගින්න අබියසින් උදුන මත තැබීය. දරුවන් ඌ දෙස විමසිල්ලෙන් බලාසිටි අතර ඌ සෙමෙන් හා කෙමෙන් පණ ලබන බව දුටහ. එවිට එක් දරුවෙක් ඉදිරියට විත් නැමී ඌ පිරිමදින්නට විය, එනමුදු සිය හිස එසවූ සර්පයා උගේ විසදත් විදහා දරුවාට මරු කැඳවන පහරක් එල්ල කිරීමට සැරසුණි. එවිට දරකපන්නා තම පොරව සුරතට ගෙන, එක් පහරකින් සර්පයා දෙපළු කළේය. "අහෝ," හේ පැවසීය, " අසත්පුරුෂයන්ගෙන් කෙළෙහිගුණ පැතිය නොහැක."

"කිරි දියෙනි දෙවියත් - අගුරු සුදුවෙන කලෙක් නම් නැත්."

**පද්‍ය**

ගුරුවරු කිසිම වි ට
සතුටු නොම වෙති තැළුම ට
හොඳින් එය සිහි කො ට
වැරදි නො කරන් තැළුම් කෑම ට

තක්කඩි කම් කළො ත්
දඬුවම් දෙති සැක නැ ත්
දඬුවම් නුදුන්නො ත්
ළමයි කිසි කල හොඳින් නො හැදෙ ත්

වැරදි කළ අය හ ට
දඬුවම් දෙන්නේ හැදුම ට
හැදෙන අය එම වි ට
හොඳින් කීකරු වෙති නැමී සි ට

ඉර උදා වෙන්න ට
පළමුව නැඟිට සිහිකො ට
අලසකම් දුරුකො ට
කරන් වැඩ පල දියුණු වන්න ට

සිරිත් මල්දම

**15**

# ලෝවැඩ සඟරාව

**නිපුණතාව** : 07 ධර්ම ශාස්ත්‍රීය ඥාන පෝෂණය ඔස්සේ ආගමික සමාජීය අවශ්‍යතා අර්ථවත් කර ගැනීම සඳහා වනපොත්කරණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 7.1 නිර්දිෂ්ට ග්‍රන්ථවලින් තෝරා ගත් පද්‍ය කොටස් වනපොත් කරයි.

**කාලච්ඡේද** : 27යි

**ඉගෙනුම් පල :**

- ලෝවැඩ සඟරාවේ නිර්දේශිත කවි මතකයෙන් කියයි.
- ලෝවැඩ සඟරාවේ නිර්දේශිත කවිවල අර්ථය නිවැරදි ව කියයි.
- ලෝවැඩ සඟරාවේ නිර්දේශිත කවිවල දුරවබෝධ වචනවල අර්ථ ඇතුළත් කර ගැටපදයක් සකසයි.
- ලෝවැඩ සඟරාවේ කවි ඇසුරින් ජීවිත යථාර්ථය පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- ලෝවැඩ සඟරාව යනු ආගමික උපදේශ කාව්‍යයක් ලෙස හඳුන්වා දීම සඳහා සූදානම් වන්න.
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත ලෝවැඩ සඟරාව ඉගැන්වීම සඳහා භාවිත කරන්න.
- කවිවල දුරවබෝධ වචනවල අර්ථ පැහැදිලි කිරීම සඳහා පිළිගත් ශබ්ද කෝෂයක් හෝ ගැටපද විවරණයක් භාවිත කරන්න.

**ප්‍රවේශය :**

- ලෝවැඩ සඟරාවේ කවි කිහිපයක් ගායනා කර එහි අර්ථවල වැදගත්කම සිසුන්ට පැහැදිලි කරන්න.
- ලෝවැඩ සඟරා කෘතිය පිළිබඳ හඳුන්වා දීමක් කරන්න. එහි දී පහත සඳහන් කරුණු අවධාරණය කරන්න.
- කර්තෘ, කාලය, කවි ගණන, වස්තු විෂය, ආගමික උපදේශ කාව්‍යයක් ලෙස වැදගත්කම

**පාඩම සංවර්ධනය :**

- නිර්දේශිත කවි 50න් එක් දිනකට කවි තුන බැගින් යොදා ගන්න.
- සෑම දිනක ම ඉගැන්වීම පහත පරිදි සංවිධානය කර ගන්න.
- එක් දිනකට කවි තුනක් පමණක් උගන්වන්න.
- එදිනට නියමිත කවිවල ගායනයක් සුදුසු ක්‍රමවේදයක් යොදා ගෙන ඇසීමට සලස්වන්න.
- එහි ඇති දුරවබෝධ වචන ලියන්නැයි සිසුන්ට පවසන්න.
- සිසුන් ලියූ දුරවබෝධ වචනවල අර්ථය පැහැදිලි කර දෙන්න.
- දිනට නියමිත කවිවලින් කියැවෙන ජීවිත යථාර්ථය සාකච්ඡා කරන්න.
- දිනට නියමිත කවි වනපොත් කර ගෙන එන්නැයි පවරන්න.
- පාඩම් කළ කවි එක් එක් ශිෂ්‍යයාගෙන් වෙන වෙන ම කටපාඩම් ගන්න.
- කවිවල අර්ථය පැවසීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- කවිවලින් අදහස් වන උපදේශවල වටිනාකම පැහැදිලි කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- නැවතත් ඉහත සඳහන් පරිදි ඊළඟ කවි තුන පැහැදිලි කර දෙන්න.
- ඒ ඒ දිනවල ලියන ලද දුරවබෝධ වචන ඇතුළත් කර ගැටපද විවරණයක් ලිවීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- කාලච්ඡේද තුනහතරකට වරක් පාඩම් කළ කවි නැවත සිහිපත් කිරීම හා ඒ සම්බන්ධ ඇගයීමක් සිදු කරන්න.
- සෑම දිනකම පෙර උගත් කවි ඇසුරින් සිසු ප්‍රගතිය තක්සේරු කර ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- පහත සඳහන් නිර්ණායක අනුව ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- ලෝවැඩ සඟරාවේ නිර්දේශිත කවි මතකයෙන් පැවසීම
- ලෝවැඩ සඟරාවේ නිර්දේශිත කවිවල අර්ථය නිවැරදි ව ප්‍රකාශ කිරීම
- ලෝවැඩ සඟරාවේ කවිවල දුරවබෝධ වචන ඇතුළත් ගැටපද විවරණයක් සැකසීම
- ලෝවැඩ සඟරාවේ නිර්දේශිත කවි ඇසුරින් ජීවන යථාර්ථය පැහැදිලි කිරීම

**16**

## හීන් සැරය

**නිපුණතාව** : 08 රසඥතාව වර්ධනය කර ගැනීම හා ජීවිතාදර්ශ ලබා ගැනීම සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 8.1 ගද්‍ය නිර්මාණ රස විඳිමින් කියවයි.

**කාලච්ඡේද** : 27යි

**ඉගෙනුම් පල :**

- 'හීන්සැරය' කතාව නිශ්ශබ්ද ව රස විඳිමින් කියවයි.
- කියවීමේ ගුණාංග සහිත ව 'හීන්සැරය' කතාව ශබ්ද නගා කියවයි.
- 'හීන්සැරය' කතාව කියවා අසන ලද ප්‍රශ්නවලට නිවැරදි ව පිළිතුරු දෙයි.
- නිශ්ශබ්ද ව හා ශබ්ද නගා කියවීමේ දී තිබිය යුතු ගුණාංග නිවැරදි ව අනුගමනය කරයි.
- අවබෝධ ප්‍රශ්නවලට පිළිතුරු සොයන ආකාරය හේතු දක්වමින් විස්තර කරයි.
- 'හීන්සැරය' කතාවේ රසවත් අවස්ථා උපුටා ගෙන ඊට හේතු දක්වයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- හීන්සැරය ප්‍රබන්ධ කතාව සම්පූර්ණයෙන් කියවා ගන්න.
- ශිෂ්‍යයින්ගේ අවබෝධය මැන බැලිය හැකි ප්‍රශ්න (ඇමුණුම 1හි සඳහන් පරිදි) සකස් කර ගන්න.
- ශිෂ්‍යයින් සියලු දෙනාට ම හීන්සැරය ළමා ප්‍රබන්ධ කතාවේ පිටපත බැගින් තිබේ දැ'යි සොයා බලන්න.

**ප්‍රවේශය :**

- හීන්සැරය ළමා ප්‍රබන්ධ කතාවේ ආරම්භක කොටස සිසුන් සමග **සහකියවීමක** යෙදෙන්න.
- හීන්සැරය ළමා ප්‍රබන්ධ කතාව හඳුන්වා දෙන්න. (කර්තෘ, කාලය, අන්තර්ගතය)

**පාඩම සංවර්ධනය :**

- සෑම පරිච්ඡේදයක් ම සහකියවීමකින් ආරම්භ කරන්න.
- පොතක් නිශ්ශබ්ද ව කියවීමේ දී සැලකිය යුතු කරුණු පැහැදිලි කරන්න.
- පොතක් ශබ්ද නගා කියවන ආකාරය ආදර්ශනය කර පෙන්වන්න.
- නිවැරදි උච්චාරණ සහිත ව ශබ්ද නගා කියවීමට එක් එක් ශිෂ්‍යන්ට අවස්ථාව ලබා දෙන්න.
- කියවන ඡේදය ඇසුරින් අවබෝධය මනින ප්‍රශ්න අසන්න.
  (ඇමුණුම අංක 01 නිදර්ශනයකි)
- ප්‍රශ්නයකට පිළිතුරු සොයන ආකාරය පැහැදිලි කරන්න.
  (ඇමුණුම අංක 02 නිදර්ශනයකි)
- නිශ්ශබ්ද ව පොතක් කියවීමේ දී සැලකිය යුතු කරුණු පැහැදිලි කරන්න.
- නිශ්ශබ්දව කියවා ඡේද ඇසුරින් ප්‍රශ්න සැකසීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- දෙදෙනා බැගින් එකතුව අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රශ්න ඇසීමටත් පිළිතුරු දීමටත් සිසුන් යොමු කරන්න.
- ශබ්ද නගා කියවීමේ වේගය අනුව කියවීමේ හැකියාව තක්සේරු කරන්න.
- ප්‍රශ්නවලට පිළිතුරු දෙන ආකාරය අනුව කියවා අවබෝධ කර ගැනීමේ හැකියාව මනින්න.
- පහත සඳහන් තක්සේරු නිර්ණායකවලට අනුව තක්සේරුව සිදු කරන්න.

**මූලික වදන් සංකල්ප :**

- සහ කියවීම - හඬ නගා කියවන එක් අයෙකු සමග අන් අය මුමුණමින් කියවීම (Shared Reading)

**ගුණාත්මක යෙදවුම් :**

- එක් එක් පරිච්ඡේදය ඇසුරින් සකස් කර ගත් අවබෝධය මැන බැලීමේ ප්‍රශ්න

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- 'හීන්සැරය' කතාව වින්දනාත්මක ව කියවීමට යොමු වීම
- අසනු ලබන අවබෝධාත්මක ප්‍රශ්නවලට නිවැරදි ව පිළිතුරු දීම
- අන්‍යෝන්‍ය වශයෙන් කතාවේ රසමුසු තැන් ඉදිරිපත් කිරීම
- ගුරු උපදෙස් පිළිපැදීම හා කණ්ඩායම් හැඟීමෙන් යුතු ව කටයුතු කිරීම

**ඇමුණුම 1** අවබෝධය තක්සේරු කිරීම සඳහා ආදර්ශ ප්‍රශ්න (1 පරිච්ඡේදය ඇසුරින්)

1. අලියා අසලට ආවේ කවුද?
2. අලියා කළේ කුමක් ද?
3. අලියා ගියේ කොහේ ද?
4. අලියා ගියේ කොහොම ද?
5. කටුසු හාමි කියූ දේ ගෝණ හාමි විශ්වාස නොකළේ ඇයි?

**ඇමුණුම 2** අවබෝධය තක්සේරු කිරීම සඳහා ආදර්ශ ප්‍රශ්න (1 පරිච්ඡේදය ඇසුරින්)

පියවර 1 - ප්‍රශ්නය කියවන්න. උදා: අලියා අසලට ආවේ කවුද?

පියවර 2 - ප්‍රශ්නවාචී පදය හඳුනා ගන්න. උදා: කවුද? කියා අසන ප්‍රශ්නයක්

පියවර 3 - ප්‍රශ්නවාචී පදයට අනුව විය යුතු පිළිතුර තෝරන්න.
උදා: කවුද කියා ප්‍රශ්නයකට පිළිතුර විය යුත්තේ 'කෙනෙක්'

පියවර 3 - ප්‍රශ්නවාචී පදයට අනුව පිළිතුර සඳහා ඉඟිය ගොඩ නගන්න.
උදා: අලියා අසලට ආව 'කෙනා'

පියවර 4 - පිළිතුර පවසන්න. උදා: ගෝණ හාමි

| අංකය | ප්‍රශ්න වර්ගය | පිළිතුරු වර්ගය |
|---|---|---|
| 01 | කවුද? | කෙනෙක් |
| 02 | කුමක් ද? | දෙයක් |
| 03 | කොහේ ද? | තැනක් |
| 04 | කවදා ද? | වේලාවක් / දිනයක්/ |
| 05 | කොහොම ද? | ආකාරයක් |
| 06 | ඇයි? | හේතුවක් |

(17)

## නම් පොත හා මඟුල් ලකුණ

**නිපුණතාව** : 08 රසඥතාව වර්ධනය කර ගැනීම හා ජීවිතාදර්ශ ලබා ගැනීම සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම** : 8.2 ගද්‍ය නිර්මාණ රස විඳිමින් කියවයි.

**කාලච්ඡේද** : 24යි

**ඉගෙනුම් පල :**

- අකුරු නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි.
- බැඳි අකුරු නිවැරදි ව හඳුනාගෙන උච්චාරණය කරයි.
- නොපැකිලව වේගයෙන් නිවැරදි ව කියවයි.
- කියවීම සඳහා නම් පොත හා මඟුල් ලකුණ ඵලදායී ව භාවිත කරයි.
- කියවීමේ කුසලතා විශාරද ව ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- ''නම් පොත හා මඟුල් ලකුණ'' සම්පූර්ණයෙන් කියවා ගන්න.
- ශිෂ්‍යයින් සියලු දෙනාට ම ''නම් පොත හා මඟුල් ලකුණ'' පිටපත බැගින් තිබේදැ'යි සොයා බලන්න.
- 'නම් පොත හා මඟුල් ලකුණ'හි කියවීමට ඇති කොටස් කාලච්ඡේද ගණනට අනුව වෙන් කර ගන්න.

**ප්‍රවේශය :**

- 'නම් පොත හා මඟුල් ලකුණ' පොතේ මුල් කොටස කියවා ආදර්ශනය කර පෙන්වන්න.
- ශබ්ද නගා කියවීමේ දී තිබිය යුතු ගුණාංග පැහැදිලි කර දෙන්න. (ඇමුණුම 01)

**පාඩම සංවර්ධනය :**

- එක් එක් ශිෂ්‍යයාට තනි තනි ව කියවීමට අවස්ථාව දෙන්න.
- පසුව දෙදෙනා බැගින් කණ්ඩායම් වී කියවීමටත්, කියවීම නිවැරදිදැ'යි පරීක්ෂා කිරීමටත් අන්‍යෝන්‍ය වශයෙන් අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් ශිෂ්‍යයාට තම කියවීමේ කුසලතාව ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- බැඳි අකුරු හා උච්චාරණ විශේෂතා ඇති තැන් කියා දෙන්න.
- සැම ශිෂ්‍යයෙකුගේ ම කියවීම කේවල ව තක්සේරු කරන්න. (ඇමුණුම 01 මේ සඳහා යොදා ගන්න.)
- උච්චාරණ දුර්වලතා පෙන්වා දී නිවැරදි කරන්න.
- පහත සඳහන් නිර්ණායකවලට අනුව තක්සේරු කර ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- අකුරු නිවැරදි ව උච්චාරණය කිරීම
- බැඳි අකුරු හා උච්චාරණ විශේෂතා ඇති තැන් නිවැරදි ව ශබ්ද කිරීම
- නොපැකිලව වේගයෙන් කියවීම
- කියවීමේ කුසලතා වර්ධනය

ඇමුණුම 1 ශබ්ද නගා කියවීමේ දී තිබිය යුතු ගුණාංග

- හඬ නගා කියවීම
- උචිත වේගයකින් කියවීම
- නිවැරදි ශබ්ද උච්චාරණය
- විරාම ලකුණුවලට අනුගත ව කියවීම
- ගුරු උපදෙස් පිළිපැදීම

(18)

## කාව්‍ය නිර්මාණ

**නිපුණතාව** : 09 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 9.1 සරල පද්‍ය නිර්මාණය කරයි.

**කාලච්ඡේද** : 08යි

**ඉගෙනුම් පල :**

- තාලානුකූල ව ගායනා කළ හැකි සරල කවි නිර්මාණය කරයි.
- නිර්මාණය කරන ලද කවි තලානුකූල ව ගායනා කරයි.
- නිර්මාණය කරන ලද කාව්‍ය නිර්මාණ පුවත් පත් සඟරා ආදියේ පළ කරයි.
- සරල කවි ගායනා කර රස විඳ තම අදහස් ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- සරල රසවත් කවි නිර්මාණයක් සිසුන්ට ඉදිරිපත් කිරීම සඳහා සූදානම් කර ගන්න. (එය කවි මඬුවක ඉදිරිපත් කරන නිර්මාණයක් වුව ද කම් නැත.)
- ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ (පරිගණක, මල්ටිමීඩියා හෝ වෙනත්) සූදානම් කර ගන්න.
- ඇමුණුම් අංක 1 සිසුන්ට බෙදා දීමට අවශ්‍ය පත්‍රිකා සූදානම් කර ගන්න.
- කාව්‍ය නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ දැනුවත් වන්න.

**ප්‍රවේශය :**

- කල් ඇතිව සූදානම් කර ගත් සරල සැඳැස් කවි නිර්මාණය පරිගණක හෝ වෙනත් තාක්ෂණික උපකරණ භාවිතයෙන් ශිෂ්‍යයන්ට සවන් දීමට අවස්ථාව සලසන්න.
- කවි පෙළ රසවත් වීමට හේතු වූ කරුණු පිළිබඳ ශිෂ්‍යයන්ට සමග සාකච්ඡා කරන්න.

**පාඩම සංවර්ධනය :**

- ප්‍රවේශයේ දී ඉදිරිපත් කළ පද්‍ය නිර්මාණය ඇසුරින් කවි පද බැඳීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
- ඇමුණුම් අංක 1හි සඳහන් පත්‍රිකාව සිසුන්ට බෙදා දෙන්න.
- ඇමුණුමෙහි සඳහන් කවිවල අවසන් පදය මුල් පදවලට ගැළපෙන පරිදි සම්පූර්ණ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍යයන් විසින් සම්පූර්ණ කරන ලද කාව්‍ය පාදය සහිත කවි ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පද්‍ය නිර්මාණයේ දී සිසුන් මුහුණ දෙන ගැටලු හා ඒවාට විසඳුම් සොයා ගත හැකි ආකාරය ශිෂ්‍යන් සමග සාකච්ඡා කරන්න.
- පද්‍ය නිර්මාණයට නියමිත එක් එක් කාලච්ඡේදවල දී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන්න.
  - කවියෙන් ප්‍රශ්න ඇසීම හා පිළිතුරු දීම
  - කවි සංවාද පැවැත්වීම
  - මාතෘකානුකූල කවි නිර්මාණය කිරීම
  - කවියෙන් සරල කතාවක් කීම
- ශිෂ්‍යයන් විසින් නිර්මාණය කරන ලද කවි ගායනයෙන් මෙන් ම ලිඛිතව ද ඉදිරිපත් කිරීමට අවශ්‍ය පහසුකම් සපයා දෙන්න.
- ශිෂ්‍ය සමිති/ බිත්ති පුවත් පත්/ සඟරා ආදිය මේ සඳහා යොදා ගන්න.
- ශිෂ්‍යයන්ගේ කාව්‍ය නිර්මාණ ඇගයීම සඳහා සාකච්ඡා, කුඩා සම්මන්ත්‍රණ සංවිධානය කරන්න.
- මේ සඳහා අවශ්‍ය නම් බාහිර සම්පත් පුද්ගලයින් ද යොදා ගන්න.
- සැම ශිෂ්‍යයෙකුගේ ම නිර්මාණ කේවල ව තක්සේරු කරන්න.
- අවශ්‍ය ප්‍රතිපෝෂණ හා මග පෙන්වීම් ලබා දෙන්න.
- පහත සඳහන් නිර්ණායක අනුව තක්සේරුව හා ඇගයීම සිදු කරන්න.

**මූලික වදන් සංකල්ප :**

- එළිසමය/එළිවැට - සඳැස් කවියක මුල මැද හෝ අග එක සමාන අකුරකින් අවසන් වන පද යෙදීම
- කවි බස - සාමාන්‍ය ව්‍යවහාරයට වෙනස් වූ ගේය පද රචනාවක් වීම
- සංකල්ප රූප - මවාගත් චිත්තරූප භාෂා භාවිතයෙන් නිරූපණය කර දැක්වීම
- අලංකාර (සරලව) - ශබ්ද හා අර්ථවලින් කවිය සැරසීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම් අංක 1හි ඇතුළත් කවි

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- විරිතට ගැළපෙන පරිදි එළිසමයෙන් යුතු කවි පද යොදා ගැනීම
- උචිත කවි බසක් යොදා ගැනීම
- නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීම
- එක් එක් කාව්‍ය නිර්මාණ රස විඳීම හා ඇගයීම

ඇමුණුම 1

**උදය**

උදා ගිරෙන් හිරු දෙවියන් ලොවට වඩිනවා
හිඹුටු කැලේ රැහැයි නලා හඬ පැතිරෙනවා
කුරුලු රැන් මන පිනවන ගීත ගයනවා
.......................................................................................

**සඳඑළිය**

කිරි බැබළෙන හඳ පානයි
අහස දිළෙන නිල් වියනයි
සුවඳ හමන සොමි පවනයි
.......................................................................................

**නිල් ගොයම**

කෙතේ පඳුරු ලා ගොයම් සැදෙන්නේ
කිරට නැමුණු කරලින් බර වෙන්නේ
මඳ සුළඟේ හෙම්හිට නැළවෙන්නේ
.......................................................................................

**දේදුන්න**

ඈත ඈත ආකාසේ දේදුන්නක් පායලා
නේක නේක පාට පාට අහස් ගැබට එක් වෙලා
හිරු මඬලට සඳ මඬලට කිරි මුහුදට යා වෙලා
.......................................................................................

(උපුටා ගැනීම, 7 ශ්‍රේණිය සිංහල ගුරු මාර්ගෝපදේශය 2007 - ජාතික අධ්‍යාපන ආයතනය)

19

# කතන්දර නිර්මාණය

**නිපුණතාව** : 09 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** : 9.2 සරල කතන්දරයක් නිර්මාණය කරයි.

**කාලච්ඡේද** : 04යි

**ඉගෙනුම් පල :**

- මුල මැද අග මනා සම්බන්ධතාවකින් යුතු සරල කතන්දරයක් නිර්මාණය කරයි.
- නිර්මාණය කරන ලද සරල කතන්දර ශබ්ද නගා කියවයි.
- නිර්මාණය කරන ලද වෙනත් කතන්දර පන්තිකාමරයේ දී අගය කරයි.
- සරල කතන්දරවලට සවන් දී තම අදහස් නොපැකිල ව ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- ආදර්ශ ලෙස ඉදිරිපත් කළ හැකි කතන්දරයක් සොයා ගන්න.
  (නිදඃ කුඩහොරා - සිබිල් වෙත්තසිංහ)
- කතන්දරයක තිබිය යුතු මූලික ගුණාංග පැහැදිලි කිරීමට සූදානම් වන්න.

**ප්‍රවේශය :**

- දම්වැල් කතන්දර (Chain Story) ක්‍රමයට කතන්දරයක් ගොඩ නැගීමට ශිෂ්‍යයන්ට අවස්ථාව සලසන්න. ( එනම්ඃ කිසියම් කතන්දරයක් ගොඩ නැගෙන පරිදි ගුරුවරයා මුල පිරීමක් කර එයට යම් යම් සිද්ධි හා අවස්ථා ගොඩ නැගීමට ශිෂ්‍යයන්ට අවස්ථාව දෙනු ලැබේ. කතාව එක් දිසාවකට යොමු කිරීම සඳහා ගුරුවරයා විසින් වරින්වර මැදිහත්වීම් කරනු ලැබේ. මෙසේ සියලු දෙනා එක්ව කතන්දර ගොඩ නැගිම දම්වැල් කතන්දර නම් වේ.)

**පාඩම සංවර්ධනය :**

- සිසුන්ගේ සංඛ්‍යාව අනුව සමස්ත පන්තිය ම එක් කණ්ඩායමක් ලෙස හෝ සිසුන් වැඩි ප්‍රමාණයක් සිටියි නම් කුඩා කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- දම්වැල් ක්‍රමයට කතන්දර ගොඩනැගීමට (එක් වටයකින් හෝ වට කිහිපයකින්) අවස්ථාව ලබා දෙන්න.
- හොඳ කතන්දරයක තිබෙන ගුණාංග මොනවා දැ'යි සිසුන්ට පැහැදිලි කරන්න. (ඇමුණුම 1)
- එම ගුණාංගයන්ගෙන් යුතු කතන්දරයක් පන්තියේ සියලු දෙනා එක් ව ගොඩ නගන්න.
- ඒ සඳහා දම්වැල් කතන්දර කීමේ ක්‍රමය මගින් ආරම්භය ලබා ගන්න.
- කේවල ව සරල කතන්දර ගොඩ නැගීමට ශිෂ්‍යයන්ට පවරන්න.
- නිර්මාණය කරන ලද කතන්දර හුවමාරු කර ගෙන කියවීමටත් අන් අයගේ සංවර්ධනාත්මක යෝජනා අනුව තවදුරටත් සංස්කරණය කිරීමටත් යොමු කරන්න.
- නිර්මාණය කර අවසන් කරන ලද කතන්දර ප්‍රකාශයට පත් කිරිමට උචිත මාධ්‍යයකින් අවස්ථාව සලසන්න.
- උසස් ගුණාංගයන්ගෙන් යුතු කතන්දර අගය කරන්න.
- නිර්මාණයේ දී සමපදස්තයන් මගින් හා ගුරු උපදෙස් මගින් ප්‍රතිපෝෂණය හා ධෛර්යය ලබා දෙන්න.
- පහත සඳහන් නිර්ණායක අනුව තක්සේරුව සිදු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම් අංක 1හි ඇතුළත් කතන්දරයක ගුණාංග

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- කතන්දර කීමට උනන්දුවෙන් කණ්ඩායමට එක් වීම
- මුල මැද අග සහිත කතන්දරයක් නිර්මාණය කිරීම
- සමපදස්තයන්ගේ නිර්මාණ කියවා සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කිරීම
- උසස් නිමාවෙන් යුතු කතන්දර නිර්මාණ ඉදිරිපත් කිරීම

ඇමුණුම 1 සරල කතන්දරයක තිබිය යුතු ගුණාංග

- මුල මැද අග මනා සම්බන්ධතාවකින් යුතු කතාවක් තිබීම
- චරිත, අවස්ථා හා සිද්ධි අතර මනා සම්බන්ධතාවක් තිබීම
- සිද්ධි හෝ චරිත අතර ගැටුමක් තිබීම
- ගැටුමේ ආරම්භක අවස්ථාවක්, කූඨප්‍රාප්තියක් හා නිමාවක් තිබීම
- කුතුහලය ජනනය වන කතාවක් තිබීම
- ජීවිතාදර්ශයක් සැපයීම

**20**

# කතන්දරවලට සවන් දීම

**නිපුණතාව** : 10 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 10.1 සරල කතන්දරයක් නිර්මාණය කරයි.

**කාලච්ඡේද** : 06යි

**ඉගෙනුම් පල :**

- සවන් දීමේ දී තිබිය යුතු ගුණාංග කිහිපයක් නිවැරදි ව ප්‍රකාශ කරයි.
- සරල සංවාදයකට සංවර ව සවන් දෙයි.
- සංවාදයකට සවන් දී එහි අන්තර්ගතය නිවැරදි ව ප්‍රකාශ කරයි.
- සංවාදයකට සවන් දී අසන ලද ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- සිසුන්ට සවන් දීමට සුදුසු සංවාද කිහිපයක් (5/6ක් පමණ) සූදානම් කර ගන්න. (මේ සඳහා නාට්‍යයක කොටසක් වුව ද සුදුසු ය.)
- සංවාදය සිසුන්ට සවන් දීමට සැලැස්වීම සඳහා අවශ්‍ය උපකරණ සූදානම් කර ගන්න. (CD/DVD/Pen/පරිගණක)
- තෝරාගත් සංවාද කොටස් ඇසුරෙන් ශිෂ්‍යයන්ගෙන් ඇසීම සඳහා ප්‍රශ්න සකස් කර

**ප්‍රවේශය :**

- නාට්‍යයක කොටසක් ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- කලින් සකස් කර ගත් ප්‍රශ්න අහඹු ලෙස තෝරා ගත් සිසුන් කිහිප දෙනෙකුගෙන් විමසන්න.
- සිසුන්ගේ සවන් දීමේ ප්‍රබලතා දුබලතා ද සැලකිල්ලට ගනිමින් සංවාදයකට සවන් දීමේ දී සැලකිය යුතු කරුණු පිළිබඳ අවධාරණය කරන්න. (ඇමුණුම 1 භාවිත කරන්න)

**පාඩම සංවර්ධනය :**

- සූදානම් කර ගත් සංවාද කොටස් සිසුන්ට සවන් දීමට සලස්වා ඒ ඇසුරින් සකස් කර ගත් ප්‍රශ්න අසමින් සිසුන්ට සවන් දීම හුරු කරවන්න.
- ඒ ඇසුරෙන් සිසුන්ගේ සවන් දීමේ කුසලතාව තක්සේරු කරන්න.
- සජීවී සුහද සංවාදවල නිරත වීමටත් ඒ ඇසුරෙන් සවන් දීම හුරු වීමටත් සිසුන්ට අවස්ථාව සලසන්න.
- අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන ආකාරය අනුව සිසුන්ගේ සවන් දිමේ කුසලතාව තක්සේරු කරන්න.
- සවන් දීමේ දි ශිෂ්‍යයන් දක්වන අයහපත් ප්‍රතිචාර පිටු දකින්න.

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- සවන් දීමේ දී තිබිය යුතු ගුණාංග සුරැකීම
- සවන් දීමේ දී අවධානය බිඳෙන කාර්යවලින් වැළකීම
- අවධානයෙන් සවන් දී අසනු ලබන ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු දීම
- සවන් දීමේ කුසලතා වර්ධනය කිරීම

ඇමුණුම 1 සංවාදයකට සවන් දීමේ දී සැලකිය යුතු කරුණු

- සමාජයේ ජීවත් වීමේ දී විවිධ සංවාදවලට සවන් දීමට සිදු වන බව
- අදහස් හුවමාරු කර ගැනීමේ දී අන්‍ය මත ගරු කරමින්, සමාජ ජීවිතයේ දී අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව සවන් දිය යුතු බව
- සංවාදවලට සවන් දීමෙන් නොදන්නා බොහෝ තොරතුරු අනාවරණය වන බව
- සංවාදවලට සවන් දීමෙන් සමාජ සම්බන්ධතා ගොඩනැගෙන බව
- සංවාදයක දී අන් අයට කතා කිරීමට අවස්ථාව දී ඉවසීමෙන් සවන් දිය යුතු බව
- තම අදහස් ඉදිරිපත් කිරීම සවන් දීමෙන් අනතුරුව සිදු කළ යුතු බව

**21**

## ප්‍රකාශවලට සවන් දීම

**නිපුණතාව** : 10 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 10.2 විවිධ ප්‍රකාශනවලට සවන් දී අන්තර්ගතය ග්‍රහණය කර ගනියි.

**කාලච්ඡේද** : 06යි

**ඉගෙනුම් පල :**

- ප්‍රකාශනයකට අවධානයෙන් සවන් දීමේ දී සැලකිය යුතු කරුණු නිවැරදි ව ප්‍රකාශ කරයි.
- නියමිත ගුණාංග අනුගමනය කරමින් ප්‍රකාශනයකට සවන් දෙයි.
- ප්‍රකාශනයේ අන්තර්ගතය නිවැරදි ව ප්‍රකාශ කරයි.
- සවන් දෙන ලද ප්‍රකාශනය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ලබා දෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- සිසුන්ට කියාදීමට සුදුසු සරල කතන්දර කිහිපයක් සූදානම් කර ගන්න. (ජනකතා, ජාතක කතා, ඓතිහාසික කතා, උපහාස කතා, විශේෂ කතා)

**ප්‍රවේශය :**

- රසවත් කතන්දරයක් ශිෂ්‍යයන්ට කියා දෙන්න.
- කතන්දරය ඇසුරෙන් ප්‍රශ්න කිහිපයක් අහඹු ලෙස තෝරා ගත් ශිෂ්‍යයන් කිහිප දෙනෙකුගෙන් අසන්න.
- ප්‍රකාශනයකට සවන් දීමේ දී සැලකිය යුතු කරුණු පිළිබඳ අවධාරණය කරන්න.

**පාඩම සංවර්ධනය :**

- පන්තියේ ශිෂ්‍යයන් යුගල වශයෙන් කණ්ඩායම් වී එකිනෙකාට සරල කතන්දර පැවසීමටත් ඒ කතන්දර ඇසුරෙන් අසන ප්‍රශ්නවලට පිළිතුර දීමටත් අවස්ථාව සලසන්න.
- නිර්දේශිත පන්ති පොතක හෝ වෙනත් සරල බසින් ලියවුණු පොතක කොටස් කියවා ප්‍රශ්න ඇසීමටත් පිළිතුරු ලබා දීමටත් ශිෂ්‍යයන්ට අවස්ථාව සලසන්න.
- විවිධ ප්‍රකාශනවලට සවන් දී එහි තේමාව පැවසීමටත් ප්‍රධාන කරුණු ප්‍රකාශ කිරීමටත් ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- කතන්දර, ප්‍රකාශන ආදියට සවන් දී ලබා දෙන පිළිතුරු අනුව සහ පහත සඳහන් නිර්ණායක අනුව තක්සේරුව හා ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- ප්‍රකාශනයකට සවන් දීමේ දී සැලකිය යුතු කරුණු නිවැරදි ව ප්‍රකාශ කිරීම
- නියමිත ගුණාංග අනුගමනය කරමින් ප්‍රකාශනයකට සවන් දීම
- ප්‍රකාශනයේ අන්තර්ගතය නිවැරදි ව ප්‍රකාශ කිරීම
- සවන් දෙන ලද ප්‍රකාශනය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ලබා දීම

(22)

## ආචාරශීලී ව සවන් දීම.

**නිපුණතාව** : 10 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 10.3 ආචාරශීලී ව හා සංයමයෙන් යුතු ව සවන් දී ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද** : 06යි

**ඉගෙනුම් පල :**

- ආචාරශීලී බව හා සංයමය යන්න නිවැරදි ව නිර්වචනය කරයි.
- ආචාරශීලී විය යුතු ආකාරය මැනවින් පැහැදිලි කරයි.
- ආචාරශීලී විය යුතු තැන් හා අවස්ථා නිවැරදි ව ප්‍රකාශ කරයි.
- උචිත අවස්ථාවල මැනවින් ආචාරශීලී ව හැසිරෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- ක්‍රියාකාරකම කියවා ආචාරශීලී ව සවන් දිය යුතු අවස්ථාව සැලසුම් කරන්න.
- ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ භාවිතයට අවශ්‍ය උපකරණ සූදානම් කර ගන්න.

**ප්‍රවේශය :**

- ධර්ම දේශනාවකට සවන් දෙන ළමා පිරිසකගේ වීඩියෝවක් හෝ ඡායාරූප කිහිපයක් පෙන්වන්න.
- ඔවුන්ගේ සවන් දීමේ ගුණාගුණ සාකච්ඡා කරන්න.
- ආචාරශීලී ව සවන්දීමේ දී තිබිය යුතු ගුණාංග පැහැදිලි කරන්න.

**පාඩම සංවර්ධනය :**

- ආචාරශීලී බව යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
- ආචාරශීලී ව සවන් දීමේ දී සිටිය යුතු ආකාර විස්තර කරන්න.
- ආචාරශීලී ව සවන් දිය යුතු තැන් සහ අවස්ථා පැහැදිලි කරන්න.
- ආචාරශීලී ව සවන් දීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන්න.
    - ධර්මදේශනාවකට සවන් දීම
    - වැඩිහිටි භික්ෂූන් වහන්සේ නමකගේ අවවාදවලට සවන් දීම
    - විහාරගෙයක වැනි ගෞරවනීය ස්ථානයක සවන් දීමේ අවස්ථාවක්
    - වැඩිහිටි ගිහි මහතුන් සමග
    - සමිති සමාගම් වැනි සමාජීය අවස්ථාවල
- ක්‍රියාකාරකම්වලදි ශිෂ්‍යයන්ගේ ආචාරශීලී ව සවන් දෙන ආකාරය මැන අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- ආචාරශීලී බව හා සංයමය යන්න හඳුනා ගැනීම
- ආචාරශීලී විය යුතු ආකාරය පැහැදිලි කර ගැනීම
- ආචාරශීලී විය යුතු තැන් හා අවස්ථා හඳුනා ගැනීම
- උචිත අවස්ථාවල මැනවින් ආචාරශීලී ව හැසිරීම

**23**

# විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීම

**නිපුණතාව** : 10 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : 10.4 විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීමේ පුරුදු ප්‍රායෝගික භාෂා කාර්යයන් ඉටුකර ගැනීම සඳහා යොදා ගනියි.

**කාලච්ඡේද** : 06යි

**ඉගෙනුම් පල :**

- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දී රසමුසු තැන් ප්‍රකාශ කරයි.
- ගුවන් විදුලි ප්‍රවෘත්ති ප්‍රකාශනයකට සවන් දී ප්‍රධාන කරුණු ඉදිරිපත් කරයි.
- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලින් උකහා ගත් කරුණු අන් අය සමග බෙදා ගනියි.
- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දී එහි ඇතුළත් කරුණු පිළිබඳ සාකච්ඡා කරයි.
- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දී එහි ඇතුළත් කරුණු ඇසුරෙන් විවිධ භාෂා කාර්යයන් සිදු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- ශිෂ්‍යයන්ට පෙන්වීම සඳහා විද්‍යුත් මධ්‍ය වැඩසටහන් කිහිපයක් (නාට්‍ය, සංවාද,) සූදානම් කර ගන්න.
- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් ශිෂ්‍යයන්ට ශ්‍රවණය කිරීම සඳහා අවශ්‍ය උපකරණ සූදානම් කර ගන්න.

**ප්‍රවේශය :**

- ගුවන් විදුලි නාට්‍යයක් ශ්‍රවණය කිරීමට සලස්වන්න.
- ඒ ඇසුරෙන් එහි රසමුසු තැන් පිළිබඳ සාකච්ඡාවක නිරත වන්න.
- සවන් දුන් වෙනත් ගුවන් විදුලි වැඩසටහන් මොනවා දැ'යි සිසුන්ගෙන් විමසන්න.

**පාඩම සංවර්ධනය :**

- විවිධ ගුවන් විදුලි වැඩ සටහන් තේමා යටතේ පෙළ ගස්වන්න.
- සවන් දෙන ලද එක් එක් ගුවන් විදුලි වැඩසටහනෙන් උකහා ගත් කරණු පිළිබඳ සාකච්ඡා කරන්න.
- ඉගෙන ගත් කරුණු එකිනෙකා සමග බෙදා ගැනිමට සලස්වන්න.
- ඒ ඇසුරෙන් විවිධ නිර්මාණ සැකසීමට අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍යයන් විසින් කරන ලද නිර්මාණ බිත්ති පුවත් පතක හෝ නිර්මාණ සංග්‍රහයක ප්‍රදර්ශනය කරවන්න.
- ශිෂ්‍යය නිර්මාණ ඇගයීමට ලක් කරන්න.
- ගුවන් විදුලි වැඩසටහන් ශ්‍රවණය කිරීමට දක්වන උනන්දුව පිළිබඳ සැලකිලිමත් වන්න.
- ශිෂ්‍ය නිර්මාණ කරන ආකාරය අනුව ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- විවිධ තේමා යටතේ විකාශනය වන ගුවන් විදුලි වැඩසටහන්වලට සවන් දීම
- සවන් දෙන ලද වැඩසටහනවල ප්‍රධාන කරුණු ඉදිරිපත් කිරීම
- තමා දැනගත් හා රස විඳි කරුණු අන් අය සමග සාකච්ඡා කිරීම
- සවන් දෙන ලද වැඩසටහන් ඇසුරෙන් විවිධ නිර්මාණ කිරීම
- ශිෂ්‍යය නිර්මාණ ඉදිරිපත් කිරීම

## මාතෘකානුකූල කතා පැවැත් වීම

**නිපුණතාව** : 11 තම අදහස් අර්ථවත් ව හා තර්කානුකූල ව ඉදිරිපත් කිරිමට අවශ්‍ය ශක්‍යතාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** : 11.1 සබකෝලයෙන් තොර ව අදහස් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද** : 08යි

**ඉගෙනුම් පල :**

- තම අදහස් නිවැරදි උච්චාරණයෙන් හා සබකෝලයෙන් තොර ව ප්‍රකාශ කරයි.
- මාතෘකාවකට අනුව කතාවක් ඉදිරිපත් කරයි.
- විවිධ කථන අවස්ථා සඳහා ප්‍රායෝගික ව පුහුණුව ලබයි.
- කථන හැකියාව මගින් පෞරුෂත්ව ලක්ෂණ ප්‍රදර්ශනය කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- පන්තියට, ශිෂ්‍යයාට ගැළපෙන ලෙස කතා මාතෘකා කිහිපයක් තෝරා ගෙන ඊට අදාළ ව කරුණු රැස් කර ගන්න. (උදා: ඇමුණුම 1 බලන්න.)
- තෝරා ගත් මාතෘකාවට අනුව කතාවක් ඉදිරිපත් කිරීමේ දී කරුණු ගොනු කර ගන්න.
- මාතෘකාවකට අදාළ ප්‍රමාණවත් කරුණු රැස් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- කතාවක් සැලසුම් කර ගන්නා ආකාරය, කාලය කළමනාකරණය කිරිම, මාතෘකාවකට අදාළ ව අදහස් ගොනු කර ගැනීම පිළිබඳ ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

**ප්‍රවේශය :**

- විවාද තරගයක අවස්ථාවක් ප්‍රදර්ශනය වන පටිගත කළ දර්ශනයක් ශිෂ්‍යයන්ට පෙන්වමින් ප්‍රවේශය ගන්න.

**පාඩම සංවර්ධනය :**

- කලින් සකස් කර ගත් කථන මාතෘකා ශිෂ්‍යයනට ලබා දී ඒ අනුව කතා ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.
- ඒ ඒ මාතෘකාවට අදාළ ව සුවිශේෂ කරුණු ඇතුළත් පත්‍රිකා ශිෂ්‍යයන්ට බෙදා දෙන්න.
- තර්කානුකූල ව කරුණු ඉදිරිපත් කිරීමේ ශක්‍යතා වර්ධනය කරලීම සඳහා අභ්‍යාසවල නිරත කරවන්න.
- මාතෘකාවට අදාළ ව කරුණු ගොනු කිරීම, කාලය කළමනාකරණය කිරීම, වැනි ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- පිරිවෙනේ ආරම්භක රැස්වීමේ දී මාතෘකාවකට අදාළ ව කෙටි කතාවක් පැවැත්වීමට හුරු කරවන්න.
- භාෂා සාහිත්‍ය තරග සඳහා කථන කුසලතා වර්ධනය කරලීමට ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යොදවන්න.
- මාතෘකාවකට අදාළ ව සහ පොදු උපදෙස්වලට අනුකූල ව ශිෂ්‍යයන්ට ක්ෂණික කතාවක් සිදු කිරීමට අවස්ථාව ලබා දී ඔවුනගේ හැකියා තක්සේරු කර ප්‍රතිපෝෂණය ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- විවාද තරගයක් පැවැත්වෙන අවස්ථා පටිගත කළ වීඩියෝ දර්ශනයක්
- තැටි ධාවන යන්ත්‍රයක්

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- මාතෘකාවකට අනුව කතාවක් ඉදිරිපත් කිරිමට තොරතුරු රැස් කිරිම
- විවිධ කථන අවස්ථා සඳහා නොපැකිළව ඉදිරිපත් විම
- ප්‍රායෝගක ව පුහුණු වූ  කතාවක් සභාවක් ඉදිරියේ ඉදිරිපත් කිරීම
- සබකෝලයෙන් තොර ව කතා කිරීම මගින් පෞරුෂත්ව ලක්ෂණ ප්‍රදර්ශනය කිරීම

ඇමුණුම 1     කතා මාතෘකා

- අපේ පිරිවෙණ
- මා කැමති වීරවරයා
- පරිසරය සුරකිමු
- මාපිය උපස්ථානය
- වැඩිහිටියන්ට ගරු කරමු
- සිල්වත්විමේ ආනිසංස
- පොසොන් උත්සවය
- පස්පවින් වළකිමු
- පොදු දේපළ සුරකිමු
- පනින්න පෙර සිතා බලනු

**25**

# විවිධ කථන අවස්ථා

**නිපුණතාව** : 11 තම අදහස් අර්ථවත් ව හා තර්කානුකූල ව ඉදිරිපත් කිරිමට අවශ්‍ය ශක්‍යතාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** : 11.2 අවස්ථාවට උචිත ලෙස ශ්‍රාවකයා ආකර්ෂණය කර ගනිමින් කතා කරයි.

**කාලච්ඡේද** : 07යි

**ඉගෙනුම් පල :**

- නිවැරදි ශිල්පීය උපක්‍රම භාවිත කරමින් මාතෘකාවට අදාළව කතා කරයි.
- කතාවකදී ආංගික හා සාත්ත්වික අභිනය නිසි ලෙස භාවිත කරයි.
- මාතෘකාවකට අදාළ නොවන අදහස් දැක්වීමෙන් වැළකී සිටියි.
- කතාවට ප්‍රවේශ වීමේ දී, කතාව අතරතුර දී මෙන් ම කතාව අවසානය දක්වා ශ්‍රාවක අවධානය රඳවා ගැනීමේ උපක්‍රම භාවිත කරයි.
- නිසි ලෙස කාලය කළමනාකරණය කර ගනිමින් මාතෘකාවට අදාළ ව කතාව ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- විවිධ දේශකයන්ගේ උච්චාරණ ශෛලිවල වෙනස්කම් දැක්වීම සඳහා හඬපට සූදානම් කර ගන්න.
- කතා විලාසය, අංග චලනය, අදහස් දැක්වීම, කරුණුවලට අදාළ කතා අවස්ථා කිහිපයක් සූදානම් කර ගන්න.
- මාතෘකාවකට අදාළ ව කතාවක් පුහුණු වූ ඉහළ පන්තියේ ශිෂ්‍යයෙකු යොදා ගන්න.

**ප්‍රවේශය :**

- විවිධ ශෛලීවලට අදාළ කතා විලාසයන් දක්වන දේශකයන්ගේ හඬපට කිහිපයකට සවන් දීමට සලස්වන්න.

**පාඩම සංවර්ධනය :**

- ප්‍රවේශයේ දී යොදා ගත් හඬපට ඇසුරෙන් විවිධ උච්චාරණ ක්‍රමවේදය මගින් කථිකයන්ගේ කථන හැකියාව පිළිබඳ සාකච්ඡා කරන්න.
- ශ්‍රාවක ආකර්ෂණය දිනා ගත හැකි ශිල්පීය උපක්‍රම භාවිත කළ හැකි අවස්ථා පෙන්වා දෙන්න. (උදා: හඬ උස් පහත් කිරීම්, මුහුණේ ඉරියවු වෙනස් කිරීම්, ආංගික අභිනය දැක්වීම්, ඇතැම් සංකල්ප/සිද්ධි අවධාරණය කිරීම, ශ්‍රාවකයන් ආකර්ෂණයට පත් කරන ප්‍රකාශ දැක්වීම)
- සූදානමින් පැමිණි ශිෂ්‍යයාගේ කතාවට සවන් දීමට අවස්ථාව ලබා දී එහි හිතකර අහිතකර ලක්ෂණ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- කතාවක මුල මැද අග සියල්ල මනාව බැඳ තබා ගැනීමෙන් ශ්‍රාවක ප්‍රතිචාර හොඳින් ලබා ගත හැකි බව සාකච්ඡා කරන්න.
- කතාවක දී කාලය කළමනාකරණය කර ගැනීම වැදගත් බව පහදන්න.
- ශිෂ්‍යයන්ගේ ඉදිරිපත් වීම හා හැකියා ප්‍රදර්ශනය කිරීම මගින් ඔවුන් ඇගයීමට ලක් කර ප්‍රතිපෝෂණය ලබා දෙන්න.

**මූලික වදන් සංකල්ප :**

- ශ්‍රාවකයා - අසන්නා
- උච්චාරණය - කතා කරන විලාසය
- ආංගික අභිනය - අඟ පසඟවලින් අදහස් ප්‍රකාශ කිරීම
- සාත්වික අභිනය - මුහුණින් හැඟීම් ප්‍රකාශ කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- දේශකයන් කිහිප දෙනෙකුගේ හඬපට
- පිරිවෙනේ කථිකත්වයෙන් දක්ෂ ශිෂ්‍යයෙක්
- පටි ධාවන යන්ත්‍රයක්
- බහු ප්‍රක්ෂේපණ යන්ත්‍රයක්

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- මාතෘකාවකට අදාළව උචිත අභිනය දක්වමින් කතාවක් කිරීම
- නියමිත අංගහාර දක්වමින් ශ්‍රාවක ප්‍රසාදය ජනනය වන ලෙස කතාවක් කිරීම
- කතාව ආරම්භයේ සිට අවසන් වන තෙක් ශ්‍රාවක අවධානය රඳවා ගැනීම
- නිසි කාල කළමනාකරණයකින් හා මාතෘකාවට අදාළ කරුණු අන්තර්ගත කරමින් කතාව ඉදිරිපත් කිරීම
- අවස්ථෝචිත පරිදි හඬ පාලනයෙන් යුතු ව කතාව ඉදිරිපත් කිරීම

(26)

## කියවීම හා සංස්කෘතිය හඳුනා ගැනීම

**නිපුණතාව** : 12 භාෂා සාහිත්‍ය පරිශීලනයෙන් සංස්කෘතිය, සාරධර්ම හඳුනා ගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය ගොඩනඟා ගැනීම සඳහා ක්‍රියාකරයි.

**නිපුණතා මට්ටම** : 12.1 සංස්කෘතික උරුමය හා හරපද්ධතීන් පිළිබඳව අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.

**කාලච්ඡේද** : 05යි

**ඉගෙනුම් පල :**

- උපන් දේශයට මෙහෙවරක් කළ අභිමානවත් චරිත කථා කියවයි.
- දේශාභිමානි කවි, ගී ශ්‍රවණය කිරීමට කැමැත්ත පළ කරයි.
- අපේ ජාතික උරුමයන් අගය කරමින් කතාකරයි.
- විරෝදාර චරිතවල අන්තර්ගත ගති ලක්ෂණ චරිතායනය කරයි.
- අන්‍ය ජාතික සංස්කෘතීන් ඇගයීමට ලක් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- අතීත ශ්‍රී ලංකාවේ අභිමානවත් චරිත කිහිපයක ඡායාරූප /පින්තූර /
- ජාතිකාභිමානය දනවන ගීත ඇතුළත් තැටියක්, තැටිධාවන යන්ත්‍රයක්, දේශාභිමානය දනවන කාව්‍ය රචනා කිහිපයක් සූදානම් කර ගන්න.

**ප්‍රවේශය :**

- සී.ටී. ප්‍රනාන්දු විසින් ගායනා කළ "හෙළජාතික අභිමානේ....." ගීතය වාදනය කර සිසුනට ඇසීමට සලස්වා ඒ පිළිබඳ සිසුන්ගෙන් කරුණු විමසීම.
- අමරදේවයන්ගේ ''රත්නදීප ජන්මභූමි'' ගීතය
- අතීත උරුමය තුළින් සාරධර්ම මතුකර ගැනීමට සුදුසු උදාහරණ ගන්න.

**පාඩම සංවර්ධනය :**

- රට ජාතියට සේවයක් කළ අභිමානවත් චරිත පිළිබඳ සාකච්ඡා කර ඔවුන්ගෙන් ජාතියට සිදු වූ සේවාව ඇගයීමට ලක් කරන්න.
- එවැනි සේවයක් කළ විරුවන්ගේ ශ්‍රේෂ්ඨ නාමයන් ඉතිහාසය තුළ රන් අකුරින් ලියවී ඇති බව දක්වන්න.
- විරෝදාර චරිත අගය කිරීමටත් එහි අන්තර්ගත ගතිගුණ චරිතායනය කරගැනීමෙන් රටට වැඩදායි පුරවැසියෙකු නිර්මාණය වන බව පවසන්න.
- අපට අනන්‍ය වූ ජාතික උරුමය උකහා ගැනීමට උපදෙස් දෙන්න.
- වීරෝදාර චරිත කථා කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- අපට ආවේණික සංස්කෘතික උරුම තුළ සාරධර්ම රාශියක් ගැබ් වී ඇති බව අවධාරණය කරන්න.
- නිර්ණායකවලට අදාළ ක්‍රියාකාරකම් සිදුකර තක්සේරු කිරීම හා ප්‍රතිපෝෂණ සැලසීම.

**මූලික වදන් සංකල්ප :**

- දේශාභිමානය - ජන්ම භූමිය පිළිබඳ ඇති ආඩම්බරය
- ජාතික උරුමය - රටක ස්වදේශිකයන් විසින් අනාදිමත් කාලයක සිට එක්රැස් කරගත් වටිනා දෑ
- චරිතායනය - තම ජීවන දැක්ම සකස් කර ගැනීම සඳහා චරිතයට එකතු කර ගැනීම.
- ජාතිකාභිමානය - සිය ජාතිය පිළිබඳ ඇති ආඩම්බරය.

**ගුණාත්මක යෙදවුම් :**

- ජාතිකාභිමානය දනවන ගීත
- විරෝදාර චරිතාපදානයන් (උදා - අනගාරික ධර්මපාලතුමා, වාරියපොළ සුමංගල හිමි, වීර කැප්පෙටිපොළ, පින්තූර. දේශාභිමානය දනවන පද්‍ය පන්තියක්, ඇස් මහින්ද හිමි)

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- දේශාභිමානය දනවන ගීතවලට සවන් දීම
- රට ජාතිය වෙනුවෙන් කැප වූ අභිමානවත් චරිතාපදාන කැමැත්තෙන් කියවීම
- අපට ආවේණික ජාතික උරුම පිළිබඳ පොතපත කියවීම
- ජාතික අභිමානය දනවන කාව්‍ය නිර්මාණ කිරීමට කැමැත්ත දැක්වීම
- විරෝදාර චරිතවලට අදාළ පින්තූර/ඡායාරූප එකතුවක් කිරීම

27

## කියවීම හා සමාජ සාරධර්ම

**නිපුණතාව** : 12 භාෂා සාහිත්‍ය පරිශීලනයෙන් සංස්කෘතිය, සාරධර්ම හඳුනා ගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය ගොඩනඟා ගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම** : 12.2 කියවීම මඟින් සමාජ සාරධර්ම චරිතායනය කර ගනියි.

**කාලච්ඡේද** : 05යි

**ඉගෙනුම් පල :**

- කිසියම් සංස්කෘතියකට අදාළ සාරධර්ම මොනවාදැ'යි විස්තර කරයි.
- ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ උදාර ගති ලක්ෂණ හඳුනා ගෙන ලියා දක්වයි.
- සාරධර්ම චරිතායනය කර ගැනීම සඳහා ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ චරිත කථා කියවයි.
- ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ උදාර ගති ලක්ෂණ ඔවුන්ගේ නාම අමරණීය වීමට හේතු වූ බව කියයි.
- තම ජීවිත හැඩගස්වා ගැනීමට උදාර ගතිගුණ පිටිවහල් කර ගැනීමට ඉගෙන ගනියි.
- ඉතිහාසයේ සුවිශේෂී චරිතවලට අදාළ පින්තූර/ඡායාරූප එකතුවක් පිළියෙල කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- ශ්‍රේෂ්ඨ පුද්ගල චරිතයක්; එබඳු පුද්ගලයන්ගේ ඡායාරූප/පින්තූර සූදානම් කර ගන්න.

**ප්‍රවේශය :**

- ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ ඡායාරූප/පින්තූර එකතුව ප්‍රදර්ශනය කරමින් බුද්ධි කලම්භනය මඟින් සාකච්ඡාවක් ගොඩනඟා ගනිමින් ප්‍රවේශ වන්න.
- තවත් කාලච්ඡේදයක දී අපගේ ජාතික ගීය වාදනය කර ඒ ගැන සාකච්ඡා කරමින් ප්‍රවේශය ගන්න.
- තවත් කාලච්ඡේදයක දී ජාතික ධජය ප්‍රදර්ශනය කර, ඒ ගැන සාකච්ඡා කරමින් පාඩමට ප්‍රවේශ වෙන්න.

**පාඩම සංවර්ධනය :**

- ශ්‍රේෂ්ඨ පුද්ගල චරිතකතා හඬනගා කියවීමට සලස්වන්න.
- චරිතකතා ඇසුරින් "සාරධර්ම" සංකල්පය පැහැදිලි කරන්න.
- සමාජයක සම්මත සාරධර්ම හඳුන්වා දෙන්න.
  (උදා:- වැඩිහිටියන්ට සැලකීම, දෙමාපියන්ට කීකරු වීම, පොදු දේපළ සුරැකීම, අසරණ අයට පිහිට වීම, පස් පවින් වැළකීම.)
- ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ චරිත කතා කියවීමට සලස්වන්න.
- ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ ඡායාරූප/පින්තූර ඇතුළත් පොත් පිංචක් සකස් කිරීමට උපදෙස් දෙන්න.
- සම්මත සාරධර්ම අනුගමනය කිරීමටත්, ඒවා චරිතායනය කර ගැනීමටත් පොළඹවන්න.
- තෝරාගත් චරිත කතාවක් බිත්ති පුවත්පතක ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව දෙන්න.
- පියවරින් පියවර පාඩම සංවර්ධනය කරන අවස්ථාවේ දී ඇගයුම් නිර්ණායක ඇසුරින් තක්සේරුකරණය හා ඇගයුම් ක්‍රියාවලිය සකස් කරගන්න.

**මූලික වදන් සංකල්ප :**

- සහජීවනය - අන්‍ය පුද්ගල අනන්‍යතාව ගරු කරමින් සහයෝගයෙන් ජීවත් වීම.
- දේශමාමකත්වය - ස්වකීය දේශය ස්වීකරණය
- දේශවාත්සල්‍යය - තම උපන්බිමට ඇති ඇල්ම, ආදරය, කැමැත්ත

**ගුණාත්මක යෙදවුම් :**

- ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ චරිත කථා ඇතුළත් පොත් කිහිපයක්
- රට, ජාතිය, ආගම වෙනුවෙන් උදාර සේවාවන් සිදු කළ පුද්ගලයන්ගේ පින්තූර/ඡායාරූප
- අපගේ ජාතික ගීය හා අපගේ ජාතික කොඩිය

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- චරිත කථාවක් කියවීම තුළින් හඳුනාගත් සාරධර්ම වෙන් වශයෙන් ලියා දැක්වීම
- ශබ්ද නගා චරිත කථාවක් කියවීම
- ශිෂ්‍ය සමිතිය ඉදිරියේ උදාර චරිත කතා කියවීමට පුහුණුව ලැබීම
- ශ්‍රී ලංකාවේ අතීත ශ්‍රේෂ්ඨ චරිත කතා එකතු කර පොත් පිංචක් සකස් කිරීම
- එදිනෙදා ජීවන කටයුතුවල දී උගත් සාරධර්ම භාවිත කිරීමට පෙළඹීම
- සාරධර්ම ආරක්ෂා කිරීම සමාජ බුහුමනට ලක්වීමට හේතුවක් බව පිළිගැනීම

## 28

# ගද්‍ය පද්‍ය නිර්මාණ පරිශීලනය

**නිපුණතාව** : 12 භාෂා සාහිත්‍ය පරිශීලනයෙන් සංස්කෘතිය, සාරධර්ම හඳුනා ගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය ගොඩ නගා ගැනීම සඳහා ක්‍රියාකරයි.

**නිපුණතා මට්ටම** : 12.3 දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ පරිශීලනය කරයි.

**කාලච්ඡේද** : 05යි

**ඉගෙනුම් පල :**

- දේශාභිමානී හැඟීම් දනවන පද්‍ය නිර්මාණ සහ ගීත ගායනා කරයි.
- තම දේශය පිළිබඳව අභිමානයෙන් කතා කරයි.
- ජාතිය, ආගම, භාෂාව ආරක්ෂා වන්නේ මව්බිම ආරක්ෂා වීම මත බව පිළිගනිමින් කතා කරයි.
- බිත්ති පුවත්පතකට දේශාභිමානී හැඟීම් දනවන පද්‍ය පන්තියක් නිර්මාණය කරයි.
- තම දේශය පිළිබඳ අභිමානයක් ඇති වන අදහස්, ගී සංකල්පනා පිළිබඳ අන් අය සමග සාකච්ඡා කරයි.
- දේශාභිමානී හැඟීම් දනවන තීරු ලිපියක් සකස් කර ශිෂ්‍ය සමිතියේ දී කියවයි.
- තම දේශයේ ස්වාභාවික සුන්දරත්වය, ස්වාභාවික සම්පත් පිළිබඳ අභිමානයෙන් කතා කරයි.
- දේශාභිමානී හැඟීම් ඇති කරවන ගීත ඇල්බමයක් සකස් කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පෙර සූදානම :**

- දේශාභිමානී හැඟීම් දනවන ගීත කිහිපයක්, තැටි ධාවන යන්ත්‍රයක්, රටේ සුන්දර ස්ථාන ඇතුළත් ඡායාරූප කිහිපයක් පිළියෙල කරගන්න.

**ප්‍රවේශය :**

- ආචාර්ය ඩබ්.ඩී.අමරදේවයන් විසින් ගායනා කරන ''රත්නදීප ජන්ම භූමි ලංකාදීප විජය භූමි'' ගීතය ශිෂ්‍යයනට ශ්‍රවණය කිරිමට සලස්වා එහි ඇතුළත් යෙදුම් සාකච්ඡාවට බඳුන් කරමින් ප්‍රවේශය ලබා ගන්න.

**පාඩම සංවර්ධනය :**

- දෙස, බස, රැස පිළිබඳ කතා කරන සෑම අවස්ථාවක දී ම උපන් බිම මුල්තැන ගන්නා බවත් එය රැක ගැනීම වැදගත් බවත් පැහැදිලි කරන්න.
- තම ජන්ම භූමිය පිළිබඳ ආදරයක්, ගෞරවයක් ඇති වන ලෙස ගීතවලින් අර්ථවත් වන දේ ඉස්මතු කර දක්වන්න.
- ස්වාභාවික සුන්දරත්වය මතු වන පින්තූර/චිත්‍ර ප්‍රදර්ශනය කරමින් ස්වාභාවික සම්පත්වල වටිනාකම අගය කිරීම හා ඒ පිළිබඳ ගෞරවයක් ඇති වන ලෙස විස්තර කරන්න.
- අතීත ශ්‍රී ලංකාවේ ශ්‍රී විභූතිය හා ප්‍රෞඪත්වය පිළිබඳ අභිමානයක් ඇති කරවන්න.
- දේශාභිමානී නිර්මාණ අගය කිරීම සඳහා රසඥතාව වර්ධනය කරන්න.
- ඇගයුම් නිර්ණායක භාවිත කර පාඩම සංවර්ධනය වන පියවරවල දී තක්සේරුකරණය හා ඇගයීම සිදු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- දේශාභිමානී හැඟීම් දනවන ගීත කිහිපයක්, තැටි ධාවන යන්ත්‍රයක්, පද්‍ය පන්ති කිහිපයක් (උදා: ඇස්. මහින්ද හිමිගේ ලංකා මාතා, නිදහසේ දැහැන)
- ශ්‍රී ලංකාවේ සුන්දර ස්ථාන ඇතුළත් චිත්‍ර/ඡායාරූප කිහිපයක්

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක :**

- තමා උපන් දේශය පිළිබඳ අභිමානයෙන් කතා කිරීම
- දේශාභිමානී හැඟීම් ඇති කරවන ගීත සහ පද්‍ය නිර්මාණවලට කැමැත්තෙන් සවන් දීම
- බිත්ති පුවත් පතකට තම දේශය පිළිබඳ අභිමානයක් ඇති වන පද්‍ය පන්තියක් නිර්මාණය කිරීම
- ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකමකින් යුක්ත මෙන් ම සෞන්දර්යාත්මක අගයකින් හෙබි ස්ථාන නාම ලැයිස්තුවක් පිළියෙල කිරීම
- දේශාභිමානී ගීත ඇල්බමයක් සකස් කිරීම
- සාහිත්‍ය සමිතියේ දී තම රටට අසීමිත මෙහෙයක් සිදු කළ ශ්‍රේෂ්ඨ චරිත කතාවක් කියවීම